# සංක්ෂිප්ත එකතුව

# 2022/23

(තෙවන කාර්යක්ෂමතා කඩඉම සඳහා සමුපකාර සංවර්ධන නිළධාරීන් විසින් සිදුකරනු ලැබූ පර්යේෂණ නිබන්ධන වල සාරාංශ එකතුව)

NICD SRI LANKA

ජාතික සමුපකාර සංවර්ධන ආයතනය

**National Institute of Co-operative Development**

A member of the international Co-operative Alliance

# සංක්ෂිප්ත එකතුව -2022/23

**© සියළුම හිමිකම් ඇවිරිණි.**

පූර්ව අවසරයකින් තොරව මෙම ග්‍රන්ථය මුද්‍රණය කිරීම, එසේ අවසරයකින් තොරව මුද්‍රණය කරන ලද පිටපත් අලෙවි කිරීම, හුවමාරු කිරීම හෝ එවැනි කිසිම ආකාරයකින් අවභාවිතයේ යෙදවීම සපුරා තහනම් වෙයි.

**සංස්කරණය**
දිනුෂ දිසානායක

**පරිගණක වදන් සැකසීම හා පිටු සැලසුම**

දිනුෂ දිසානායක

**පිටකවරය නිර්මාණය**
ප්‍රියන්ත නාරම්පනාව

**මුද්‍රණය හා ප්‍රකාශනය**
ජාතික සමුපකාර සංවර්ධන ආයතනය
පොල්ගොල්ල.

# පටුන


සංස්කාරකගේ වදන ........................................................................................ vi

1. Covid-19 කාලච්ඡේදය තුළ මත්ස්‍ය අලෙවිකරුවන්ගේ ඵලදායීතාවයට බලපාන සාධක හඳුනාගැනීම.................................................................................................1

2. Covid-19 වසංගතය හමුවේ තම ප්‍රජාවට සමුපකාර සමිතිවලින් හිමි වූ දායකත්වය අධ්‍යනය කිරිම. ...................................................................................................3

3. දේශීය කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය සඳහා සී/ස දිවුලපැලැස්ස දේදූණු කෘෂිකාර්මික සමුපකාර සමිතිය දක්වා ඇති දායකත්වය.............................................................4

4. පේෂකර්ම නිෂ්පාදන සමුපකාර සමිති ග්‍රාමීය ආර්ථිකයට හා සංවර්ධනයට දක්වන දායකත්වය පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යනය.......................................................5

5. ග්‍රාමීය බැංකු මූල්‍ය තිරසාරත්වය උදෙසා ඵලදායී ණය කළමනාකරණයේ බලපෑම පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යනය .........................................................................6

6. සමුපකාර ග්‍රාමීය බැංකුවල අවදානම් කළමනාකරණය සඳහා බැංකු නියාමන මාර්ගෝපදේශයන්හි බලපෑම පිළිබඳ අධ්‍යනය.......................................................7

7. ග්‍රාමීය සුළු පරිමාණ සමුපකාර සමිති බිඳවැටීමට බලපාන හේතු පිළිබඳ අධ්‍යනයක්. 8

8. සංවිධානවල පාරිභෝගික තෘප්තිය සඳහා බලපානු ලබන හේතු හඳුනාගැනීම.........9

9. සාමාජික ව්‍යවසායකයින් දිරිගැන්වීම සඳහා විවිධ සේවා සමුපකාර සමිතිවල දායකත්වය විශ්ලේෂණය.........................................................................................10

10. සමුපකාර ක්ෂේත්‍රය තුළ කාන්තා සවිබලකරණයේ ශක්‍යතාවය පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යනය. ......................................................................................11

11. තිරසාර මූල්‍යායතනයක් සඳහා ග්‍රාමීය බැංකු ප්‍රවේශය කෙසේද? යන්න හඳුනා ගැනීම.........................................................................................................................12

12. විවිධ සේවා සමුපකාර සමිතිවල සාමාජිකයින් සක්‍රීයව සමිතිය තුළ ආර්ථික කටයුතු වලට දායකකර ගැනීම පිළිබඳ අධ්‍යනය.............................................................13

13. සමුපකාර සමිතිවල ව්‍යාපාර සංවර්ධනය උදෙසා සමුපකාර නීතියේ ඇති බලපෑම පිළිබඳ ගුණාත්මක විග්‍රහය...........................................................................................14

14. ස්වශක්ති සමුපකාර සමිති අක්‍රීය වීමට බලපාන හේතු හඳුනාගැනීම පිළිබඳ සිද්ධි අධ්‍යනය......................................................................................................................15

15. පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති වර්තමානය වන විට පසුබෑමට ලක්වීමට හේතු විශ්ලේෂණය. .................................................................................................16

16. සාමාජිකයින්ගේ ආර්ථිකය නඟාසිටුවීම සඳහා ධීවර සමුපකාර සමිතිවලින් ලබාදෙන දායකත්වය පිළිබඳ ගවේෂණාත්මක විශ්ලේෂණය. ...............................................17

17. Impact of factors effecting non-performing loans in Covid Pandemic Situation. .......... 18

18. සමුපකාර ග්‍රාමීය බැංකු ව්‍යාපාරයේ තිරසාර පැවැත්මට විවිධ සේවා සමුපකාර සමිතියෙන් ග්‍රාමීය බැංකු වෙන්කර පවත්වාගෙන යාමේ වැදගත්කම පිළිබඳ කෙරෙන විශ්ලේෂණාත්මක අධ්‍යනය. .......... 19

19. ලියාපදිංචිය අවලංගු කළ සමුපකාර සමිතිවල ඇවර කටයුතු ප්‍රමාද වීම පිළිබඳ ගවේෂණාත්මක අධ්‍යනය .......... 20

20. සමුපකාර සමිතියක දුර්වල ණය කළමනාකරණය ආයතන යහපාලනයට කරනු ලබන බලපෑම. .......... 21

21. සංවිධානයක සේවක රැකියා තෘප්තිය සඳහා බලපාන සාධක හඳුනාගැනීම .......... 22

22. විවිධ සේවා සමුපකාර සමිතිවල අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරිමට එහි පාලන ක්‍රමයන් තුළින් ඇතිවන බලපෑම. .......... 24

23. ග්‍රාමීය ජනතාව විසින් උකසට තබන ලද වත්කම් බේරා නොගැනීමට හේතු. .......... 25

24. සමුපකාර ව්‍යවසායකයින් ගොඩනැංවීමට ග්‍රාමීය බැංකු ණය උපයෝජනය .......... 26

25. සමුපකාර සමිතිවල ගිණුම් හා මෙහෙයුම් කළමනාකරණය සඳහා පරිගණක මෘදුකාංග යොදාගැනීමට පවතින බාධා හඳුනාගැනීම. .......... 28

26. විවිධ සේවා සමුපකාර සමිති අකාර්යක්ෂමතාවයට තීරණ ගැනීමේ ක්‍රියාවලියේ බලපෑම. .......... 30

27. ග්‍රාමීය බැංකු මූල්‍ය ක්‍රියාකාරකම් එහි ඵලදායීතාවයට බලපාන ආකාරය .......... 32

28. සාමාජිකයින්ගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා ස.ණ.ස ව්‍යාපාරයේ දායකත්වය දෙනු ලබන ආකාරය .......... 33

29. සමාජ ව්‍යවසාය ප්‍රවර්ධනයෙහි ලා සමුපකාර ග්‍රාමීය බැංකුවල දායකත්වය .......... 34

30. සීමා සහිත ගාලුගඟබඩ පත්තුව දකුණ කුඩා තේවතු හිමියන්ගේ සමුපකාර සමිතියේ කාර්යසාධනය අඩුවීමට හේතු විශ්ලේෂණය කිරීම පිළිබඳ අධ්‍යනය. .......... 35

31. නිෂ්පාදන විවිධාංගීකරණය සංවිධානයක ඵලදායීතාවය සඳහා වන බලපෑම හඳුනාගැනීම .......... 37

32. සේවක ඵලදායීතාවය කෙරෙහි දිරිදීමනා ක්‍රමවල ඇති බලපෑම පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යනය. .......... 38

33. සමුපකාර සාමාජික ප්‍රජාවගේ සංවර්ධනය සඳහා සමුපකාර ග්‍රාමීය බැංකු අංශයෙන් ලැබෙන දායකත්වය පිළිබඳ විශ්ලේෂණය. .......... 39

34. සමුපකාර සමිතිවල ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම පිළිබඳ ගවේෂණාත්මක අධ්‍යනය .......... 40

35. බදුල්ල දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිති මඟින් සාමාජිකත්වය ප්‍රවර්ධනය කිරීමට දැක්වූ දායකත්වය හඳුනාගැනීම..................................................................41

36. කාර්යමණ්ඩල රැකියා තෘප්තිය විවිධ සේවා සමුපකාර සමිතිවල සංවර්ධනය කෙරෙහි දක්වන බලපෑම. ....................................................................................42

37. සංවිධානවල සේවක අභිප්‍රේරණ ක්‍රමවේදය සේවක රැකියා කැපවීම කෙරෙහි බලපානු ලබන ආකාරය............................................................................43

38. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රජාවගේ ආර්ථික සංවර්ධනය සඳහා ස.ණ.ස සමිති තුළින් ලබාදී ඇති දායකත්වය පිළිබඳව අධ්‍යනය ..........................................................44

39. සමුපකාර සමිති ප්‍රඥප්තිය සකසුරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිති වල දියුණුවට සිදුකරනු ලබන බලපෑම. ...................................................45

40. සමුපකාර සමිතිවල කාර්යමණ්ඩල ඌණ උපයෝජනය වීම පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යනය. ..............................................................................46

41. ණය ප්‍රදානය කිරීමේ ක්‍රියාවලිය කල්පසු වූ ණය අයකර ගැනිමට සම්බන්ධ වන ආකාරය.........................................................................................47

42. කිරි නිෂ්පාදන සමුපකාර සමිති හරහා දියර කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන වැඩිකිරීම පිළිබඳ සිද්ධි අධ්‍යනය. .........................................................................48

43. කෝප්සිටි වෙළඳසැල්හී සේවා ගුණාත්මකභාවය පාරිභෝගික ලබැදියාව ගොඩනගා ගැනීමට බලපාන ආකාරය. ...........................................................................49

44. වියපත් සමුපකාර සාමාජිකත්වය හා නායකත්වය සමුපකාර ව්‍යාපාරයේ අනාගත පැවැත්මට සිදුකරනු ලබන බලපෑම පිළිබඳ අධ්‍යනය...........................................50

45. ශ්‍රී ලංකාවේ සමුපකාර භාවිතය හා එහි යහපාලනය පිළිබඳ විශ්ලේෂණාත්මක විග්‍රහයක්.....................................................................................51

46. කාර්යක්ෂම ග්‍රාමීය ණය අවශ්‍යතා සපුරාලීමට ස.ණ.ස සමිති ව්‍යාපාරය සංවිධානය වියයුතු ආකාරය හඳුනාගැනීම. ...........................................................52

47. කොවිඩ් 19 අභියෝගය හමුවේ කිරි නිෂ්පාදන සමුපකාර සමිති මුහුණ දෙන ගැටළු පිළිබඳ අධ්‍යනයක්. .......................................................................53

48. කෝප්සිටි වෙළඳසැල් තුළ ක්‍රියාත්මක අලෙවිකරණ උපායමාර්ග පාරිභෝගික තෘප්තියට කර ඇති බලපෑම හඳුනාගැනීම...............................................54

49. සමුපකාර ව්‍යාපාරය තුළ අනාගත නායකයින් බිහිවීම සඳහා පාසල් සමුපකාර සමිතිවල දායකත්වය. ....................................................................55

50. පොල් ත්‍රිකෝණය තුළ දේශීය කිරි කර්මාන්තයේ සංවර්ධනයට සමුපකාරයේ දායකත්වය....................................................................................56

51. සේවක අභිප්‍රේරණ ක්‍රියාවලිය විවිධ සේවා සමුපකාර සමිතිවල සේවක කාර්යඵලය කෙරෙහි බලපානු ලබන ආකාරය........................................................................57

52. සේවක පුහුණුව හා සංවර්ධනය විවිධ සේවා සමුපකාර සමිතිවල කාර්යසාධන අභිවෘද්ධිය කෙරෙහි ඇති බලපෑම........................................................................58

53. සමුපකාර සේවකයින් සිය සේවාවන්ගෙන් ඉවත්වීම කෙරෙහි සේවක අභිප්‍රේරණ ක්‍රියාවලිය බලපාන ආකාරය........................................................................59

54. සමුපකාර ව්‍යාපාරය තුළ අනාවරණය වන මූල්‍ය වංචා හා දූෂණ වලට අදාළ මුදල් අයකරගැනීමේ නෛතික ක්‍රමවේදයේ ඇති ගැටළු අධ්‍යනය. ..................................60

55. සමුපකාර ග්‍රාමීය බැංකුවල ගණුදෙනුකරුවන්ගේ පාරිභෝගික තෘප්තියට බලපාන හේතු පිළිබඳ විශ්ලේෂණයක් සිදුකිරීම. ..................................................................61

56. විවිධ සේවා සමුපකාර සමිතිවල සාමාජිකයින් පාරිභෝගික වෙළඳසැල් සමඟ කරන ගණුදෙනු අවම මට්ටමක පැවතීමට බලපාන හේතු විශ්ලේෂණය. ............................62

57. තරඟකාරී ව්‍යාපාර පරිසරය තුළ විවිධ සේවා සමුපකාර සමිති මුහුණ දෙන තත්කාලීන අභියෝග. ..........................................................................................................63

# සංස්කාරකගේ වදන

සියවසකට එහාගිය පෞඪ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලාංකීය සමුපකාර ව්‍යාපාරය මෙරට ජනයාගේ මනසට කා වැදී ඇති ජනහිතකාමී ව්‍යාපාර ආකෘතියකි. තම සාමාජිකයින්ගේ අභිවෘද්ධිය උදෙසා කටයුතු කිරිමට ලොව බිහි වූ විශිෂ්ඨතම ව්‍යවසායක ආකෘතිය ලෙසද සමුපකාර ව්‍යාපාරය හඳුන්වාදීමට බොහෝ පර්යේෂකයින් උත්සහ දරා ඇත. එවන් වටිනාකමකින් යුත් සමුපකාර ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධනය හා පැවැත්ම උදෙසා පර්යේෂණ සැලකිය යුතු කාර්යභාරයක් ඉටුකරනු ලබයි. පර්යේෂණ තුළින් විශේෂිත විද්‍යාත්මක ක්‍රමවේද භාවිතා කරමින් පරිචයන් තුළ ගැටළු විසඳීම, නව්‍යතා බිහිකිරීම සහ පුද්ගලයන්ගේ දැනුම දියුණු කරමින් තිරසාරත්වයට මඟපාදයි. සමුපකාර ව්‍යාපාරය තුළ නවමානයන් සොයා යැම සඳහා මෙන්ම ශ්‍රී ලාංකීය සමුපකාර ව්‍යාපාරයේ ඉදිරි උන්නතිය උදෙසා කාර්යක්ෂමතා කඩඉම සපුරාලීමට එහා යමින් සමුපකාර ක්ෂේත්‍රයට ගුණාත්මක බවින් යුතු පර්යේෂණ දායාද කිරිම පිළිබඳව සමුපකාර දෙපාර්තමේන්තු නිළධාරීන් හට මාගේ ගෞරවය හා ස්තූතිය පුද කරමි. 2022/23 කාලය තුළ සමුපකාර සංවර්ධන නිළධාරීන් විසින් ජාතික සමුපකාර සංවර්ධන ආයතනය සමඟ එක්ව සිදුකරනු ලැබූ පර්යේෂණ නිබන්ධන වල සාරාංශයන් මෙසේ එකතුවක් ලෙස පිළිගැන්වීමට හැකි වීම පිළිබඳව අප ආයතනයක් ලෙස සතුටු වෙමු. එලෙසම, සමුපකාර ව්‍යාපාරය තුළ ගුණාත්මක පර්යේෂණ සිදුකිරීමෙන් මෙම ව්‍යාපාරය කාලීන වශයෙන් නිවැරදිව මඟක ගමන් කරනු ඇත. දේශීය සමුපකාර ව්‍යාපාරය තවදුරටත් ශක්තිමත් කිරීම උදෙසා දැනුම වර්ධනයේ මෙවලමක් ලෙස මෙම සංක්ෂිප්ත එකතුව පරිශීලකයින් වන ඔබ හට ඉතා සතුටින් දායාද කරන්නෙමු.

දිනුෂ දිසානායක,
සංස්කාරක,
සංක්ෂිප්ත එකතුව - 2022/23

# Covid-19 කාලඡේදය තුළ මත්ස්‍ය අලෙවිකරුවන්ගේ ඵලදායීතාවයට බලපාන සාධක හඳුනාගැනීම.

(මීගමුව ධීවර සමුපකාර සමිති සාමාජිකයන් ඇසුරින්)


එම්.ඒ.ඒ.එල් ගුණවර්ධන[1]
ශානිකා මුදන්නායක[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. (බස්නාහිර)*
*2. කථිකාචාර්ය, උසස් තාක්ෂණික ආයතනය, මහනුවර.*



Covid-19 වසංගතය පැවැති අභියෝගාත්මක කාලඡේදය තුළ මත්ස්‍ය අලෙවිකරුවන්ගේ ඵලදායීතාවයට බලපාන සාධක හඳුනාගැනීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය. ධීවර සමුපකාර සමිති අතුරු ව්‍යවස්ථාවන්ට අනුව ධීවර ප්‍රජාව සවිබල ගැන්වීම, ණය දීම, උකස් දීම වැනි මූල්‍ය කාරණා මෙන්ම තම සාමාජිකයින්ගේ ආර්ථිකය නගාසිටුවීම සඳහා ධීවර සමුපකාර සමිති කටයුතු කරමින් සිටී. කොවිඩ්-19 වසංගත කාලපරිඡේදය තුළ මත්ස්‍ය අලෙවිකරුවන්ගේ ඵලදායිතාවයට කුමන සාධක බලපානු ලබයිද? යන්න මෙම පර්යේෂණයේ ගැටළුව ලෙස හඳුනාගෙන ඇත. අධ්‍යනයේ ද්විතීයික අරමුණු ලෙස කොවිඩ්-19 කාලපරිඡේදය තුළ සීමාකාරී ප්‍රවේශතාවය මත්ස්‍ය අලෙවිකරුවන්ගේ ඵලදායීතාවයට බලපාන ආකාරය සොයා බැලීම, කොවිඩ්-19 කාලපරිඡේදය තුළ සීමා වූ සම්පත් මත්ස්‍ය අලෙවිකරුවන්ගේ ඵලදායිතාවයට බලපාන ආකාරය සොයා බැලීම, කොවිඩ්-19 කාලපරිඡේදය තුළ පාරිභෝගික අවශ්‍යතාවයේ විචල්‍යතාවයන් මත්ස්‍ය අලෙවිකරුවන්ගේ ඵලදායීතාවයට බලපාන ආකාරය සොයා බැලීම හඳුනාගන්නා ලදි. පර්යේෂක විසින් ප්‍රමාණාත්මක ක්‍රමවේදයට පර්යේෂණය දියත්කරනු ලැබූ අතර මීගමුව ධීවර සමුපකාර සමිති සාමාජිකයන් අධ්‍යනයේ සංගහණය විය. එකී සංගහණයෙන් ක්‍රෙජී සහ මෝර්ගන් වගුව ආශ්‍රයෙන් සාමාජිකයන් 70 දෙනෙකුගේ නියැදියක් තෝරාගන්නා ලදි. ලිකර්ට් පරිමාණයට සැකසූ ප්‍රශ්නාවලියක් මඟින් ප්‍රාථමික දත්ත එකතු කරනු ලැබූ අතර ගම්පහ දිස්ත්‍රික් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ වාර්තා මඟින් ද්විතියික දත්ත එකතුකර ගන්නා ලදි. පර්යේෂක විසින් ගොඩනගනු ලැබූ සංකල්පීය රාමුව තුළ සීමාකාරී ප්‍රවේශය, සීමිත සම්පත්, පාරිභෝගික අවශ්‍යතාවය ස්වායත්ත විචල්‍යයන් ලෙස හඳුනාගත් අතර මත්ස්‍ය වෙළෙන්දන්ගේ ඵලදායීතාවය පරායත්ත විචල්‍යය ලෙස හඳුනාගන්නා ලදි. දත්ත විශ්ලේෂණයට අනුව නියැදියේ වැඩිම පිරිසක් වයස අවුරුදු 30-39 අතර වයස් කාණ්ඩයේ පසුවන අතර පවුලක සාමාන්‍යය යැපෙන්නන්ගේ ගණන 2-4 අතර වේ. ප්‍රතිචාරකයින්ගෙන් වැඩි පිරිසක් රු. 50,000/- කට වැඩි ආදායමක් උපයන අතර බහුතරයක් ස්ථාවර ස්ථානයක හෝ සංචාරක මත්ස්‍ය වෙළදාමේ නිරතවනු ලබයි.

ස්වායත්ත විචල්‍යයන් වල සහ පරායත්ත විචල්‍ය අතර ඇති සම්බන්ධතාවය මිනුම් කිරිම සඳහා සහසම්බන්ධතා විශ්ලේෂණය භාවිතා කරනු ලැබූ අතර සීමාකාරී ප්‍රවේශය හා මත්ස්‍ය වෙළෙන්දන්ගේ ඵලදායීතාවය අතර ධන සහසම්බන්ධයක් (0.774) පවතින බව තහවුරු විය. ඒ අනුව සීමාකාරී ප්‍රවේශතාවය මත්ස්‍ය අලෙවිකරුවන්ගේ ඵලදායීතාවයට ධනාත්මකව බලපානු ලබයි යන උපන්‍යාසය එමඟින් සාධනය විය. එලෙසම, සීමිත සම්පත් සහ මත්ස්‍ය අලෙවිකරුවන්ගේ ඵලදායීතාවය අතර ද ධන සම්බන්ධයක් (0.894) පවතින බව තහවුරු විය. ඒ අනුව, සීමිත සම්පත් මත්ස්‍ය අලෙවිකරුවන්ගේ ඵලදායීතාවයට ධනාත්මකව බලපාන බව සාධනය විය. පාරිභෝගික අවශ්‍යතාවය සහ මත්ස්‍ය අලෙවිකරුවන්ගේ ඵලදායීතාවය අතරද ධන සහසම්බන්ධයක් (0.833) පවතින බව තහවුරු විය. ඒ අනුව, කොවිඩ්-19 වසංගත කාලසීමාව තුළ රජය විසින් පනවා ඇති සීමාවන් හේතුවෙන් මත්ස්‍ය අලෙවිකරුවන්ගේ ඵලදායීතාවය පහළ වැටී තිබුණු බවත්, එම කාලය තුළ ධීවරයන්ට ලබා දී තිබුණු අවම පහසුකම් ප්‍රමාණය නිසා ද (ධීවර ක්‍රියාකරකම් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගැනීමට ඇති බාධාවන්, ආහාර හිඟතාවය, ඉන්ධන සීමා, අයිස් ලබා ගැනීමේ සීමා...) මත්ස්‍ය අලෙවිකරුවන්ගේ ඵලදායීතාවය ද පහළ වැටී තිබුණි. පාරිභෝගික අවශ්‍යතාවයට සම්බන්ධ වූ අපනයන පහළ යාම, වෙළඳපළ නියාමන සීමා, පාරිභෝගික ක්‍රය ශක්තිය අඩු වීම, ඉල්ලුම පහත වැටීම වැනි කාරණා නිසා මත්ස්‍ය අලෙවිකරුවන්ගේ ඵලදායීතාවය පහළ ගොස් තිබුණි. තවද, මෙම පර්යේෂණයෙන් සොයාගත් වැදගත් කරුණක් වූයේ මත්ස්‍ය අලෙවිකරුවන්ගෙන් 17.8% ක් කාන්තාවන් බවයි. කාන්තා නියෝජනය අඩු මට්ටමක පැවතුනි. සමුපකාර සමිතිය මඟින් ධීවර සාමාජිකයින්ගේ දත්ත පද්ධතියක් ස්ථාපිත කර පවත්වාගෙන යාම, ධීවර කර්මාන්තයේ නිරත සමිති සාමාජිකයින් හට නව තාක්ෂණික දැනුම ලබා දීම, ධීවර හා ජලජ සම්පත් කළමනාකරණය පිළිබඳ දැනුම ලබා දිම, ධීවර ක්ෂේත්‍රයේ පර්යේෂණ අවස්ථා වැඩිදියුණු කිරිම, ධීවර ක්ෂේත්‍රයේ කාන්තා නියෝජනය වැඩිකිරීම වැනි නිර්දේශ කිහිපයක් අධ්‍යනය අවසානයේ පර්යේෂක විසින් ලබාදෙන ලදි.

***මූල පද:*** *මත්ස්‍ය අලෙවිකරුවන්ගේ ඵලදායීතාවය, සීමාකාරී ප්‍රවේශය, සීමිත සම්පත්, පාරිභෝගික අවශ්‍යතාවය.*

# Covid-19 වසංගතය හමුවේ තම ප්‍රජාවට සමුපකාර සමිතිවලින් හිමි වූ දායකත්වය අධ්‍යනය කිරීම.

(ඌව පළාතේ සමුපකාර සමිති ඇසුරින්)

ආර්.එම්.එස්. බණ්ඩාර[1]
චරිත් අමරසේකර[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව.ඌව පළාත*
*2. සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.*

මෙම පර්යේෂණයේ අරමුණ වූයේ කොවිඩ්-19 වසංගතය හමුවේ තම ප්‍රජාවට සමුපකාර සමිති වලින් හිමි වූ දායකත්වය අධ්‍යනය කිරීමයි. ද්වීතීයික අරමුණ වූයේ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ප්‍රජාව මුහුණ දෙන දුෂ්කරතා හඳුනා ගැනීමත්, කොවිඩ් වසංගතය හේතුවෙන් සමුපකාර සමිති මුහුණ දුන් අභියෝග හා ප්‍රජාව සවිබල ගැන්වූ ආකාරය හඳුනාගැනීමයි. සාහිත්‍ය විමර්ෂණයේ දී අනාවරණය වූයේ කොවිඩ් වසංගත කාලය තුළ සපයන ලද පාරිභෝගික, මූල්‍ය හා සුවිශේෂී සේවා සාමාජික තෘප්තිය අතර සැලකියයුතු සහසම්බන්ධතාවයක් පවතින බවයි. එමෙන්ම, සාහිත්‍ය විමර්ෂණයේ දී අනාවරණය වූයේ කොවිඩ් වසංගත කාලය තුළ සපයන ලද පාරිභෝගික, මූල්‍ය හා සුවිශේෂී සේවා සාමාජික තෘප්තියට ප්‍රමාණවත් බලපෑමක් ඇති කරන බවයි. පර්යේෂණ නියැදිය ලෙස ඌව පළාතේ විවිධ සේවා සමුපකාර සමිති හා ග්‍රාමීය බැංකු සමුපකාර සමිතිවල සාමාජිකයින් 106 දෙනෙකු ස්ථරීකෘත නියැදි ක්‍රමයෙන් තෝරාගෙන සංවෘත්ත ආන්තික ප්‍රශ්නාවලියක් මගින් දත්ත රැස් කරන ලදි. සංඛ්‍යානමය ගණනය කිරීම් මගින් දත්ත විශ්ලේෂණය සිදුකළ අතර පර්යේෂණ ප්‍රතිඵල වලින් දැක්වූයේ ඌව පළාතේ විවිධ සේවා සමුපකාර සමිති හා ග්‍රාමීය බැංකු සමිති මගින් කොවිඩ් වසංගත කාලය තුළ ලබාදුන් පාරිභෝගික හා වෙනත් සුවිශේෂී සේවා සාමාජික සමස්ථ තෘප්තිය ඇති කිරීමට සංඛ්‍යානමය වශයෙන් පිළිගතහැකි ධනාත්මක සබඳතාවයක් පෙන්නුම් කරන බවයි. මෙහිදී, සාමාජිකයින්ට ලබාදුන් සුවිශේෂී සේවා හා සාමාජික තෘප්තිය අතර 0.342 ක සහසම්බන්ධතාවයක් හා පාරිභෝගික සේවා හා සාමාජික තෘප්තිය අතර 0.165 ක පිළිගතහැකි සහසම්බන්ධතාවයක් පවතින බවයි. මෙහිදී මූල්‍ය සේවා හා පාරිභෝගික තෘප්තිය කෙරෙහි පිළිගතහැකි ධනාත්මක සම්බන්ධතාවයක් නොපවතින බව අනාවරණය විය. ඒ අනුව, මූල්‍ය සේවා අඛණ්ඩව, පහසුවෙන් ලබාගැනීමටත්, වසංගත කාලය තුළ දී ණය හා පොලී සහන ලබාදීමටත්, සුවිශේෂී ණය පහසුකම් අඩුපොලී යටතේ ලබාදීමටත්, එම සේවා පිළිබඳව දැනුවත් කිරීම මගින් සාමාජික තෘප්තිය ධනාත්මකව ගොඩනගාගත හැකිබවත් අධ්‍යනයෙන් පැහැදිලි විය.

***මූල පද:** ප්‍රජාව, පාරිභෝගික, මූල්‍ය හා සුවිශේෂී සේවා*

# දේශීය කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය සඳහා සී/ස දිවුලපැලැස්ස දේදුණු කෘෂිකාර්මික සමුපකාර සමිතිය දක්වා ඇති දායකත්වය.

(සිද්ධි අධ්‍යනය)

ඩබ්.එම්.උපතිස්ස විජේතුංග[1]
දිනුෂ දිසානායක[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව.ඌව පළාත*
*2. සහකාර පර්යේෂක, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.*

මෙම පර්යේෂණයේ අරමුණ වූයේ දේශීය කෘෂිකර්මාන්තය සඳහා සමුපකාර ව්‍යාපාරය කෙබඳු දායකත්වයක් දරා ඇත්ද යන්න සී/ස දිවුලපැලැස්ස දේදුණු කෘෂිකාර්මික සමුපකාර සමිතිය ඇසුරින් විමර්ෂණය කිරීමයි. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූවේද මෙයයි. ඊට අමතරව පහත සඳහන් උප අරමුණු හඳුනාගන්නා ලදි. දේශීය කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය සඳහා සමුපකාර සමිතියකට ඇති ශක්‍යතාවය හඳුනාගැනීම, දේශිය කෘෂිකර්මාන්තය නඟාසිටුවීම සඳහා සමුපකාර සමිතියක් ඇසුරින් ලබාදිය හැකි යෝජනා ඉදිරිපත් කිරීම. ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශය භාවිතාකරමින් මෙම අධ්‍යනය සැලසුම් කරන ලදි. මෙම පර්යේෂණය සඳහා සමිති සාමාජිකයින්ගේ සිට සාමාජික නොවන ගණුදෙනුකරුවන් දක්වා පුද්ගලයින් 100 දෙනෙකුගේ නියැදියක් පහසු නියැදි ක්‍රමය යටතේ ලබාගන්නා ලදි. අධ්‍යනයේ අරමුණට අදාළව සකසන ලද ප්‍රශ්නාවලියක් මඟින් දත්ත එකතුකර ගන්නා ලදි. ද්විතියික දත්ත සඳහා මූලාශ්‍ර ලේඛණ භාවිතා කරන ලදි. පර්යේෂණයේ ප්‍රතිඵල අනුව ප්‍රදේශයේ කෘෂිකර්මාන්තය නඟාසිටුවීමට සමිතිය ප්‍රමාණවත් දායකත්වයක් දක්වන බවත් කෘෂිඋපකරණ සහ අමුද්‍රව්‍ය සැපයීම පිළිබඳව, කෘෂි ණය පහසුකම් සැපයීම හා ආහාර බැංකු ක්‍රමය පිළිබඳව ධනාත්මක ප්‍රතිචාර ලැබී තිබුණි. අධ්‍යනයේ නිර්දේශ ලෙස කෘෂිකාර්මික සමුපකාර සමිති භාවිතා කරන සාම්ප්‍රදායික තාක්ෂණය වෙනුවට නව තාක්ෂණය හඳුන්වාදිය යුතු බව නිර්දේශ කරයි. ජාතික සහ ජාත්‍යාන්තර වෙළඳපළ සමඟ සෘජුව තරඟ කිරිමේ හැකියාවක් ඇතිවන තතත්වයට දේශීය කෘෂිකර්මාන්තය සංවර්ධනය කළයුතු බව අවධාරණය කෙරිණි. අනාගත පර්යේෂණ සඳහා ප්‍රාදේශීය මට්ටමේ අනෙකුත් කෘෂිකාර්මික සමිති පිළිබඳව අධ්‍යනය කර හා ජාතික මට්ටමේ සමිති ආශ්‍රයෙන් අධ්‍යනය පුළුල් කිරීමට ද යෝජනා කරයි.

***මූල පද:*** *දේශීය කෘෂිකර්මාන්තය, ශක්‍යතාවය, ආහාර බැංකු ක්‍රමය*

# පේෂකර්ම නිෂ්පාදන සමුපකාර සමිති ග්‍රාමීය ආර්ථිකයට හා සංවර්ධනයට දක්වන දායකත්වය පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යනය.

(වයඹ පළාත් පේෂකර්මාන්ත සමුපකාර සමිති ඇසුරින්)

රු.ඉ.වනිගබඳු[1]
දිනූෂ දිසානායක[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව.වයඹ පළාත*
*2. සහකාර පර්යේෂක, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.*

මිනිස් ශ්‍රමය උපයෝගී කරගෙන අවම ප්‍රාග්ධනයක් ආයෝජනය කිරීමෙන් රෙදිපිළි නිෂ්පාදනය කරන දේශීය ගෘහස්ත කර්මාන්තයක් වශයෙන් අත්යන්ත්‍ර පේෂකර්මාන්තය හඳුන්වාදිය හැකිය. පේෂකර්ම නිෂ්පාදන සමුපකාර සමිති ග්‍රාමීය ආර්ථිකයට හා සංවර්ධනයට දක්වන දායකත්වය පිළිබඳව වයඹ පළාතේ පේෂ කාර්මිකයින්ගේ සමුපකාර සමිති ඇසුරින් අධ්‍යනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. වයඹ පළාත කුරුණෑගල සහ පුත්තලම යන දිස්ත්‍රික්ක දෙකෙන් සමන්විතය. ශ්‍රී ලංකාව වර්තමානය තුළ මුහුණ දෙන ප්‍රධාන ගැටළුවක් වන දරිද්‍රතාවය සහ රැකියා වියුක්තියට සාර්ථක විසඳුමක් පේෂකර්මාන්තය තුළ අන්තර්ගතය. ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශය භාවිතාකරමින් මෙම අධ්‍යනය සැලසුම් කරන ලද අතර අධ්‍යනයේ අරමුණු වලට අදාළව සකසන ලද ක්ෂේත්‍ර ප්‍රශ්නාවලියක් මඟින් ප්‍රාථමික දත්ත එකතුකර ගන්නා ලදි. ප්‍රකාශයට පත්කරන ලද ද්විතීයික වාර්තා මඟින් පර්යේෂණයට අදාළ ද්විතියික දත්ත එකතුකර ගන්නා ලදි. වයඹ පළාතේ පේෂකර්මාන්තය මඟින් දේශීය නිෂ්පාදන වැඩිදියුණු කිරිම හා සාමාජික ව්‍යවසාය නංවාලීමට සැලකියයුතු දායකත්වයක් ලබාදී ඇති බව අධ්‍යනයෙන් හෙළිවිය. දැනුම සහිත ශිල්පීන් හා මානව සම්පතක් සිටීම මෙම සමිති සතු ප්‍රධාන ශක්තිය වන අතර නිෂ්පාදනය සඳහා අවශ්‍යය නවීන තාක්ෂණය නොමැති වීම හා තරුණ ප්‍රජාව ආකර්ෂණය කරගත නොහැකි වීම මෙම සමිති සතු ප්‍රධාන දූර්වලතාවයන් වේ. පේෂකර්ම නිෂ්පාදන සඳහා දෙස් විදෙස් ඉල්ලුම ඉහළ යාම ප්‍රධාන අවස්ථාවක් වූ අතර පුද්ගලික අංශය හා ඇතිවන තරඟකාරිත්වය මෙම සමිති වලට ඇති ප්‍රධාන තර්ජනය ලෙස හඳුනාගන්නා ලදි. නව තාක්ෂණය මුසු වූ වෙළඳ ජාලයක් ඇති කිරීම, රාජ්‍ය අනුග්‍රහය සහිතව අපනයන වෙළෙඳපළ පදනම්කරගත් රෙදිපිළි නිෂ්පාදනය කිරීම හා අපනයනය කිරීම, මනා අභ්‍යන්තර පාලන ක්‍රමයක් පේෂකර්ම නිෂ්පාදන සමුපකාර සමිති තුළ පිහිටුවීම වැනි කාරණා නිර්දේශ ලෙස අධ්‍යනය අවසානයේදී ලබා දෙන ලදි.

***මූල පද:*** *පේෂකර්ම නිෂ්පාදන සමුපකාර සමිති, ග්‍රාමීය ආර්ථිකය*

# ග්‍රාමීය බැංකු මූල්‍ය තිරසාරත්වය උදෙසා ඵලදායී ණය කළමනාකරණයේ බලපෑම පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යනය

## (සී/ස බදුල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ ග්‍රාමීය බැංකු අංශය ඇසුරින්)

ඩබ්.ඒ.ජේ.එන් පෙරේරා[1]
අජිත් අමරකීර්ති[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව.ඌව පළාත*
*2. අධ්‍යක්ෂ (අධ්‍යන හා සංවර්ධන), ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.*

මෙම පර්යේෂණයේ අරමුණ වූයේ ග්‍රාමීය බැංකු මූල්‍ය තිරසාරත්වය උදෙසා ඵලදායී ණය කළමනාකරණයේ බලපෑම පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යනයක් සිදුකිරීමයි. ඌව පළාත තුළ ක්‍රියාත්මක බොහෝ ග්‍රාමීය බැංකු දූර්වල ණය කළමනාකරණ ක්‍රියාකාරකම් හේතුවෙන් බොහෝ අභියෝගයන්ට ලක්වෙමින් පවතී. එම නිසා සමිති බහුතරයක් ප්‍රශස්ත ද්‍රවශීල තතත්වයක් පවත්වාගෙන යාමේ අභියෝගයට මුහුණ දී සිටී. ග්‍රාමීය බැංකු පිළිබඳ සාහිත්‍ය විමර්ෂණයන් වලදී හඳුනාගනු ලැබූ කරුණු වලදී අනාවරණය වූයේ බැංකුවක මූල්‍ය තිරසාරත්වය උදෙසා ණය කළමනාකරණය, තැන්පත් රාශිකරණය, නියෝජිත සේවා, පාරිභෝගික සත්කාරය, සේවක දැනුම, කුසලතා සහ ආකල්ප වැනි මූලිකාංග විවිධ පරිමාණයෙන් බලපාන බවයි. මෙම අධ්‍යනයේ දී අවධානය යොමුකරන ලද්දේ ග්‍රාමීය බැංකු මූල්‍ය තිරසාරත්වය උදෙසා ණය කළමනාකරණයේ බලපෑම පමණක් වන අතර එහිදී, අධීක්ෂණ ක්‍රියාවලිය, තක්සේරුකරණ ක්‍රියාවලිය සහ ණය ප්‍රතිපත්ති යන මූලිකාංග මඟින් පමණක් ඇති කරන බලපෑම සැලකිල්ලට ගන්නා ලදි. අධ්‍යනයේ සංගහණය ලෙස සී/ස බදුල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ ග්‍රාමීය බැංකු කාර්යමණ්ඩලය යොදාගන්නා ලදි. ක්‍රෙජී සහ මෝර්ගන් වගුව ආශ්‍රයෙන් 40 දෙනෙකුගේ නියැදියක් ලබාගන්නා ලදි. ප්‍රශ්නාවලියක් මාර්ගයෙන් දත්ත එකතු කරනු ලැබූ අතර දත්ත විශ්ලේෂණය සංඛ්‍යානමය ක්‍රම මඟින් සිදුකරන ලදි. පර්යේෂණ ප්‍රතිඵල අනුව ග්‍රාමීය බැංකුවක මූල්‍ය තිරසාරත්වය සඳහා අධීක්ෂණ ක්‍රියාවලිය, තක්සේරුකරණය හා ණය ප්‍රතිපත්ති ධනාත්මකව සහසම්බන්ධ වන බවයි. එමඟින් මූල්‍ය කාර්යසාධනය ඉහළ ගොස් මූල්‍ය තිරසාරත්වය ඇතිවන බව අධ්‍යනය තුළින් තහවුරු විය.

***මූල පද:*** *ග්‍රාමීය බැංකු මූල්‍ය තිරසාරත්වය, අධීක්ෂණය, තක්සේරුකරණය, ණය ප්‍රතිපත්ති.*

# සමුපකාර ග්‍රාමීය බැංකුවල අවදානම් කළමනාකරණය සඳහා බැංකු නියාමන මාර්ගෝපදේශයන්හි බලපෑම පිළිබඳ අධ්‍යනය.

(වයඹ පළාතේ විවිධ සේවා සමුපකාර සමිති ග්‍රාමීය බැංකු ඇසුරින්)


කේ.ආර්.ජේ.එස් බණ්ඩාර[1]
නන්දන බී. හපුආරච්චි[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. වයඹ පළාත*
*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.*



මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූයේ සමුපකාර ග්‍රාමීය බැංකුවල අවදානම් කළමනාකරණය සඳහා බැංකු නියාමන මාර්ගෝපදේශයන්හි බලපෑම වයඹ පළාතේ විවිධ සේවා සමුපකාර සමිතිවල ග්‍රාමීය බැංකු ඇසුරින් විශ්ලේෂණය කිරිමයි. මෙහි ද්විතීයික අරමුණු වූයේ ග්‍රාමීය සමුපකාර බැංකුවල අවදානම් කළමනාකරණයට අදාළ අවදානම් කළමනාකරණ සංරචකයන් ප්‍රායෝගිකව භාවිතා කිරීමේ දී මතුවන ගැටළු හඳුනාගැනීමත්, ග්‍රාමීය සමුපකාර බැංකු මුහුණ දෙන අවදානම් අවමකර ගැනීමට නව ක්‍රියාමාර්ග හඳුන්වාදීම හා මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග වැඩිදියුණු කිරීමට අදාළ යෝජනා ඉදිරිපත් කිරීමත් වේ. පර්යේෂණයේ නියැදිය ලෙස වයඹ පළාතේ විවිධ සේවා සමුපකාර සමිතිවල ග්‍රාමීය බැංකු අංශයේ අභ්‍යන්තර විගණකවරුන් 30 දෙනෙකු තෝරාගන්නා ලදි. බැංකු අවදානමට බලපාන සාධක සම්බන්ධයෙන් සිදුකරන ලද සාහිත්‍ය විමර්ෂණය අනුව ණය අවදානම, ද්‍රවශීලතා අවදානම, මෙහෙයුම් අවදානම සහ අනෙකුත් අවදානම් ස්වායත්ත විචල්‍යයන් වූ අතර සමුපකාර ග්‍රාමීය බැංකු මුහුණපාන අවදානම පරායත්ත විචල්‍යය විය. ඉහත සාධක ඇතුලත් ප්‍රශ්නාවලියක් පූර්ව පරික්ෂා කිරීමකින් පසු ප්‍රාථමික දත්ත රැස්කිරිම සඳහා ලබා දී ඇත. අධ්‍යනයට අදාළ ද්විතීයික දත්ත වයඹ පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රකාශිත වාර්තා තුළින් ලබාගන්නා ලදි. දත්ත වල වලංගුතාවය පරික්ෂා කිරීමට සංඛ්‍යානමය ක්‍රමවේදයන් කිහිපයක් යොදා ගන්නා ලද අතර එම පරීක්ෂණ වලින් දත්ත වල වලංගුතාවය සහ විශ්වාසනීයත්වය තහවුරු විය. කල්පිත පරීක්ෂා කිරීමේ දී, අවදානම් සාධක හා ග්‍රාමීය බැංකු අවදානම අතර ඉතා ප්‍රභල සහසම්බන්ධයක් (0.891) දක්නට ලැබුණු අතර ප්‍රතිපායන විශ්ලේෂණයේ දී ස්වායත්ත විචල්‍යයන් නිසා පරායත්ත විචල්‍යය 79.4% කින් වෙනස්වන බව තහවුරු විය. තවද, ණය අවදානම, ද්‍රවශීලතා අවදානම, මෙහෙයුම් අවදානම සහ අනෙකුත් අවදානම් පරායත්ත විචල්‍ය සමඟ ධන සම්බන්ධතාවයක් දක්වන ලදි. ග්‍රාමීය බැංකු නියාමන ක්‍රමවේදය ශක්තිමත් කිරීම, මූල්‍ය ප්‍රමිති සැකසිම, විගණනය ශක්තිමත් කිරිම වැනි නිර්දේශ කිහිපයක් අධ්‍යනය අවසානයේ දී පර්යේෂක විසින් ලබාදෙන ලදි.



***මූල පද:*** *අවදානම් කළමනාකරණය, බැංකු නියාමන මාර්ගෝපදේශය*

# ග්‍රාමීය සුළු පරිමාණ සමුපකාර සමිති බිඳවැටීමට බලපාන හේතු පිළිබඳ අධ්‍යනයක්.

ජී.ඩබ්.සී.එල් පෙරේරා[1]
චරිත් අමරසේකර[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. වයඹ පළාත*
*2. සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.*

ශ්‍රී ලංකාව පුරා විසිර පවතින කුඩා පරිමාණ සමුපකාර සමිති කෘෂිකාර්මික, කාන්තා ස්වශක්ති සමුපකාර සමිති, සත්ව පාලන, කාර්මික, පාසල්, ධීවර, නිෂ්පාදන යන ක්ෂේත්‍රයන් පුරා විහිදී පවතී. එසේ වුවද, මෙම සමිති ආරම්භ කොට කෙටි කාලයකින් බිඳ වැටී ඈවරකරණයකට යොමු වීමේ විශාල ප්‍රවණතාවයක් දක්නට ලැබේ. මෙසේ සමුපකාර සමිති බිඳ වැටීමට විවිධ හේතු බලපානු ඇතැයි යන උපන්‍යාසය මත සිට පරීක්ෂා කිරිම මෙම පර්යේෂණයෙන් සිදු වී ඇත. මෙම අධ්‍යනය වයඹ පළාතේ මහව සමුපකාර සංවර්ධන සහකාර කොට්ඨාසයේ මහව ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ පිහිටි 2021 වර්ෂය තුළ බිඳවැටුණු කුඩා සමුපකාර සමිති 05 ක් ඇසුරින් සිදුකරන ලදි. එම සමිති පහට අදාළ සාමාජිකයින් 288 දෙනා අධ්‍යනයේ සංගහණය ලෙස සලකන ලදි. ඉන් 144 දෙනෙකු ක්‍රෙජී සහ මෝර්ගන් වගුව භාවිතා කරමින් නියැඳිය ලෙස තෝරාගන්නා ලදි. පර්යේෂණයේ ප්‍රාථමික දත්ත ලබාගැනීම ප්‍රශ්නාවලියකින් හා සම්මුඛ පරීක්ෂණ මාර්ගෝපදේශයක් භාවිතාකරමින් සිදුකරන ලදි. ප්‍රතිචාරකයින් ප්‍රශ්නාවලියට ලබාදුන් ප්‍රතිචාර අනුව කුඩාපරිමාණ සමුපකාර සමිති බිඳවැටීමට බලපා ඇති හේතු ලෙස ප්‍රජා අවශ්‍යතාවය මත සමිති සංස්ථාපනය නොවීම, සමුපකාර නීතියේ සංකීර්ණත්වය, සමිති තිරසාරව පවත්වාගෙන යාමට සාමාජිකයින්ගේ දායකත්වය අවම වීම, සමුපකාර සමිති සඳහා නිසි උපදේශණය හා මඟපෙන්වීමක් නොමැති වීම හා සාමාජිකයින්ගේ අධ්‍යාපන හා පුහුණු මට්ටම අවම වීම හඳුනාගන්නා ලදි. ප්‍රජාව සවිබලගැන්වීමේ අරමුණින් ප්‍රජා අවශ්‍යතාවය මත ග්‍රාමීය සුළු පරිමාණ සමුපකාර සමිති පිහිටුවීමටත්, සාමාජිකයින්ගේ අධ්‍යාපන මට්ටම වැඩිකිරීම සඳහා පුහුණුව ලබා දීමේ ක්‍රමවේදයක් සැකසීමටත්, කුඩා පරිමාණ සමුපකාර සමිති සඳහා නෛතික ක්‍රියාදාමයන් සරල කිරීමටත් අධ්‍යනය අවසානයේ දී පර්යේෂක විසින් නිර්දේශ කරයි.

***මූල පද:*** *ග්‍රාමීය සුළු පරිමාණ සමුපකාර සමිති, සමුපකාර නීතිය, ප්‍රජා අවශ්‍යතාවය*

# සංවිධානවල පාරිභෝගික තෘප්තිය සඳහා බලපානු ලබන හේතු හඳුනාගැනීම.

(සී/ස උඩපළාත විවිධ සේවා සමුපකාර සමිතියේ ග්‍රාමීය බැංකු අංශය ඇසුරින්)


ජේ.එම්.කේ ලක්මාලි[1]
ශානිකා මුදන්නායක[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. ඌව පළාත*
*2. කථිකාචාර්ය, උසස් තාක්ෂණික ආයතනය, මහනුවර.*



මෙම පර්යේෂණයේ අරමුණ වූයේ සංවිධානවල පාරිභෝගික තෘප්තිය කෙරෙහි බලපාන හේතු හඳුනාගැනීමයි. විවිධ සේවා සමුපකාර සමිතිවල ග්‍රාමීය බැංකු අංශය පවත්වාගෙන යාමේදී මූල්‍ය වෙළඳපළ සමඟ තරඟකාරී ලෙස කටයුතු කිරීමට සිදු වේ. තරඟකාරීත්වය අත්හළ අවස්ථාවල දී ග්‍රාමීය බැංකු අසාර්ථක වූ අවස්ථා බොහෝමයක් වර්තමානයේදී දැකගත හැකිය. ගුණාත්මක බැංකු සේවාවන් සැපයීම වර්තමාන මූල්‍ය වෙළඳපලේ උපායමාර්ගික මෙවලමක් ලෙස භාවිතා වේ. පාරිභෝගිකයා ඇත්වීමේ ගැටළුවකට මුහුණ දී තිබෙන ඌව පළාත තුළ පිහිටි විවිධ සේවා සමුපකාර සමිතියක් වන සී/ස උඩපළාත විවිධ සේවා සමුපකාර සමිතියේ ග්‍රාමීය බැංකු අංශය ඇසුරින් මෙම පර්යේෂණය සිදුකර ඇත. පර්යේෂණයේ නියැදිය ලෙස පසුගිය වසර තුනක අලාභ තතත්වයන් පවත්වාගෙන ගොස් තිබූ ඉහත සමිතියේ බැංකු ශාඛා 06 ක ගණුදෙනුකරුවන් 75 දෙනෙකු තෝරාගෙන සේවා ගුණාත්මකභාවය සහ පාරිභෝගික තෘප්තිය පිළිබඳව සකස්කරන ලද දර්ශක ඇතුලත් ලිකර්ට් පරිමාණ ප්‍රශ්නාවලියකින් දත්ත එකතු කරන ලදි. එම දත්ත විශ්ලේෂණය අනුව පාරිභෝගික තෘප්තියේ සහ සේවා ගුණාත්මකභාවය අතර ප්‍රභල ධන සහසම්බන්ධයක් පවතින බව ඔප්පු විය. ස්වායත්ත විචල්‍ය වන සේවා ගුණාත්මකභාවයෙහි මානයන් 05 ක් යටතේ එනම්, ස්පර්ෂය, ප්‍රතිචාර දැක්වීම, විශ්වාසනීයත්වය, සහතික වීම සහ සංවේදනය යන සියළු විචල්‍යයන් පාරිභෝගික තෘප්තිය සමඟ ධන සම්බන්ධයක් පවතින බව සාධනය විය. ඒ අනුව, පාරිභෝගික තෘප්තිය පවත්වාගෙන යාම සඳහා ගුණාත්මක සේවාවක් ලබාදිය යුතුබව පර්යේෂණ ප්‍රතිඵලය අනුව පැහැදිලි විය.



***මූල පද:*** *පාරිභෝගික තෘප්තිය, විශ්වාසනීයත්වය, ගුණාත්මක සේවාව*

# සාමාජික ව්‍යවසායකයින් දිරිගැන්වීම සඳහා විවිධ සේවා සමුපකාර සමිතිවල දායකත්වය විශ්ලේෂණය.

ආර්.ඩී.කේ.අයි රාජපක්ෂ[1]
චරිත් අමරසේකර[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. ඌව පළාත*
*2. සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.*

සාමාජික ව්‍යවසායකයින් දිරිගැන්වීම සඳහා විවිධ සේවා සමුපකාර සමිතිවල දායකත්වය විශ්ලේෂණය කිරීම සඳහා මෙම අධ්‍යනය සිදුකරන ලදි. මෙම පර්යේෂණය සඳහා බදුල්ල දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිති තුනක් තොරාගන්නා ලදි. මෙම විවිධ සේවා සමුපකාර සමිති තුනට අදාලව ණයලාභීන් 102 දෙනෙකු නියැඳිය ලෙස ලබාගනිමින් දත්ත එකතුකර ගන්නා ලදි. දත්ත විශ්ලේෂණයට අනුව මූල්‍ය ප්‍රතිලාභ සහ සාමාජික ව්‍යවසායකයින් දිරිගැන්වීම අතර ධන සම්බන්ධතාවයක් (0.273) පෙන්වන ලදි. ඉන් ගම්‍ය වන්නේ ව්‍යවසායකයින්ට ව්‍යාපාර ආරම්භකිරිමට ලබාදෙන ප්‍රාග්ධන ණය සහ කාරක ප්‍රාග්ධණ අවශ්‍යතා වෙනුවෙන් ලබාදෙන ණය සාමාජික ව්‍යවසායකයින් දිරිගැන්විමට හේතුවන බවයි. එමෙන්ම, පර්යේෂණ ප්‍රතිඵල අනුව මූල්‍ය ප්‍රතිලාභ වලට වඩා මූල්‍ය නොවන ප්‍රතිලාභ වඩා ප්‍රභල බව තහවුරු විය. තවද, බැංකු මඟින් තම සාමාජිකයින්ට ලබාදෙන ව්‍යාපාර ආරම්භ කිරීමේ පුහුණු වැඩසටහන්, ව්‍යාපාර සැලසුම්කරණය සහ උපදේශණය වැනි මූල්‍ය නොවන ප්‍රතිලාභ නිසා ව්‍යවසායකයින් දිරිගැන්වෙන බව තහවුරු විය. මෙම පර්යේෂණයේ ප්‍රතිඵල මඟින් තහවුරු වන්නේ සමුපකාර සංවිධානවලට තම සාමාජික ව්‍යවසායකයින් සංවර්ධනය කිරීම සඳහා මූල්‍ය මෙන්ම මූල්‍ය නොවන ප්‍රතිලාභ යන දෙවර්ගය පිළිබඳවම සැලකිල්ලක් දැක්වියයුතු බවයි. මෙමඟින් සමිතිය වටා ශක්තිමත් ව්‍යවසායකයින් පිරිසක් බිහිකරගත හැකි බව සනාථ වේ. ව්‍යවසායකයින් සඳහා ප්‍රාග්ධනය සම්පාදනයේදී අදියර වශයෙන් සිදුකිරීමටත්, මූල්‍ය නොවන ප්‍රතිලාභ ව්‍යවසායකයින් සඳහා ලබාදීමටත්, නවතාක්ෂණික දැනුම ව්‍යවසායකයින් හට ලබාදීමටත් පර්යේෂක විසින් අවසානයේදී නිර්දේශ කරන ලදි.

***මූල පද:*** *ව්‍යවසායකයින් දිරිගැන්වීම, මූල්‍ය නොවන ප්‍රතිලාභ*

# සමුපකාර ක්ෂේත්‍රය තුළ කාන්තා සවිබලකරණයේ ශක්‍යතාවය පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යනය.

බී.එච්.එන් නිල්මිණි[1]
චරිත් අමරසේකර[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. වයඹ පළාත*
*2. සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.*

මෙම පර්යේෂණය සිදුකිරීමේ අරමුණ වූයේ සමුපකාර ක්ෂේත්‍රය තුළින් කාන්තාව ආර්ථික, සාමාජීය හා ගුණාත්මක වශයෙන් ශක්තිමත් කිරිමට ඇති හැකියාව හඳුනාගැනීම සහ සමුපකාර සංවිධාන මේ වන විට කොතෙක් දුරට ඒ සඳහා දායක වී ඇත්දැයි යන්න පිළිබඳව සාමාජිකයින් ඇසුරින් හඳුනාගැනිමයි. සමාජයේ කුඩාම ඒකකය වන පවුල තුළ කාන්තාව විශාල කාර්යයක් ඉටුකරන බව නොරහසකි. මෙම අධ්‍යනයේ දී ග්‍රාමීය බැංකු අංශය මඟින් කාන්තාව සවිබල ගැන්වීමට දෙනු ලබන දායකත්වය කොතෙක්ද යන්න සොයාබැලීම අරමුණ වී ඇත. නියැදිය තෝරාගැනිමේ දී සමිති බලප්‍රදේශය තුළ ස්ථාපිත කර ඇති බැංකු ශාඛා 16 නියෝජනය වන පරිදි ඒ ඒ බැංකු ශාඛාවේ ණයලාභීන් සංඛ්‍යාවෙන් 153 ක නියැදියක් ගෙන ප්‍රශ්නාවලියක් ආධාරයෙන් දත්ත එකතු කිරීම සිදුකරන ලදි. දත්ත විශ්ලේෂණයට අනුව සාමාජික කාන්තාවන්ගෙන් 36% ක් වයස 32-38 අතර පසුවේ. කාන්තා සවිබලකරණය ඇති කිරීම සඳහා මූල්‍ය පහසුකම්, පුහුණුව හා සංවර්ධනය, කැපකළ හැකි කාලය, අවදානම් දැරීමේ හැකියාව වැනි සාධක ඍජු බලපෑමක් සිදුකරන බව පැහැදිලි වන අතරම ස්වයං රැකියාවක යෙදිමට 65% ක් කැමති වුවද ඒ සඳහා ප්‍රමාණවත් මූලික ප්‍රාග්ධනයක් පවතින්නේ 5% වැනි සුළු පිරිසකටය. පුහුණුව හා සංවර්ධනය අවශ්‍යය ප්‍රමාණය 92% ක් වන අතර ඒ සඳහා ප්‍රමාණවත් දැනුම පවතින්නේ 8% කට පමණි. ව්‍යාපාරික කටයුත්තක් වෙනුවෙන් අමතර කාලයක් කැපකළ හැකි පිරිස 35% ක් පමණි. මෙහිදී, කාන්තා ව්‍යවසායකයින් මුහුණ දෙන ප්‍රධාන ගැටළුව වන මූල්‍ය පහසුකම් සොයාගැනීමේ ගැටළුව නිසා කාන්තා ව්‍යවසායකත්වය අඩු වී ඇත. බහුතරයක් කාන්තාවන් තම ආදායම් මාර්ග වැඩිකර ගැනීමේ අරමුණින් ස්වයං රැකියාවක් සිදුකිරීමට කැමැත්තක් දක්වන බව පර්යේෂණයෙන් හෙළිදරව් කරගන්නා ලදි. සමුපකාර සමිති මේ පිළිබඳව අවධානය යොමුකරමින් කටයුතු කිරීම තුළ සමුපකාර ක්ෂේත්‍රය තුළ කාන්තා සවිබලකරණය තවදුරටත් ශක්තිමත් වනු ඇත.

***මූල පද:*** *ව්‍යවසායකත්වය, කාන්තා සවිබලකරණය*

# තිරසාර මූල්‍යායතනයක් සඳහා ග්‍රාමීය බැංකු ප්‍රවේශය කෙසේද? යන්න හඳුනා ගැනීම.

(බදුල්ල දිස්ත්‍රික් විවිධ සේවා සමුපකාර සමිති හා ග්‍රාමීය බැංකු ඇසුරින්)


ඩබ්.ඒ.ඒ සුමිත්[1]
අජිත් අමරකීර්ති[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. ඌව පළාත*
*2. අධ්‍යක්ෂ (අධ්‍යන හා සංවර්ධන), ජාතික සමුපකාර සංවර්ධන ආයතනය*



තිරසාර මූල්‍යායතනයක් සඳහා ග්‍රාමීය බැංකු ප්‍රවේශය කෙසේද? යන්න හඳුනා ගැනීම මූලික අරමුණ කරගෙන දියත් කරන ලද මෙම පර්යේෂණය බදුල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය බැංකු සමිතියක් හා ග්‍රාමීය බැංකු අංශ තුනක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, සේවකයින් හා ගණුදෙනුකරුවන් ඇසුරින් සිදුකරන ලදි. සාහිත්‍ය විමර්ෂණයේදී මූල්‍ය ආයතනයක් තිරසාරව පැවතීම අත්‍යවශ්‍ය සාධකයක් බව හෙළිදරව්කර ගන්නා ලදි. නියැදිය ලෙස ඉහත අංශ තුනම නියෝජනය වන පරිදි 200 දෙනෙකු තෝරාගෙන ඔවුන් වෙත මාර්ගගත ප්‍රශ්නාවලියක් (Google form) ලබාදෙන ලදි. ඉන් 148 දෙනෙකු සාර්ථකව ප්‍රතිචාර දක්වා තිබුණු අතර දත්ත විශ්ලේෂණය අනුව ආයතනයක් තිරසාර මූල්‍යායතනයක් වීම සඳහා මූල්‍ය තිරසාරබව ළඟාකර ගැනීම, ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය දිනාගැනීම, ආදායම් උත්පාදන මාර්ගවල මුදල් ආයෝජනය කිරීම අවශ්‍යය බව තහවුරු විය. බදුල්ල දිස්ත්‍රික් විවිධ සේවා සමුපකාර සමිති හා ග්‍රාමීය බැංකු මේ පිළිබඳව වැඩි අවධානයක් යොමු නොකරන බව අධ්‍යනයෙන් හෙළිවිය. ඒ අනුව, වර්තමානයේදී ග්‍රාමීය බැංකු විසින් අනුගමනය කරන ක්‍රියාපිළිවෙත් වෙනස්කළ යුතුව තිබේ. විශේෂයෙන්ම, තිරසාර මූල්‍ය සංවිධානයක් වශයෙන් පවතින්නට නම් සහ ඉන් සමාජයට සිය ගනුදෙණුකරුවන්ගේ ජීවන තතත්වය උසස් මට්ටමකට ගෙන ඒමටත් ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් හා නියාමන ක්‍රමයන් අනුගමනය කළ යුතු බව මෙම සමීක්ෂණයේදී හෙළිවිය.



***මූල පද:** තිරසාර මූල්‍යායතනයක්, ග්‍රාමීය බැංකු, පිළිගත් ප්‍රමිතීන්*

# විවිධ සේවා සමුපකාර සමිතිවල සාමාජිකයින් සක්‍රීයව සමිතිය තුළ ආර්ථික කටයුතු වලට දායකකර ගැනීම පිළිබඳ අධ්‍යනය.

(සී/ස බණ්ඩාරවෙල විවිධ සේවා සමුපකාර සමිතියේ සාමාජිකයින් ඇසුරින්)

එච්.එම්.දී හෙන්නායක[1]
චරිත් අමරසේකර[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. ඌව පළාත*
*2. සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.*

විවිධ සේවා සමුපකාර සමිතිවල සාමාජිකයින් සක්‍රීයව සමිතිය තුළ ආර්ථික කටයුතු වලට දායකකර ගැනීම පිළිබඳව අධ්‍යනය කිරිම උදෙසා මෙම පර්යේෂණය දියත් කරන ලදි. ප්‍රධාන අරමුණට අමතරව සී/ස බණ්ඩාරවෙල විවිධ සේවා සමුපකාර සමිතියේ සාමාජිකයින්ගේ ආර්ථික කටයුතුවල ක්‍රියාකාරීත්වය අධ්‍යනය කිරීමත්, සමිතිය තුළින් සාමාජිකයින්ට ප්‍රතිලාභ ලැබෙන ආකාරය සොයා බැලීමත් සහ සාමාජිකයින්ගේ ආර්ථික කටයුතුවල සහභාගීත්වයට ගැලපෙන ලෙස සමුපකාර සමිතිය ක්‍රියාකළයුතු ආකාරය හඳුනාගැනීමත් ද්විතීයික අරමුණු විය. සාහිත්‍ය විමර්ෂණයේදී අනාවරණය වූයේ සාමාජික ප්‍රතිලාභ සහ සාමාජික ආර්ථික කටයුතුවල සහභාගීත්වය අතර සැලකියයුතු සහසම්බන්ධයක් පවතින බවයි. පර්යේෂණයේ නියැදිය ලෙස බණ්ඩාරවෙල විවිධ සේවා සමුපකාර සමිතියේ ප්‍රාදේශික 42 ට අයත් සාමාජිකයින් 84 දෙනෙකු තෝරාගෙන සංවෘත ආන්ත ප්‍රශ්නාවලියක් මඟින් දත්ත රැස්කරන ලදි. දත්ත විශ්ලේෂණ ප්‍රතිඵල වලින් දැක්වූයේ බණ්ඩාරවෙල විවිධ සේවා සමුපකාර සමිතියේ සාමාජිකයින්ට ලබාදෙන මූල්‍ය ප්‍රතිලාභ, මූල්‍ය නොවන ප්‍රතිලාභ සහ සාමාජික ආර්ථික වර්ධනය අතර ඉතා ඉහළ ධනාත්මක සම්බන්ධතාවයක් පවතින බවයි. එනම්, පාරිභෝගික සේවා සැපයීම, කොටස්වලට ලාභාංශ ගෙවීම, ණය පහසුකම් ලබාදීම, සාමාජික නිෂ්පාදන සාධාරණ මිලට ලබාගැනීම ඇතුළු සාමාජිකයින්ට සෘජුව හා වක්‍රව ලැබෙන මූල්‍ය ප්‍රතිලාභ සාමාජිකයින්ගේ ආර්ථික වර්ධනය කෙරෙහි ධනාත්මකව බලපාන බවයි. ඒ අනුව, සමිතිය සාමාජිකයින් හට ප්‍රතිලාභ ලැබෙන සාමාජිකයින් සක්‍රීය කරන ක්‍රමවේදයක් සකස් කළයුතුව ඇත. සාමාජික ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කරන ආර්ථික ක්‍රියාකාරකම් වල නිරත වීම, ප්‍රාදේශික වෙළඳසැල් ජාලය පුළුල් කිරීම, සමිති සාමාජිකයින් තුළ සිටින පරිනත ව්‍යවසායකයින් සමිතියේ පාලනයට සම්බන්ධ කර ගනිමින් සමිතිය තම අරමුණු කරා මෙහෙයවීමට පර්යේෂක නිර්දේශ කරයි.

***මූල පද:** සක්‍රීය සාමාජිකයින්, ආර්ථික ක්‍රියාකාරකම්*

# සමුපකාර සමිතිවල ව්‍යාපාර සංවර්ධනය උදෙසා සමුපකාර නීතියේ ඇති බලපෑම පිළිබඳ ගුණාත්මක විග්‍රහය.

බී.එම්.ඒ මොහාන් ද සිල්වා[1]
දිනූෂ දිසානායක[2]

*1. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. වයඹ පළාත*
*2. සහකාර පර්යේෂක, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.*

මෙම පර්යේෂණය සමුපකාර සමිතිවල ව්‍යාපාර සංවර්ධනය උදෙසා සමුපකාර නීතියේ ඇති බලපෑම ගුණාත්මකව විග්‍රහ කිරීමේ අරමුණින් ගොඩනඟන ලදි. සමුපකාර සමිති වල ව්‍යාපාර සංවර්ධනයට සමුපකාර නීතියෙන් සිදුවන බලපෑම හඳුනාගැනීම, සමුපකාර සමිතිවල තීරණ ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීමට නෛතික ප්‍රතිකර්ම යෝජනා කිරීම, නෛතික විධිවිධාන වල ඇති ගැටළු සඳහා පවතින තතත්වය තුළ ප්‍රායෝගික ප්‍රතිකර්ම යෝජනා කිරීම, සමුපකාර හිතකාමී නවනීති පද්ධතියක් නිර්මාණය කිරිම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම මෙම අධ්‍යනයේ උප අරමුණු විය. ඉහත අරමුණු මුල්කර ගනිමින් සමුපකාර සමිති නායකයින්ට, විධායක නිළධාරීන්ට හා දෙපාර්තමේන්තු නිළධාරීන්ට යොමුකරන ලද ප්‍රශ්නාවලියක් මඟින් අදාළ දත්ත එකතුකර ගන්නා ලදි. සාහිත්‍යය විමර්ෂණය අනුව මෙරට තුළ මෙම පර්යේෂණ සන්දර්භයට අදාළව සිදුකරනු ලැබූ පර්යේෂණ ඉතා සීමිත මට්ටමක පැවති අතර ඉන්දියාවේ සහ ජපානයේ සමුපකාර ව්‍යවසායන් නියාමනය හා සංවර්ධනය සඳහා හිතකර වූ නෛතික පරිසරයක් ගොඩනඟා ඇති බව හෙළිදරව් විය. දත්ත එකතු කිරීමේ දී, පර්යේෂණ අරමුණු වලට අදාළව පරිමාණ ප්‍රශ්න 21 ක් ඉදිරිපත් කරනු ලැබූ අතර එම ප්‍රශ්න වලට ලද පිළිතුරු අනුව නියැඳියෙන් 53% ක ප්‍රමාණයක් සමුපකාර නීතිය සමුපකාර ව්‍යවසායන් සංවර්ධනයට සෘණාත්මක බලපෑමක් ඇතිකරන බවට එකඟවන අතර 47% ක් ඒ සඳහා එකඟ නොවීය. එමෙන්ම, ප්‍රශ්නාවලියේ එම කාරණයට අදාළව අසනු ලැබූ විවෘත ප්‍රශ්නයට ලබා දී ඇති පිළිතුරු අනුව බහුතරයක් ප්‍රකාශ කරන ලද්දේ වර්තමාන ආර්ථික, සාමාජීය පරිසරයට අනුකූලව සමුපකාර නීතිය වෙනස් වියයුතු බවයි. අධ්‍යනයේ සමස්ථය විග්‍රහ කිරීමේදී පැහැදිළි වූ කාරණාව වූයේ දැනට පවතින සමුපකාර නිතිය ව්‍යාපාර සංවර්ධනයට සෘණාත්මක බලපෑමක් ඇතිකරන බවයි. කාලයට අනුකූලව සමුපකාර නීතිය යාවත්කාලීන කිරීමටත්, සමුපකාරිකයින් හා ඒ සම්බන්ධ නිළධාරීන් සමුපකාර නීතිය පිළිබඳව දැනුවත් කළ යුතු බවත්, නීතිය ක්‍රියාත්මක කිරිමට කාර්යක්ෂම ක්‍රියාපටිපාටීන් සැකසියයුතු බවත් පර්යේෂක අධ්‍යනය අවසානයේදී නිර්දේශ කරනු ලබයි.

***මූල පද:*** *ව්‍යාපාර සංවර්ධනය, සමුපකාර නීතිය*

# ස්වශක්ති සමුපකාර සමිති අක්‍රීය වීමට බලපාන හේතු හඳුනාගැනීම පිළිබඳ සිද්ධි අධ්‍යනය.

එන්.එම්.එස් කුමාරි[1]
චරිත් අමරසේකර[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. වයඹ පළාත*
*2. සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.*

ස්වශක්ති සමුපකාර සමිති අක්‍රීය වීමට බලපාන හේතු මොනවාද යන්න පිළිබඳව අධ්‍යනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. මෙම සමිති මඟින් කොතෙක් දුරට මහජනතාවට සේවය සලසනවාද යන්න අධ්‍යනය කිරීමත්, ස්වශක්ති සමුපකාර සමිති ආරම්භ කිරීම තුළින් රජයේ අරමුණු කොතෙක් දුරට සාර්ථක කරගෙන තිබෙන්නේ ද යන්න අධ්‍යනය කිරීමත් මෙහි අනෙක් අරමුණු වේ. අධ්‍යනයේ අරමුණු සාර්ථක කරගැනිම සඳහා බිඳවැටුණු ස්වශක්ති සමුපකාර සමිති 05 ක් සහ ඒ වටා ඒකරාශී වී සිටින සාමාජිකයින් 25 දෙනෙකු සහභාගී කරගෙන සම්මුඛ සාකච්ජා, ලේඛණ සමාලෝචනය හා නිරීක්ෂණ ක්‍රමවේදය අනුව දත්ත එකතු කරගන්නා ලදි. නිවැරදි අරමුණකින් තොරව ග්‍රාමීය ජනයා හට ණය ලබාදීම හා බහුතර ණය කල්පසු වීම හා බොල් ණය වීම, ණය අයකර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් නොමැති වීම, සාමාජිකයා සමිතිය සමඟ මනා සම්බන්ධතාවයක් නොමැති විම, සමිතියේ නිළධාරීන් හට ගිණුම් හා සමුපකාර ක්‍රමය පිළිබඳව දැනුම අඩුකම, නිවැරදි විගණනයක් සිදුනොවීම, සමුපකාර සමිතියක් මඟින් සාමාජිකයාට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව අවබෝධයක් නොමැති වීම වැනි හේතු ස්වශක්ති සමුපකාර සමිති අක්‍රීය වීමට සෘජුවම බලපා ඇති බව අධ්‍යනයෙන් තහවුරු විය. සමිතිය තුළ විධිමත් පාලන ක්‍රමයක් පිහිටුවීම, මුදල් පරිහරණය සහ ණය ලබාදීම ක්‍රමවත් හා විධිමත් කිරීම, ස්වයං රැකියා ආරම්භ කරන සාමාජිකයින් හට ඒ සඳහා අවශ්‍ය කරන නිවැරදි තාක්ෂණික දැනුම ලබා දීම සඳහා සම්පත්දායකයින් සම්බන්ධ කර දීම, සමිති නිළධාරීන් හා දෙපාර්තමේන්තු නිළධාරීන් අතර මනා සන්නිවේදනයක් හා සම්බන්ධතාවයක් පවත්වාගෙනය යාම, සාමාජික ආකල්ප සංවර්ධනය කිරීම, සාමාජිකයාගේ ඉතිරි කිරීමේ පුරුද්ද වැඩිදියුණු කිරීම වැනි කාරණා ස්වශක්ති සමුපකාර සමිති බලගැන්වීම සඳහා පර්යේෂක විසින් අධ්‍යනය අවසානයේ නිර්දේශ කරන ලදි.

***මූල පද:** ස්වශක්ති සමුපකාර සමිති, රජයේ අරමුණු, අක්‍රමවත් ණය*

# පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති වර්තමානය වන විට පසුබෑමට ලක්වීමට හේතු විශ්ලේෂණය.

(වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති ආශ්‍රයෙන්)

එස්.එම්.සී ප්‍රියංගි පෙරේරා[1]
දිනූෂ දිසානායක[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. වයඹ පළාත*
*2. සහකාර පර්යේෂක, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.*

පොල් නිෂ්පාදන සමුපකාර සමිති වර්තමානයේ දී පසුබෑමකට ලක් වීමට බලපා ඇති හේතු හඳුනාගැනීම මෙම අධ්‍යනය තුළින් සිදුකර ඇත. පුත්තලම දිස්ත්‍රික්කයේ පොල් නිෂ්පාදන සමුපකාර සමිති 03 කට අදාළව සේවකයින් 230 දෙනෙකු අධ්‍යයනයේ සංගහනය ලෙස හඳුනාගන්නා ලද අතර ඉන් 144 දෙනෙකු ක්‍රෙජී සහ මෝර්ගන් වගුව ආශ්‍රයෙන් තෝරාගන්නා ලදි. දත්ත රැස් කිරීම සඳහා ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිතා කරන ලද අතර ඉහළ කළමනාකාරීත්වයේ පුද්ගලයන් 25 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයට ලක් කරන ලදී. ප්‍රතිශත භාවිතයෙන් පිළිතුරු විස්තර කර ඇත. දත්ත විශ්ලේෂණයේ ප්‍රතිඵල අනුව නියැදියෙන් වැඩි ප්‍රමාණයක් (53.3%) වයස අවුරුදු 40 ට වැඩි අය වන අතර ඔවුන් කාන්තාවන් විය. නියැදියෙන් 40% ක් ස්ථිර සේවකයන් වූ අතර ඉතිරි පිරිස තාවකාලික පදනමින් බඳවා ගන්නා ලදී. එසේම බහුතරයකගේ වැටුප රු.15,000-40,000/- (86%) අතර වන අතර අ.පො.ස උසස් පෙළින් 63% සමත් විය. පොල්, කොප්පරා, පොල්තෙල්, කොහු සහ පොල් ලෙලි ඉහත සමිතිවල ප්‍රධාන නිෂ්පාදන විය. විග්‍රහයට අනුව පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති පහත වැටීමට ප්‍රධාන හේතු වූයේ අස්වැන්න හිඟය, නව නිෂ්පාදන නොමැතිකම, පෞද්ගලික අංශයේ තරඟකාරිත්වය, අභ්‍යන්තර පාලනයේ දුර්වලතා, රාජ්‍ය අනුග්‍රහය නොමැතිකම සහ දේශපාලන මැදිහත්වීම් ය. නව නිෂ්පාදන කෙරෙහි අවධානය යොමු කිරීම, රාජ්‍ය අනුග්‍රහය ලබා ගැනීම, යහපත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම සහ අපනයනය ඉලක්ක කරගත් පුද්ගලික හවුල්කාරිත්වයක් ඇති කිරීම අධ්‍යයනයේ නිර්දේශ විය. පර්යේෂකයන් අනාගතය සඳහා නියැදිය වැඩි කර අනෙකුත් පළාත්වල අධ්‍යයනය කිරීමට යෝජනා කරයි.

***මූල පද:*** *පොල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිති, සමුපකාර ව්‍යාපාරය*

# සාමාජිකයින්ගේ ආර්ථිකය නඟාසිටුවීම සඳහා ධීවර සමුපකාර සමිතිවලින් ලබාදෙන දායකත්වය පිළිබඳ ගවේෂණාත්මක විශ්ලේෂණය.

(පුත්තලම දිස්ත්‍රික්කයේ ධීවර සමුපකාර සමිති ඇසුරෙන්)

කේ.ඒ.කේ සුමේධ[1]
දිනූෂ දිසානායක[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. වයඹ පළාත*
*2. සහකාර පර්යේෂක, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.*

සාමාජිකයින්ගේ ආර්ථිකය නඟාසිටුවීම සඳහා ධීවර සමුපකාර සමිතිවලින් ලබාදෙන දායකත්වය ගවේෂණාත්මකව අධ්‍යනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. සාහිත්‍යය විමර්ශණයේදී අනාවරණය වූයේ සාමාජිකයින්ගේ ආර්ථිකය නඟාසිටුවීම සඳහා ධීවර සමුපකාර සමිති වලින් සැලකියයුතු දායකත්වයක් ලබාදෙන බවයි. පර්යේෂණ නියැදිය ලෙස පුත්තලම දිස්ත්‍රික්කයේ ධීවර සමුපකාර සමිති 07 ක සාමාජිකයින් 300 දෙනෙකු පහසු නියැදීමේ ක්‍රමය මඟින් තෝරාගෙන ප්‍රශ්නාවලියක් ලබා දි දත්ත එකතුකර ගන්නා ලදි. දත්ත විශ්ලේෂණයට අනුව සමිති සාමාජිකයින් බහුතරයක් වයස අවුරුදු 36 ට වැඩි පුද්ගලයින් වීම හා බහුතරය පුරුෂයන් වීම, සාමාජිකයින් බහුතරයකගේ සේවාකාලය වසර 06 කට වඩා වැඩිවීම, බහුතර සාමාජිකයින්ගේ මාසික ආදායම රු.25000-5000 ත් අතර වීම සහ ණය වැඩිපුර ලබාගන්නේ ධීවර ආම්පන්න ලබාගැනිමට බව තහවුරු විය. සාමාජිකයින්ගේ ආර්ථිකය නගාසිටුවීම සඳහා ධීවර සමුපකාර සමිතිවලින් ධීවර පවුල්වල ස්වාමිපුරුෂයා හා භාර්යාව යන දෙපළම සාමාජිකත්වයට බඳවාගැනීම, කාන්තාවන්ට ස්වයං රැකියා පුහුණුව ලබාදීම මඟින් ධීවර පවුල්වල ආදායම ඉහළනංවා ගැනීමට දායකත්වය ලබාදීම, ධීවර පවුල්වල දරුවන්ගේ අධ්‍යාපනය සඳහා දායකත්වයක් ලබාදීම, ධීවර කටයුතු සඳහා නවතාක්ෂණය හඳුන්වා දීම, සේවක බඳවාගැනීම් වලදී නිවැරදි අයවළුන් බඳවා ගැනීම, සාමාජික අදහස් වලට ගරුකිරීම වැනි කටයුතු මඟින් පුත්තලම දිස්ත්‍රික්කයේ ධීවර සමුපකාර සමිති තම සාමාජිකයින්ගේ ආර්ථිකය නඟාසිටුවීම සඳහා සිදුකරන බව පර්යේෂණයෙන් හෙළිදරව් විය.

***මූල පද:*** *සාමාජිකයින්ගේ ආර්ථිකය නඟාසිටුවීම, ධීවර සමුපකාර සමිති*

# Impact of factors effecting non-performing loans in Covid Pandemic Situation.

K.D.P.C.S Perera[1]
Shanika Muddanayake[2]

*1. Cooperative development Department, Uva province*
*2. Lecturer, Sri Lanka Institute of Advanced Technologies*

Investigating the factors influencing non-performing loans in the context of the COVID-19 epidemic in Sri Lankan microfinance institutions, particularly the cooperative sector, is the goal of this study. The most crucial and significant component of a financial institution is its advances. Non-performing advances have a direct impact on a financial institution's assets. This study, which focuses on rural bank managers in Uva province who are struggling with non-performing loans, is based on one cooperative society and two bank cooperative societies. Economic growth, the percentage of the labor force that is not employed, inflation, and interest rates are the four independent variable elements that are examined in this study. The time frame covered the years 2019 through 2021. The department reports and the central bank reports provided the secondary data for this investigation. The results confirmed that there is a positive relationship between economic growth, unemployment, inflation and interest rates to the non-performing loans.

***Key Words:*** *Non-performing loans, Covid Pandemic Situation.*

# සමුපකාර ග්‍රාමීය බැංකු ව්‍යාපාරයේ තිරසාර පැවැත්මට විවිධ සේවා සමුපකාර සමිතියෙන් ග්‍රාමීය බැංකු වෙන්කර පවත්වාගෙන යාමේ වැදගත්කම පිළිබඳ කෙරෙන විශ්ලේෂණාත්මක අධ්‍යනය.

(මොණරාගල දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිති ඇසුරින්)

ජී.බී.ඩබ්.ටී බොතේජු[1]
කුමුදු රත්නසිරි[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. ඌව පළාත*
*2. සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.*

සමුපකාර ග්‍රාමීය බැංකු ව්‍යාපාරයේ තිරසාර පැවැත්මට විවිධ සේවා සමුපකාර සමිතියෙන් ග්‍රාමීය බැංකු වෙන්කර පවත්වාගෙන යාමේ වැදගත්කම පිළිබඳව මෙම අධ්‍යනය තුළින් සොයාබලා ඇත. මොණරාගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක ග්‍රාමීය බැංකු සමුපකාර සමිති ආශ්‍රිත 67 දෙනෙකුගේ නියැදියක් මේ සඳහා තෝරාගන්නා ලදි. එමෙන්ම, අදාළ විවිධ සේවා සමුපකාර සමිතිවල එක් ව්‍යාපාරික අංශයක් ලෙස ග්‍රාමීය බැංකු පවත්වාගෙන යනු ලබන සමිති දෙකක හා සමුපකාර ග්‍රාමීය බැංකු සමිති 03 හි විගණන වාර්තා මඟින් ආදායම් තතත්වය හා තෝරාගන්නා ලද වත්කම් හා වගකීම් කිහිපයක් මඟින් දත්ත විශ්ලේෂණය කර ඇත. දත්ත විශ්ලේෂණයේ ප්‍රතිඵල අනුව මහාසභා නියෝජිතයින්ගෙන් 74% ක්, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 76% ක් හා සේවකයින් 83% කගේ අදහස වී තිබුනේ විවිධ සේවා සමුපකාර සමිතියෙන් ග්‍රාමීය බැංකු වෙන්කර පවත්වාගෙන යාම සුදුසු බවයි. එමෙන්ම, විවිධ සේවා සමුපකාර සමිති බිහි වීමට පෙර වූ අතීතය හා සසඳා බැලීමේ දී අනාවරණය වූයේ ග්‍රාමීය බැංකු වෙන්කර පවත්වාගෙන යාම සුදුසු බවයි. දත්ත විශ්ලේෂණයෙන් අනාවරණය වූ තවත් කරුණක් වන්නේ විවිධ සේවා සමුපකාර සමිතියක එක් ව්‍යාපාරික අංශයක් ලෙස ග්‍රාමීය බැංකු අංශය පවත්වාගෙන යාමට වඩා විවිධ සේවා සමුපකාර සමිතියෙන් වෙන්කර වෙනමම සමුපකාර ග්‍රාමීය බැංකු සමිති ලෙස ස්ථාපිත කිරීමෙන් එම සමිති වල වත්කම් ඉහළයන බවයි. සමුපකාර ග්‍රාමීය බැංකු අංශය තිරසාරව පවත්වාගෙන යාම සඳහා ග්‍රාමීය බැංකු අංශය වෙනම පවත්වාගෙන යාම සුදුසුබව පර්යේෂක විසින් නිර්දේශ කරයි.

***මූල පද:** ග්‍රාමීය බැංකු, තිරසාර පැවැත්ම, වෙන්කර පවත්වාගෙන යාම*

# ලියාපදිංචිය අවලංගු කළ සමුපකාර සමිතිවල ඇවර කටයුතු ප්‍රමාද වීම පිළිබඳ ගවේෂණාත්මක අධ්‍යයනය.

නි.හි. පල්ලියගුරුගේ[1]
දිනූෂ දිසානායක[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. වයඹ පළාත*
*2. සහකාර පර්යේෂක, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.*

මෙම පර්යේෂණයේ අරමුණ වූයේ ලියාපදිංචිය අවලංගු කරන ලද සමුපකාර සමිතිවල ඇවර කටයුතු ප්‍රමාදවීමට හේතු හඳුනාගැනීමයි. ඇවර කටයුතු ප්‍රමාදවීම නිසා සමුපකාර දෙපාර්තමේන්තුවට සමිතියේ සාමාජිකයින්ට හා බාහිර පාර්ශවයන්ට වන බලපෑම හඳුනාගැනීම හා ඇවර කටයුතු ප්‍රමාදවීමෙන් හිමිකම්ලාභීන්ට ලැබෙන ප්‍රතිලාභ අවමවීම් හඳුනාගැනීම අධ්‍යයනයේ උප අරමුණු ලෙස ගොඩනගන ලදි. වයඹ පළාතේ දැනට ඇවර වෙමින් පවතින සමිති ආශ්‍රයෙන් හා ඇවර නිළධාරීන්ගෙන් මෙන්ම දෙපාර්තමේන්තු මාණ්ඩලික නිළධාරීන්ගෙන් ලබාගන්නා ලද තොරතුරු මත මෙන්ම සහභාගීත්ව නිරීක්ෂණය මඟින් හා ප්‍රශ්නාවලියක් මඟින් අධ්‍යයනයේ දත්ත එකතුකර ගන්නා ලදි. දත්ත විශ්ලේෂණයෙන් ගම්‍ය වූ කරුණු වන්නේ ඇවරකරුවන් පත්කිරීමේදී චක්‍රලේඛ වලින් නියමකර ඇති සුදුසුකම් මත පත්කිරීම සිදුවිය යුතු බවයි. ඇවර චක්‍රලේඛ හා උපදෙස් පත්‍රිකාවලට අනුව ඇවර නිළධාරීන් පත්කර ඇති බවට නියැදියෙන් 63% ක් එකඟ නොවූ අතර නිත්‍ය ඇවරකරුවන්ට පමණක් ඇවර ලබා දී ඇත යන ප්‍රශ්නයේ දී 82% ක් දැඩිලෙස එකඟ නොවීය. මේ අනුව පැහැදිලි වන්නේ නිත්‍ය ඇවරකරුවන් නොවන නිළධාරීන් සඳහා ඇවර ලබාදීම වැඩි වශයෙන් සිදු වී ඇති බවයි. ඇවර සම්බන්ධව ප්‍රමාණවත් පරිදි නිළධාරීන්ට පුහුණුව නොලැබෙන බවද අනාවරණය විය. ඇවරකරුවෙකු පත් වී දින 21 ක් ඇතුළත පොත්පත් භාරනොදෙන බව 61% ක් ප්‍රකාශ කරන ලදි. පර්යේෂණ නිර්දේශ ලෙස අක්‍රීය සමිතියක 50 (අ) වාර්තාව පිළියෙල කිරීම ඉතා නිවැරදිව සිදුවියයුතු බව හා එම වාර්තාව පිළියෙල කළ වහාම ඇවර නිළධාරියෙකු පත්කිරීම සිදුකළ යුතුබවත් නිත්‍ය ඇවරකරුවන්ට පමණක් ඇවර කටයුතු භාර දීම සුදුසු බවත් නිත්‍ය ඇවරකරුවන්ට ඉලක්ක හා දිරිදීමනා ක්‍රමයක් ලබා දී ඇවරකටයුතු කාර්යක්ෂම කිරීමටත් පර්යේෂක නිර්දේශ කරයි.

***මූල පද:** ලියාපදිංචිය අවලංගු කළ, ඇවර කටයුතු*

# සමුපකාර සමිතියක දුර්වල ණය කළමනාකරණය ආයතන යහපාලනයට කරනු ලබන බලපෑම.

එස්.කේ ප්‍රේමරත්න[1]
අජිත් අමරකීර්ති[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. වයඹ පළාත*
*2. අධ්‍යක්ෂ (අධ්‍යන හා සංවර්ධන), ජාතික සමුපකාර සංවර්ධන ආයතනය*

මෙම පර්යේෂණයේ අරමුණ වූයේ දුර්වල ණය කළමනාකරණය ආයතන යහපාලනයට කරනු ලබන බලපෑම සොයාබැලීමයි. ද්විතීයික අරමුණ වූයේ කළමනාකරණ අඩුපාඩු හඳුනාගැනීම හා ණය කළමනාකරණය කාර්යක්ෂම කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමත්ය. මෙහිදී, වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිති 02 ක් හා සමුපකාර ණයදෙන සමිති 03 ක් ලෙස සමිති 05 ක 2021 දක්වා ආසන්න වසර 03ක ණය ලබාගත් ණයකරුවන් ඇසුරින් තොරතුරු සොයාබලන ලදි. සාහිත්‍ය විමර්ෂණයේදී හෙළිවූයේ දුර්වල ණය කළමනාකරණය හා යහපාලනය අතර සැලකියයුතු සබඳතාවයක් පවතින බවයි. පර්යේෂණ සංගහණය ලෙස ණයකරුවන් 370 ක් තෝරාගෙන ඉන් නියැඳිය ලෙස අහඹු ලෙස තෝරාගත් පුද්ගලයන් 100 සඳහා සංවෘත ආන්ත ප්‍රශ්නාවලියක් යොමු කිරිමෙන් දත්ත රැස්කර ගන්නා ලදි. ප්‍රශ්නාවලි 100 ඇසුරින් 87 ක් සඳහා ප්‍රතිචාර දක්වා තිබුනු අතර දත්ත විශ්ලේෂණය තුළින් තහවුරු වූයේ දුර්වල ණය කළමනාකරණය හා ආයතන යහපාලනය අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පවතින බවයි. ණය මුදාහැරීමට ප්‍රථම ණය බැඳියාව හා ආපසු ගෙවීම පිළිබඳව සොයා බැලීමටත්, ආයතනය හා ණයකරු අතර විශ්වාසය ගොඩනගා ගතහැකි ක්‍රමවේදයන් දියුණුකර ගැනීමටත්, ණයකරුවන් සම්බන්ධව යාවත්කාලීන වූ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමටත් විගණනය කාර්යක්ෂම කිරීමටත් අධ්‍යනය අවසානයේ පර්යේෂක නිර්දේශ කරයි.

***මූල පද:*** *දුර්වල ණය කළමනාකරණය, ආයතන යහපාලනය*

# සංවිධානයක සේවක රැකියා තෘප්තිය සඳහා බලපාන සාධක හඳුනාගැනීම.

(ඌව පළාතේ විවිධ සේවා සමුපකාර සමිති තුනක ග්‍රාමීය බැංකු ලිපිකරුවන් ඇසුරින්)


එම්.ජී චන්ද්‍රසිරි[1]
ශානිකා මුදන්නායක[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. ඌව පළාත*
*2. කථිකාචාර්ය, උසස් තාක්ෂණික ආයතනය, මහනුවර.*



සංවිධානයක සේවක රැකියා තෘප්තිය සඳහා බලපාන සාධක හඳුනාගැනීම අරමුණු කර ගත් මෙම පර්යේෂණයෙන් මූල්‍ය ප්‍රතිලාභ, සේවක පුහුණුව, කළමනාකරණ තීරණ, සේවක බලගැන්වීම යන සාධක සේවක රැකියා තෘප්තිය කෙරෙහි කොතරම් බලපෑමක් ඇති කරයිද යන්න පරික්ෂාකර ඇත. ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිති තුනක ග්‍රාමීය බැංකු ශාඛා 47 ක සේවය කරන ලිපිකරුවන් ඇසුරින් අධ්‍යනයේ අරමුණ ඉටුකර ගැනිමට උත්සහ දරා ඇත. සාහිත්‍ය විමර්ෂණයේදී අනාවරණය වූයේ සේවක රැකියා තෘප්තිය සඳහා සේවක ප්‍රතිලාභ, සේවක පුහුණුව, කළමනාකරණ තීරණ, සේවක බලගැන්වීම යන සාධක අතර සැලකියයුතු සහසම්බන්ධතාවයක් පවතින බවයි. පර්යේෂණයේ නියැදිය වශයෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය බැංකු ශාඛා 47 ක ලිපිකරුවන් 40 දෙනෙකු ස්ථරීකෘත නියැදි ක්‍රමය අනුව තෝරාගෙන ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කර දත්ත රැස්කර ගන්නා ලදි. ප්‍රශ්නාවලියේ විචල්‍යයන්ගේ විශ්වාසනීයත්වය ක්‍රොන්බැක් ඇල්ෆා (Cronbach's alpha) සංගුණකය මඟින් තහවුරුකර ගන්නා ලදි. සංඛ්‍යාත්මක ගණනය කිරීම් මඟින් දත්ත විශ්ලේෂණය කළ අතර පර්යේෂණ ප්‍රතිඵල අනුව ග්‍රාමීය බැංකු ලිපිකරුවන්ගේ රැකියා තෘප්තියට බලපාන සාධක වන මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ රැකියා තෘප්තිය සඳහා 0.939 ක ප්‍රභල සහසම්බන්ධයක් දක්වන බව තහවුරු විය. ඒ අනුව, සේවක වැටුප්, දිරි දීමනා, ප්‍රසාද දීමනා, වෛද්‍යාධාර, අතිකාල දීමනා හා ගමන් වියදම් දීමනා ඇතුළු සේවකයින්ට දෙනු ලබන මූල්‍ය ප්‍රතිලාභ, නියමිත උසස් වීම් ක්‍රම හඳුන්වා දීම, දක්ෂතාවයන් ඇති පුද්ගලයින්ට ඉදිරියට යාමට අවස්ථාව ලබාදීම වැනි මූල්‍ය නොවන ප්‍රතිලාභ ද සේවක රැකියා තෘප්තිය කෙරෙහි ප්‍රභලව බලපාන බව හෙළිදරව් විය. එමෙන්ම, සේවක රැකියා තෘප්තිය හා සේවක පුහුණුව අතර 0.828 ක ධන සම්බන්ධතාවයක් පැවතුනි. ඒ අනුව පැහැදිලි වන්නේ මෙම සේවකයන් නිරතුරු පුහුණු වීම් අවශ්‍යතාවයෙන් පෙළෙන බවයි.

රාජකාරී ජීවිතයේදී ඔවුනට එම කටයුතු පහසුවෙන් කරගෙන යාමට නිරන්තර පුහුණුව ඔවුන් අපේක්ෂා කරන බවයි. නව තාක්ෂණික දැනුම, අලුත් යන්ත්‍රෝපකරණ භාවිතය පිළිබඳව ඔවුන් නිරන්තරයෙන් දැනුවත් වියයුතුය. රැකියා තෘප්තිය කෙරෙහි බලපානු ලබන මීලඟ සාධකය වශයෙන් කළමනාකරණ තීරණ ගැනීම හා රැකියා තෘප්තිය අතර 0.828 ක සම්බන්ධතාවයක් පවතී. ඒ අනුව, සෑම විටම නිවැරදි තීරණ ගැනීමට, සේවකයින් බඳවා ගැනීමේ සිට ඔවුන්ගේ උසස් වීම් කටයුතු දක්වා සෑම විටම නිවැරදි තීරණ ගැනීම සඳහාම කළමනාකරු වගබලා ගතයුතු බවද, නිරන්තර සේවක ගැටළු වලට අවධානය යොමුකිරීම නිසා සේවක රැකියා තෘප්තිය වැඩි වේ. ඒ අනුව නිවැරදි කළමනාකරණ තීරණ සෑම විටම සේවක රැකියා තෘප්තිය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇතිකරයි. අවසාන වශයෙන් සේවක බලගැන්වීම හා සේවක රැකියා තෘප්තිය අතර 0.762 ක ධනාත්මක සහසම්බන්ධයක් පවතින බව ඔප්පු විය. සමාන්තර සේවකයින් අගය කිරීම, ඔවුන්ගේ කාර්යයන් පිළිබඳව ප්‍රසංශා කිරිම, අවශ්‍ය භෞතික පහසුකම් ලබාදීම මෙන්ම තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ඔවුන්ගේ අදහස් විමසිම ආදිය කරුණු මඟින් සියසේවක බලගැන්වීම සිදුකළ හැකිය. රැකියා තෘප්තිය කෙරෙහි බලපාන සාධක අනුව ඉහත නිගමන හා නිර්දේශ ඉදිරිපත් කළහැකිය. සේවකයින්ට නියමිත පරිදි ප්‍රතිලාභ ගෙවීම, රැකියා පුහුණු කටයුතු සිදුකිරීම, නිවැරදි කළමනාකරණ තීරණ ගැනීම හා සේවකයින් නිරතුරු බලගැන්වීමේ ක්‍රම මඟින් සේවකයින්ගේ රැකියා තෘප්තිය වර්ධනය කරගත හැකි බව ඉහත පර්යේෂණයේ ප්‍රතිඵල මඟින් පැහැදිළි වේ.

*මූල පද: රැකියා තෘප්තිය, සේවක ප්‍රතිලාභ, සේවක පුහුණුව, කළමනාකරණ තීරණ, සේවක බලගැන්වීම.*

# විවිධ සේවා සමුපකාර සමිතිවල අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරිමට එහි පාලන ක්‍රමයන් තුළින් ඇතිවන බලපෑම.

(බස්නාහිර පළාත් විවිධ සේවා සමුපකාර සමිති ඇසුරින්)

එච්.වයි රොසායුරු[1]
නන්දන බී. හපුආරච්චි[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. බස්නාහිර.*
*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය*

මෙම පර්යේෂණයේ අරමුණ වූයේ විවිධ සේවා සමුපකාර සමිතිවල අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට එහි පාලන ක්‍රමයන් තුළින් ඇතිවන බලපෑම සොයා බැලිමයි. පාලන ක්‍රම ක්‍රියාත්මක වීමේදී මතුවන ගැටළු බස්නාහිර පළාතේ ක්‍රියාත්මක වන විවිධ සේවා සමුපකාර සමිති ඇසුරින් සොයා බැලීම මෙම අධ්‍යනයේ ද්විතීයික අරමුණ විය. සාහිත්‍ය විමර්ෂණයේදී අනාවරණය වූයේ ආයතනයක අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට එම ආයතනය හඳුන්වා දී ඇති පාලන ක්‍රම හා ඒවායේ ක්‍රියාත්මක වීම අතර ඍජු සම්බන්ධයක් පවතින බවයි. පර්යේෂණ නියැදිය ලෙස බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක විවිධ සේවා සමුපකාර සමිති 38 හි කළමනාකාර සනයේ නිළධාරීන් 90 දෙනෙකු තෝරාගන්නා ලද අතර ඔවුන් වෙත සංවෘත ප්‍රශ්නාවලියක් ලබා දී දත්ත එකතුකර ගන්නා ලදි. සංඛ්‍යානමය ගණනය කිරීම් මඟින් දත්ත විශ්ලේෂණය කළ අතර ප්‍රතිඵල අනුව පැහැදිලි වූයේ බස්නාහිර පළාතේ විවිධ සේවා සමුපකාර සමිතිවල අභ්‍යන්තර පාලන ක්‍රම හා අභ්‍යන්තර පාලන පද්ධතිය අතර 0.785 ක ප්‍රභල ධන සම්බන්ධතාවයක් පෙන්නුම් කරන බවයි. එනම් කළමනාකරණ පාලනය, වැඩ බෙදීමේ ක්‍රියාවලිය, ගිණුම්කරණ පාලනය, ආරක්ෂණ ක්‍රම හා අභ්‍යන්තර විගණනයෙන් ආයතනයේ පාලන පද්ධතිය ශක්තිමත් වන බවයි. එසේම, විවිධ සේවා සමුපකාර සමිති වල පාලන කටයුතු සම්බන්ධයෙන් බාහිර ආයතන මඟින් කෙරෙන පාලනය තුළින් ද අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරිමට ධනාත්මකව බලපාන බව 0.804 ක ප්‍රභල ධන සහසම්බන්ධතාවයෙන් තහවුරු විය. එලෙසම, අභ්‍යන්තර පාලන ක්‍රම වලට වඩා බාහිර පාලන ක්‍රම මඟින් සමිතිවල අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් වන බවද පර්යේෂණයෙන් තහවුරු විය. සමිතිවල පවතින අභ්‍යන්තර පාලන ක්‍රමවල දුර්වලතා මඟහැර ගැනීම, නව පාලන ක්‍රම හඳුන්වා දීම, බාහිර ආයතන මඟින් සිදුකරන පාලන ක්‍රම වලට අනුගත වීම තුළින් ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කරගත හැකි බව පර්යේෂණය තුළින් පැහැදිළි වේ.

***මූල පද:** අභ්‍යන්තර පාලන පද්ධතිය, පාලන ක්‍රමයන්*

# ග්‍රාමීය ජනතාව විසින් උකසට තබන ලද වත්කම් බේරා නොගැනීමට හේතු.

(වයඹ පළාත් ස.ණ.ස සමිති හා විවිධ සේවා සමුපකාර සමිතිවල ණයකරුවන් ඇසුරින්)

ඩී.ඒ හුලංගමුව[1]
නන්දන බී. හපුආරච්චි[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. වයඹ පළාත.*
*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය*

ග්‍රාමීය ජනතාව විසින් උකසට තබන ලද වත්කම් බේරා නොගැනීමට හේතු හඳුනාගැනීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වූ අතර ද්විතීයික අරමුණු ලෙස උකසට තබන ලද වත්කම් බේරා ගැනීමට නොහැකි වීම නිසා සමිතියට හා ණයකරුවන්ට මුහුණ පෑමට සිදුවී ඇති ගැටළු හඳුනා ගැනීම හා එම ගැටළු විසඳාගැනීම සඳහා යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීම හඳුනාගන්නා ලදි. මෙහි නියැදිය වශයෙන් වයඹ පළාතේ කුරුණෑගල සමුපකාර සංවර්ධන සහකාර කොට්ඨාසයේ රිදීගම, කුරුණෑගල හා මාවතගම යන විවිධ සේවා සමුපකාර සමිති වලින් තෝරාගත් පුද්ගලයින් 72 දෙනෙකු පහසු නියැදිමේ ක්‍රමයට තෝරාගෙන ග්‍රාමීය ජනතාව විසින් උකසට තබන ලද වත්කම් බේරා නොගැනීමට හේතු පිළිබඳව සකස් කරන ලද ප්‍රශ්නාවලියක් මඟින් දත්ත රැස් කෙරිණි. ප්‍රශ්නාවලියේ විචලායයන්ගේ විශ්ලේෂණ ක්‍රියාපටිපාටිය සඳහා ගුණාත්මක ක්‍රමය තෝරාගෙන ඇත. ඒ අනුව, ග්‍රාමීය බැංකුවල පවත්නා නීතිරීති හා රෙගුලාසි සම්බන්ධව ගනුදෙණුකරුවන්ගේ නොදැනුවත්කම මූලික ගැටළුව වශයෙන්ද, බැංකුවෙන් ණය ප්‍රදානය කිරීමේදී පියවර ක්‍රමයට ප්‍රදානය කළයුතු බවද දක්වා තිබේ. තවද, ග්‍රාමීය ජනයාගේ සුරැකුම් සුරක්ෂිත කිරීම සඳහා ලබාගන්නා වූ ණය රක්ෂණාවරණයකට යටත්කොට ප්‍රදානය කිරීම සුදුසු බවත් සඳහන්කර ඇත. එබැවින් ග්‍රාමීය ජනතාවගේ උකසට තබන ලද වත්කම් බේරා නොගැනිමට ගණුදෙණුකරුවා, බැංකුව පමණක් නොව බාහිර සාධකද බලපාන බව පර්යේෂණ ප්‍රතිඵල අනුව පැහැදිලි වන අතර ගණුදෙනුකරුවා දැනුවත් කර බැංකුව විසින් ඔවුන් ආරක්ෂාකිරීම සඳහා පර්යේෂණයේ සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීමෙන් ග්‍රාමීය ජනතාවගේ දේපල සුරක්ෂිත කිරීමට හැකියාව ඇති බව අධ්‍යනයෙන් පැහැදිලි වේ.

***මූල පද:*** *උකසට තබන ලද වත්කම්, බේරා නොගැනීම, ග්‍රාමීය ජනතාව*

# සමුපකාර ව්‍යවසායකයින් ගොඩනැංවීමට ග්‍රාමීය බැංකු ණය උපයෝජනය

(ඌව පළාත් විවිධ සේවා සමුපකාර සමිති ආශ්‍රයෙන් සිදුකරනු ලබන ගුණාත්මක විග්‍රහය)

ඩී.එස් රත්නායක[1]
අජිත් අමරකීර්ති[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. වයඹ පළාත.*
*2. අධ්‍යක්ෂ (අධ්‍යන හා සංවර්ධන), ජාතික සමුපකාර සංවර්ධන ආයතනය*

සමුපකාර ව්‍යවසායකයින් ගොඩනැංවීමට ග්‍රාමීය බැංකු ණය උපයෝජනය වී ඇති ආකාරය හඳුනාගැනීම මෙම පර්යේෂණයේ අරමුණ විය. සමුපකාර ව්‍යවසායකත්ව ණයලබා දීමේ ක්‍රියාවලිය පූර්ව පියවර අධ්‍යනය හා දුර්වලතා හඳුනාගැනීම, විවිධ සේවා සමිති මට්ටමින් ව්‍යවසායකයන් සඳහා ඉටුකළ යුතු කාර්යභාරය හඳුනාගැනිම, ග්‍රාමීය බැංකු ණය සේවා වඩාත් ඵලදායී ලෙස භාවිතා කළයුතු ආකාරය අධ්‍යනය හා කල්පසු ණය අවම කරගැනිමේ ක්‍රමවේද හඳුනාගැනීම මෙහි උප අරමුණු විය. අධ්‍යනයේ නියැඳිය ලෙස ඌව පළාතේ විවිධ සේවා සමුපකාර සමිති තුනකට අයත් ණය ලබාගත් ව්‍යවසායකයින් 118 දෙනෙකු තෝරාගන්නා ලදි. ප්‍රශ්නාවලියක් මඟින් දත්ත එකතු කිරීම සිදුකරනු ලැබූ අතර නියැඳියේ බහුතරය ස්ත්‍රී විය. බහුතරයක් ව්‍යවසායකයින් අ.පො.ස සා.පෙළ දක්වා (43.22%) අධ්‍යාපනය ලබාඇති අතර අ.පො.ස උ.පෙළ දක්වා 38% ක් අධ්‍යාපනය ලබා තිබුනි. දත්ත විශ්ලේෂණයට අනුව නියැඳියේ බහුතරයකට තිබී ඇත්තේ වසර දෙකකට වඩා අඩු ව්‍යාපාරික පළපුරුද්දකි. නියැඳියේ බහුතරයකට තමා සිදුකරන ව්‍යාපාරය පිළිබඳ පැහැදිලි දැක්මක් හා දැනුමක් නොතිබිණි. ව්‍යවසායකගේ වයස සාර්ථක ණය උපයෝජනයක් සඳහා සෘජුවම බලපානු ලබයි යන්නට බහුතරයක් මධ්‍යස්ථව පිළිතුරු ලබාදී තිබුණි. ව්‍යවසායකයාගේ ස්ත්‍රී පුරුෂ බව සාර්ථක ව්‍යවසායකත්වයක් උදෙසා බලපානු ලබයි යන්නට 47% ක් එකඟ නොවූ අතර 39% ක් මධ්‍යස්ථ විය. ව්‍යවසායකත්වය උදෙසා ඇති කැමැත්ත සාර්ථක ව්‍යවසායකත්වයක් උදෙසා බලපානු ලබයි යන්නට 76% ක් එකඟ විය. ව්‍යවසායකයාගේ අධ්‍යාපන මට්ටම සාර්ථක ව්‍යවසායක් නිර්මාණය උදෙසා සෘජුවම බලපානු ඇත යන්නට බහුතරයක් මධ්‍යස්ථ විය. ව්‍යවසායේ ප්‍රමාණය (Size) සාර්ථක ව්‍යවසායක් නිර්මාණය උදෙසා සෘජුවම බලපානු ඇත යන්නට ද බහුතරයක් මධ්‍යස්ථව පිළිතුරු ලබා දී තිබූ අතර 22% ක් ඊට තදින් එකඟ විය.

තමා ව්‍යාපාරය සිදුකරන ව්‍යවසාය අංශය සාර්ථක ව්‍යවසායක් නිර්මාණය කිරිමට සෘජුවම බලපායි යන්නට බහුතරයක් එකඟ වූ අතර දැනට ව්‍යවසායේ/ ව්‍යාපාරයේ කාලය ණය උපයෝජනය සඳහා බලපානු ලබයි යන්නට ද මධ්‍යස්ථ පිළිතුරු ලබාදී තිබුණි. ව්‍යාපාරයේ ගිණුම්කරණය හා වාර්තාකරණය සාර්ථක ණය උපයෝජනයක් සඳහා බලපානු ලබයි යන්නට 70% ක් එකඟ විය. ව්‍යවසායක් විධිමත් ලෙස ලියාපදිංචි කර තිබීම ණය උපයෝජනයක් සඳහා බලපානු ලබයි යන්නට ද බහුතරයක් එකඟ වී තිබුණි. ව්‍යාපාර සැලැස්ම සාර්ථක ණය උපයෝජනයක් සඳහා බලපායි, ව්‍යාපාරය ස්ථානගත වීම සාර්ථක ණය උපයෝජනයක් සඳහා බලපායි, අයදුම්කරු විසින් ඉල්ලා ඇති ණය මුදලේ පොලී ප්‍රතිශතය සාර්ථක ණය උපයෝජනයක් සඳහා බලපානු ලබයි සහ ණය ඉල්ලුම්කරුට ණය මුදල නිකුත් කිරීමේ ක්‍රමවේදය සාර්ථක ණය උපයෝජනයක් සඳහා බලපානු ලබයි යන්නට බහුතරයක් එකඟ වී තිබුණි. එමෙන්ම, ණය ආපසු ගෙවීමේ කාලය සාර්ථක ණය උපයෝජනයක් සඳහා බලපානු ලබයි යන්නට මෙන්ම ණය මුදලක් කඩිනමින් අනුමත වීම සාර්ථක ණය උපයෝජනයක් සඳහා බලපානු ලබයි යන්නටත් තදින් එකඟ වී තිබුණි. ණය නිකුත් කිරීමේ දී සරල ලේඛණකරණය සාර්ථක ණය උපයෝජනයක් සඳහා බලපානු ලබයි යන්නට හා ණය මුදලක් නිකුත් කළ පසු බැංකුව මඟින් සිදුකරන පසු ඇගයීම සාර්ථක ණය උපයෝජනයක් සඳහා බලපානු ලබයි යන්නට බහුතරයක් දෙනා තදින්ම එකඟ වී තිබුණි. ව්‍යවසායේ ප්‍රමාණය සහ ව්‍යවසාය අංශය සැලකිල්ලට ගෙන ඉදිරියේදී ණය නිකුත් කිරීමටත්, ව්‍යවසායකයින්ට ගැලපෙන නව ණයක්‍රම හඳුන්වා දිමටත්, ණය නිකුත් කිරීමේදී ව්‍යාපාරිකයාගේ ගිණුම් ක්‍රමය පිළිබඳව සැලකිල්ලක් දැක්වීමටත් සරල හා කාර්යක්ෂම ණය ක්‍රමයක් ගොඩනැඟිමටත් පර්යේෂක අධ්‍යනය අවසානයේ දී නිර්දේශ කරයි.

*මූල පද: සමුපකාර ව්‍යවසායකයින්, ග්‍රාමීය බැංකු ණය*

# සමුපකාර සමිතිවල ගිණුම් හා මෙහෙයුම් කළමනාකරණය සඳහා පරිගණක මෘදුකාංග යොදාගැනීමට පවතින බාධා හඳුනාගැනීම.

(වයඹ පළාතේ ක්‍රියාත්මක විවිධ සේවා සමුපකාර සමිති වල ග්‍රාමීය බැංකු, වෙළඳසැල් හා ව්‍යාපාරික අංශ ඇසුරින්.)

එච්.ඒ. හෙට්ටිආරච්චි[1]
කුමුදු රත්නසිරි[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. වයඹ පළාත.*
*2. සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය*

වයඹ පළාතේ විවිධ සේවා සමුපකාර සමිතිවල ග්‍රාමීය බැංකු ඇතුළු ව්‍යාපාරික අංශවල කටයුතු සඳහා පරිසනක මෘදුකාංග යොදාගැනීමට වසර දහයකට අධික කාලයක සිට මේ දක්වා විවිධ උත්සහයන් දරනු ලබන නමුත් මෙතෙක් එම පරිසනක ක්‍රියාවලිය සාර්ථකව හා අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකිවී නැත. මෙම පර්යේෂණයේ අරමුණ වූයේ එසේ පරිසනක මෘදුකාංග සමුපකාර සමිති වලට හඳුන්වාදීමේ දී හා අඛණ්ඩව පවත්වාගෙන යාමේ දී පැනනැගී ඇති ගැටළු හඳුනාගැනීම හා එම ගැටළු සඳහා විසඳුම් ලබාදිය හැක්කේ කෙසේද යන්න හඳුනාගැනීමයි. උප අරමුණු වූවේ සමුපකාර සමිති වල සාමාජිකයින්ට, ගණුදෙණුකරුවන්ට, උනන්දුවක් දක්වන රාජ්‍ය හා අනෙකුත් ආයතන වලට වන බලපෑම හඳුනාගැනීමත්, මේ නිසා සිදුවන පිරිවැය හානි හඳුනාගැනීමත්ය. අධ්‍යනයේදී, ප්‍රශ්නාවලි, සහභාගීත්ව නිරීක්ෂණ හා සම්මුඛ සාකච්ඡා උපයෝගී කරගෙන ඇත. සාහිත්‍ය විමර්ශනයට අනුව පෙනීයන කාරණයක් වන්නේ මෙම ප්‍රස්තුතය පිළිබඳ සිදුකර ඇති විධිමත් ආකාරයේ පූර්ව පර්යේෂණ හා වෙනත් මට්ටමේ අධ්‍යයන ඉතාම සීමිත බවයි. වයඹ පළාත තුල ක්‍රියාත්මක වන ව්‍යාපාර ඒකක නියෝජනය කරන කාර්යමණ්ඩලය සමස්ථ සංගහණය ලෙස ගනිමින් ඉන් පුද්ගලයන් 341 ක් පහසු නියැදීමේ ක්‍රමයට ලබාගනිමින් දත්ත එකතුකර ගන්නා ලදි. සමුපකාර ග්‍රාමීය බැංකු ශාඛා, වෙළඳසැල්, ඉන්ධනහල්, ප්‍රධාන කාර්යාලය ඇතුළු ව්‍යාපාර ඒකක වල පුද්ගලයින් මෙම නියැදිය නියෝජනය කරන ලදි. දත්ත විශ්ලේෂණය ඔස්සේ ගම්‍යවන ප්‍රධාන කාරණය වන්නේ සමුපකාර සමිතිවල කටයුතු පරිගණක ගතකර පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය හා එහි ප්‍රයෝජන පිළිබඳව පරිපාලනයේ, ඉහළ විධායක මට්ටමේ හා මෙහෙයුම් මට්ටමේ වැඩිපිරිසක් අතර දැනුම හා ආකල්ප අතින් සාධනීය මට්ටමක නොමැති බවයි. එමෙන්ම, පරිගණක භාවිතය පිළිබඳ තාක්ෂණික දැනුම හා පුහුණුව සීමිත වීමද, සමුපකාර සමිති සඳහා මෘදුකාංග සැපයීමට පිළිගත් මෘදුකාංග සපයන ආයතන විශ්වාසනීය ලෙස හා සාධාරණ ලෙස සේවා සැපයීමට ඉදිරිපත් නොවීමද බාධාවක් වී ඇත.

මෘදුකාංග තෝරාගැනීමේ දී ඉහළ කළමනාකාරීත්වය නිසි සැලකිල්ලක් නොදැක්වීම ද, එම මෘදුකාංග තෝරාගැනීමේ ක්‍රියාවලිය සඳහා සමිතියේ සුදුසු නිළධාරීන් සහභාගී කර නොගැනීම ද ගැටළුවක් ලෙස හඳුනාගෙන ඇත. එමෙන්ම, සමිතියේ පරිඝනක තොරතුරු පද්ධතිය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සුදුසුකම් ලත් තොරතුරු තාක්ෂණ නිළධාරියෙකුගේ සේවය ලබා නොගැනීම ද, සමිතියේ සමස්ථ තොරතුරු තාක්ෂණ සැලැස්මක් සකස්කර කාර්යමණ්ඩලය දැනුවත් කර ඒ සඳහා සහභාගීකර ගැනීමේ අඛණ්ඩ වැඩපිළිවෙලක් නොතිබීම ද, සමුපකාර සමිතිවල පරිගණක මෘදුකාංග ක්‍රියාත්මක කිරීමේ දී අසාර්ථක වීමට බලපා ඇති බව තහවුරු විය. සමුපකාර සමිති වල මෘදුකාංග ස්ථාපිත කිරීමෙන් පසු සේවකයින්ට නිවැරදි පුහුණුවක් වරින් වර ලබා දීමටත්, සේවකයින් බඳවාගැනීමේ දී හා යෙදවීමේ දී පරිගණක සාක්ෂරතාවයකින් යුත් පිරිසක් තෝරාගැනීම, සමිතියට තොරතුරු තාක්ෂණ සැලැස්මක් සකස් කිරීම හා කාර්ය මණ්ඩලය ඒ සඳහා පුහුණු කර අඛණ්ඩව සැලැස්ම ක්‍රියාත්මක කිරීම, මෘදුකාංග ගිවිසුමට එළැඹීමට ප්‍රථම සමිතියේ අවශ්‍යතාවයට එම මෘදුකාංගය ගැලපේද යන්න සලකා බැලීම, විධිමත් පදනමකින් මෘදුකාංග සඳහා සේවාගාස්තු අයකිරීමේ ක්‍රමවේදයක් සැකසීමටත්, සමුපකාර දෙපාර්තමේන්තුව මැදිහත්ව සේවාගාස්තු පිළිබඳ නියාමනයක් කළයුතු බවත්, සමුපකාර සමිති සඳහා එක් පොදු මෘදුකාංගයක් හඳුන්වාදීමටත් අධ්‍යනය අවසානයේදී පර්යේෂක නිර්දේශ කරයි.

*මූල පද: පරිගණක මෘදුකාංග, ගිණුම් හා මෙහෙයුම් කළමනාකරණය*

# විවිධ සේවා සමුපකාර සමිති අකාර්යක්ෂමතාවයට තීරණ ගැනීමේ ක්‍රියාවලියේ බලපෑම.

(ඌව පළාත් විවිධ සේවා සමුපකාර සමිති ආශ්‍රයෙන් සිදුකරනු ලබන ගුණාත්මක විග්‍රහය)


වී.මූ.වා දිනේෂ්[1]
දිනූෂ දිසානායක[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. ඌව පළාත*
*2. සහකාර පර්යේෂක, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.*



ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය වසර 100 ඉක්ම වූ ඉතිහාසයකට හිමිකම් කියනු ලබයි. දේශීය විවිධ සේවා සමුපකාර සමිති බිහිවීම රාජ්‍ය ප්‍රතිපත්ති මත සිදුවුවද එය 1978 පෙර පැවැති සංවෘත ආර්ථිකය තුළ රටේ ප්‍රධාන පාරිභෝගික ද්‍රව්‍ය බෙදාහරින්නා ලෙස කටයුතු කරන ලදි. 1978 දී හඳුන්වාදුන් විවෘත ආර්ථිකය තුළ සමුපකාර ව්‍යාපාරයට ද තම ව්‍යාපාර පුළුල් කරගැනීමට මහඟු අවස්ථාවක් ලද නමුත් නියමිත තීරණ නියමිත වේලාවට නොගැනීම, තීරණ ගැනීමේ දී සැලසුම් සහගත නොවීම වැනි කරුණු නිසා එම මහඟු අවස්ථාව සමුපකාර ව්‍යාපාරයට අහිමි විය. විවෘත ආර්ථිකය තුළ විවිධ සේවා සමුපකාර සමිතිවල අකාර්යක්ෂමතාවය කෙරෙහි තීරණ ගැනීමේ ක්‍රියාවලියේ බලපෑම කෙබඳුද යන්න අධ්‍යනය කිරීම මෙම අධ්‍යනයේ මුඛ්‍ය අරමුණ විය. විවිධ සේවා සමුපකාර සමිතිවල විවිධ ව්‍යාපාර සේවාවන් පවත්වාගෙන යාමේ දී තීරණ ගැනීමේ ක්‍රියාවලිය අධ්‍යනය කිරිම, සාමාජිකයින් සමුපකාර සමිතිය හා සම්බන්ධයෙන් තීරණ ගැනීමේ ක්‍රියාවලිය හඳුනාගැනීම, සාර්ව ආර්ථික පරිසරයේදී තීරණ ගැනීමේ ක්‍රියාවලිය හඳුනාගැනීම අධ්‍යනයේ උප අරමුණු විය. අධ්‍යනයේ අරමුණු වඩාහොඳින් ඉටුකර ගැනීම සඳහා උද්ගාමී ප්‍රවේශය යටතේ ගුණාත්මක ශිල්ප ක්‍රමය යොදාගනිමින් මෙම අධ්‍යනය සිදුකර ඇත. විවිධ සේවා සමුපකාර සමිතියක අකාර්යක්ෂමතාවයට තීරණ ගැනීමේ ක්‍රියාවලිය කොතෙක් දුරට බලපා ඇත්දැයි යන්න විශ්ලේෂණය කිරිම සඳහා ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ ලියාපදිංචි කර ඇති විවිධ සේවා සමුපකාර සමිති 11 අතුරින් සමිති 03 ක් සිද්ධීන් ලෙස තෝරාගන්නා ලදි. ප්‍රශ්නාවලියක් භාවිතයෙන් දත්ත එකතු කරනු ලැබූ අතර දත්ත විශ්ලේෂණය ගුණාත්මක ක්‍රමයට සිදුකරනු ලැබිය. අධ්‍යනය අවසානයේ පර්යේෂක විසින් පහත කරුණු අවධාරණය කරගන්නා ලදි.

සමුපකාර සමිතිවල තීරණ ගැනිමේ ක්‍රියාවලිය සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති සෘජුව බලපෑමකට ලක්වන අතර ස්වාධීන ව්‍යාපාරික ඒකකයක් ලෙස විවිධ සේවා සමුපකාර සමිති පැවතුන ද, මෙකී රාජ්‍ය ප්‍රතිපත්ති මත ගනු ලබන තීරණ වෙනස් කිරීමට සමුපකාර සමිතියට හැකියාවක් නොමැති වීම මත සමිතියට අවාසිදායක තතත්වයක් ඇතිවුවහොත් සමිතිය විසින් එය දරාගත යුතුව ඇත. ඒ අනුව රජයේ සහනාධාර බෙදා හැරීම සමුපකාර සමිති වල අඛණ්ඩ පැවැත්මට හිතකර තතත්වයක් ඇති නොකරයි. මේ නිසා සමිති විසින් තරඟකාරී වෙළඳපළ අත්පත්කර ගැනීමට අල්ප කැපකිරිමක් සිදුකරයි. එමෙන්ම, සමුපකාර සමිති රාජ්‍ය සහනාධාර බෙදාහැරීම සඳහා මූල්‍ය කටයුතු, අයිරා පහසුකම් මඟින් ලබාගැනීම නිසා සමිති දිගින් දිගටම අලාභ ලබන තතත්වයන් දක්නට ලැබේ. සමුපකාර සමිති නිළධාරීන් තම තිරණ ගැනිමට ප්‍රථම විගණන වාර්තා පරිශීලණය කිරීමට පෙළඹවීමක් නොමැති බවද අධ්‍යනයෙන් හෙළිදරව් විය. එලෙසම, එම වාර්තාවලින් හෙළිදරව් කරන විගණන ඌණතා නිවැරදි කිරීමට ද සමිති පාලනාධිකාරිය උනන්දුවක් නොදක්වන බවද නිරීක්ෂණය විය. සමුපකාර ව්‍යාපාරය හා බැඳුනු නීති, රීති, ලේඛණ, ප්‍රඥප්ති පිළිබඳ දැනුම සමුපකාර සමිති නිළධාරීන් හට අවම අතර හැම විටම තීරණ ගැනීම සඳහා තෙවන පාර්ශවයක සහය අපේක්ෂා කරනු ලබයි. බහුතරයක් සමුපකාර සමිතිවල උපාය මාර්ගික සැලැස්ම අක්‍රමවත් වන අතර සැලැස්මට පරිබාහිර කටයුතු වල නිරතවනු දක්නට ලැබුණි. තවද, සමුපකාර සමිතියේ ඉහළ කළමනාකාරිත්වය විසින් ව්‍යාපාරයේ ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන ගැන විග්‍රහයක් කිරිම සතුටුදායක නැත. ඉහත කරුණු හා සිද්ධි අධ්‍යනයෙන් සොයාගත් සාධක අනුව විවිධ සේවා සමුපකාර සමිති අකාර්යක්ෂමතාවයට තීරණ ගැනීමේ ක්‍රියාවලිය ගුණාත්මක ලෙස බලපෑම් කරන බව පර්යේෂකගේ අවසන් නිගමනය විය. සමුපකාර සමිති රජයේ සහනාධාර බෙදීම සඳහා උදව්කරුවෙකු ලෙස තබාගැනීමටත්, තීරණ ගැනීමේදී දත්ත හා තොරතුරු මත පදනම්ව තීරණ ගැනීමටත්, විගණන වලින් අනාවරණය වන විගණන ඌණතා නිවැරදි කර ගැනීමට කාලීනව කටයුතු කළයුතු බවත්, ව්‍යාපාර පරිසරයේ වෙනස් වීම් වලට සාපේක්ෂව සමිතිය ද වෙනස්කරමින් කටයුතු කිරීම යෝග්‍ය බවත් උපායමාර්ගික සැලැස්ම ලඟාකර ගැනීම සඳහා සැමවිටම කටයුතු කළ යුතු බවටත් අධ්‍යනය අවසානයේදී පර්යේෂක විසින් නිර්දේශ කරනු ලබයි.

*මූල පද: අකාර්යක්ෂමතාවය, තීරණ ගැනීමේ ක්‍රියාවලිය*

# ග්‍රාමීය බැංකු මූල්‍ය ක්‍රියාකාරකම් එහි ඵලදායීතාවයට බලපාන ආකාරය.

(කොළඹ දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිතිවල ග්‍රාමීය බැංකු කළමනාකරුවන් ඇසුරින්)

පී.නි පෙරේරා[1]
ශානිකා මුදන්නායක[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව.*
*2. කථිකාචාර්ය, උසස් තාක්ෂණික ආයතනය, මහනුවර.*

මෙම පර්යේෂණයේ අරමුණ වූයේ ග්‍රාමීය බැංකුවේ මූල්‍ය ක්‍රියාකාරකම් එහි ඵලදායීතාවයට බලපාන ආකාරය පිළිබඳ සොයාබැලීමයි. ද්විතීයික අරමුණ වූයේ ණය සම්පාදනය, ග්‍රාමීය බැංකුවේ ඵලදායීතාවයට සිදුකරන බලපෑම සොයා බැලීමත්, තැන්පත් රාශ්‍රීකරණය ග්‍රාමීය බැංකුවේ ඵලදායීතාවයට සිදුකරන බලපෑම සොයාබැලීම හා ආයෝජන ග්‍රාමීය බැංකුවේ ඵලදායීතාවයට සිදුකරන බලපෑම කොළඹ දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිතිවල ග්‍රාමීය බැංකු කළමනාකරුවන් ඇසුරින් සොයා බැලීමයි. සාහිත්‍ය විමර්ෂණයේදී අනාවරණය වූයේ ග්‍රාමීය බැංකුවේ මූල්‍ය ක්‍රියාකාරකම් හා ඵලදායිතාවය අතර ප්‍රභල සහසම්බන්ධයක් පවතින බවයි. පර්යේෂණ නියැදිය ලෙස කොළඹ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන විවිධ සේවා සමුපකාර සමිති 03 ක ග්‍රාමීය බැංකු කළමනාකරුවන්, පර්යේෂණ සංගහණය ලෙස තෝරාගෙන ඔවුන් අතරින් ග්‍රාමීය බැංකු 28 ක නියැදියක් තෝරාගන්නා ලදි. නියැදිය සඳහා සංවෘත ආන්ත ප්‍රශ්නාවලියක් භාවිතයෙන් දත්ත එකතුකර ගන්නා ලදි. පර්යේෂණ ප්‍රතිඵල අනුව ග්‍රාමීය බැංකුවේ ණය සම්පාදනය හා ඵලදායිතාවය අතර 0.865 ක සහසම්බන්ධතා සංගුණකයක් පෙන්වන ලදි. ඒ අනුව, ග්‍රාමීය බැංකු වල ණය සම්පාදනය හා එහි ඵලදායීතාවය අතර ධන සම්බන්ධයක් පවතින බව තහවුරු විය. තවද, තැන්පත් රාශ්‍රීකරණය හා ග්‍රාමීය බැංකු ඵලදායීතාවය අතර 0.72 ක ධනාත්මක සහසම්බන්ධයක් පැවතුන අතර ආයෝජන හා ග්‍රාමීය බැංකු ඵලදායීතාවය අතර 0.75 ක ධනාත්මක සහසම්බන්ධයක් පැවතුනි. ඒ අනුව, ණය සම්පාදනය, තැන්පත් රාශ්‍රීකරණය හා ආයෝජන යන ක්‍රියාකාරකම් ග්‍රාමීය බැංකු වල ඵලදායීතාවය සඳහා සෘජුව බලපාන බව තහවුරු විය.

***මූල පද:** ග්‍රාමීය බැංකු මූල්‍ය ක්‍රියාකාරකම්, ඵලදායීතාවය*

# සාමාජිකයින්ගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා ස.ණ.ස ව්‍යාපාරයේ දායකත්වය දෙනු ලබන ආකාරය

(සී/ස දංගොල්ල එක්සත් ස.ණ.ස සමිතියේ සාමාජිකයින් ඇසුරින්)

ජී.සා ප්‍රියංගනී[1]
අජිත් අමරකීර්ති[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව.*
*2. අධ්‍යක්ෂ (අධ්‍යන හා සංවර්ධන), ජාතික සමුපකාර සංවර්ධන ආයතනය*

මෙම පර්යේෂණයේ අරමුණ වූයේ සාමාජිකයින්ගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා ස.ණ.ස ව්‍යාපාරයේ දායකත්වය දෙනු ලබන ආකාරය තෝරාගත් එක් සමුපකාර ව්‍යවසායක් ආශ්‍රයෙන් අධ්‍යනය කිරීමයි. ද්විතීයික අරමුණ වූවේ සාර්ථක ජීවනෝපාය කාර්යසේවාවන් ලබාදීමේදී සණස සමිති ව්‍යුහය සංවිධානය වියයුතු ආකාරය හඳුනාගැනීමයි. මෙහිදී, පර්යේෂණයේ නියැදිය ලෙස වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය කොට්ඨාශයට අයත් සී/ස දංගොල්ල එක්සත් ස.ණ.ස සමිතියේ සාමාජිකයින් නියෝජනය වන පරිදි සාමාජිකයින් 50 දෙනෙකු වැඩිම සමිති සහභාගීත්වය අනුව තෝරාගෙන සංවෘත ආන්ත ප්‍රශ්නාවලියක් ඉදිරිපත්කර දත්ත එකතුකර ගන්නා ලදි. සංඛ්‍යාත්මක ගණනය කිරීම් මඟින් දත්ත විශ්ලේෂණය කරන ලදි. පර්යේෂණ ප්‍රතිඵල වලින් හෙළිදරව් වූයේ සමිතිය තම සාමාජිකයින්ගේ ජීවනෝපාය සංවර්ධනය කිරීම සඳහා ස්වයං රැකියා සඳහා ණය ලබා දීම, සාමාජිකයින්ගේ පුහුණු අවශ්‍යතා සඳහා දායක වීම, සුබසාධන කටයුතු, සාමාජික සෞඛ්‍ය සඳහා හා අධ්‍යාත්මික සංවර්ධනය සඳහා විවිධ ව්‍යාපෘති හඳුන්වා දී ඇති අතර ඒ තුළින් සාමාජිකයින්ගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා ප්‍රමාණවත් පරිදි මැදිහත් වී ඇති බවයි.

***මූල පද:*** *සාමාජිකයින්ගේ ජීවනෝපාය සංවර්ධනය, ස.ණ.ස*

# සමාජ ව්‍යවසාය ප්‍රවර්ධනයෙහි ලා සමුපකාර ග්‍රාමීය බැංකුවල දායකත්වය

(ඌව පළාත් විවිධ සේවා සමුපකාර සමිති හා ග්‍රාමීය බැංකු ඇසුරින්)

එම්.ඩී තැන්නේකුඹුර[1]
අජිත් අමරකීර්ති[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. ඌව පළාත*
*2. අධ්‍යක්ෂ (අධ්‍යන හා සංවර්ධන), ජාතික සමුපකාර සංවර්ධන ආයතනය*

සමාජ ව්‍යවසාය ප්‍රවර්ධනයෙහි ලා සමුපකාර ග්‍රාමීය බැංකුවල දායකත්වය විමසා බැලීම මෙම පර්යේෂණයේ අරමුණ විය. වර්තමාන සමුපකාර සමිති මඟින් මේ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග ප්‍රමාණවත් ද යන්න විමසා බැලීමත් මෙහි ද්විතීයික අරමුණක් විය. මේ සම්බන්ධයෙන් ඌව පළාත් විවිධ සේවා සමුපකාර සමිති වල ග්‍රාමීය බැංකු සේවකයින් හා ගණුදෙනුකරුවන් 220 ක් සඳහා ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කර තොරතුරු රැස්කර ගන්නා ලදි. සාහිත්‍ය විමර්ෂණයේ දී ව්‍යවසාය ප්‍රවර්ධනය සඳහා මූල්‍ය ආයතනයක් සිය දායකත්වය ලබාදිය යුත්තේ කෙසේද? යන්න සහ ඒ සම්බන්ධයෙන් ග්‍රාමීය බැංකු අංශ දක්වා ඇති දායකත්වය ප්‍රමාණවත් ද යන්න සම්බන්ධයෙන් කරුණු අනාවරණය විය. එසේ ඉදිරිපත් වූ දත්ත විශ්ලේෂණය කිරීමේ දී මූල්‍ය ප්‍රතිලාභ සහ සමාජ ව්‍යවසාය ප්‍රවර්ධනය අතර ධන සම්බන්ධතාවයක් තිබුනු අතර මූල්‍ය නොවන ප්‍රතිලාභ සහ සමාජ ව්‍යවසාය ප්‍රවර්ධනය අතර තිබුනේ ද ධන සම්බන්ධයකි. සංවිධානයක් මඟින් තම සාමාජිකයා හා සේවකයන් කෙරෙහි දක්වනු ලබන දායකත්වය සමාජ ව්‍යවසාය ප්‍රවර්ධනයට ධනාත්මකව බලපානු ලබන බව සාධනය විය. ඒ අනුව, විවිධ සේවා සමුපකාර සමිති හා ග්‍රාමීය බැංකු සමිති තම ගණුදෙනුකරුවන්ට සාමාජිකයින්ට හා සේවකයින්ට කරනු ලබන දායකත්වය මඟින් සමාජ ව්‍යවසාය ප්‍රවර්ධනය වීමක් සිදුවේ. නමුත්, මෙම සමුපකාර ව්‍යවසායන් තම සාමාජිකයා ප්‍රමුඛ ප්‍රජාවට යහපත් සේවාවක් ගුණාත්මක මට්ටමෙන් ලබා දීමට අපොහොසත් වී ඇති බව පෙනේ. වර්තමානයේ දී, ලොව තුළ සීඝ්‍රයෙන් ප්‍රචලිත වන සමාජ ව්‍යවසාය සංකල්පය වෙත ඌණ අනුගත වීමක් ඌව පළාත් විවිධ සේවා සමුපකාර සමිති හා ග්‍රාමීය බැංකු සිදුකර ඇති බව පර්යේෂණයෙන් අනාවරණය විය.

***මූල පද:** සමාජ ව්‍යවසාය ප්‍රවර්ධනය, සමුපකාර ව්‍යවසායන්*

# සීමා සහිත ගාලුගඟබඩ පත්තුව දකුණ කුඩා තේවතු හිමියන්ගේ සමුපකාර සමිතියේ කාර්යසාධනය අඩුවීමට හේතු විශ්ලේෂණය කිරීම පිළිබඳ අධ්‍යනය.


ජී.සී ප්‍රියංගිකා[1]
නන්දන බී. හපුආරච්චි[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. දකුණු පළාත.*
*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය*



සීමා සහිත ගාලුගඟබඩ පත්තුව දකුණ කුඩා තේවතු හිමියන්ගේ සමුපකාර සමිතියේ කාර්යසාධනය අඩුවීමට හේතු විශ්ලේෂණය කිරීමේ අරමුණින් දියත් කෙරුණු මෙම පර්යේෂණයේ උප අරමුණ වූවේ සමිතියේ කාර්යසාධනය වැඩිකර ගැනීමට සුදුසු යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමයි. මෙම පර්යේෂණය උත්ගාමී තර්කනය යටතේ විස්තරාත්මක ක්‍රමය භාවිතාකරමින් ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව, සිද්ධි අධ්‍යයන ක්‍රමවේදය භාවිතාකරමින් සකස් කරගත් තේ කර්මාන්තයට අදාළ තාක්ෂණික සාධකයන් විග්‍රහකර දෙවන පරිච්ඡේදයේදී ගොඩනගාගත් සංකල්පීය රාමුව භාවිතා කරමින් දත්ත රැස්කිරීම සිදුකර ඇත. දත්ත රැස්කිරීම සඳහා සමීක්ෂණ ක්‍රමය යොදාගත් අතර ඒ සඳහා නියැදිය තෝරා ගැනීම පහසු නියැදීම් ක්‍රමය අනුව සිදුකර ඇත. මෙම පර්යේෂණයේ සංගහනය වන්නේ සී/ස ගාලුගඟබඩ පත්තුව දකුණ කුඩා තේවතු හිමියන්ගේ සමුපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සේවකයින් 153 ක පිරිසෙන් 35% ක ප්‍රතිශතයක් සංගහනය තුළින් පුද්ගලයන් 22 දෙනෙකු නියැදිය ලෙස තෝරාගෙන තොරතුරු ලබාගැනීමට කටයුතු කර ඇත. හඳුනාගත් සාධකයන්ට අදාළ නිර්නායකයන් සඳහා අවශ්‍ය දත්ත සම්මුඛ සාකච්ඡා ක්‍රමය හා පර්යේෂකගේ නිරීක්ෂණ පදනම් කරගෙන සිදුකර ඇත. තවද, තේ කර්මාන්තයේ සුපරීක්ෂකට, නිෂ්පාදන කළමනාකරුට සහ සමිතියේ සාමාන්‍යාධිකාරීට ප්‍රශ්නාවලි ඉදිරිපත් කිරීමෙන් ප්‍රාථමික දත්ත ලබාගෙන ඇත. ද්විතීයික දත්ත සමිතියේ වාර්තා ආශ්‍රයෙන් ලබාගන්නා ලදි. දත්ත විශ්ලේෂණය අනුව, සමිතියේ සේවකයින් බහුතරයක් වයස්ගත අයවළුන් වන නිසා ඔවුන් විශ්‍රාම යෑමට නියමිත බැවින් අනාගතයේදී සේවක හිඟයකට මුහුණ දීමේ අවදානමක් පවතී. මේ වනවිට තේ වගාවේ එලදාව ප්‍රමිතිගත මට්ටමට ලඟා වී නොමැති වීමෙන් ඉදිරියේදී සමිතියේ නිෂ්පාදනය අඩුවිය හැකිය. සේවක පිරිවැය වැඩිවිම, පොහොර මිල අධික ලෙස වැඩිවීම සහ නඩත්තු වියදම් ඉහළ යාම හේතුවෙන් වියදම් ඉහළ අගයක් ගෙන ඇත.

සේවකයන්ගේ සේවාකාලය විශ්ලේෂණය කිරීමේදී පළපුරුදු සේවකයින් විශ්‍රාම යාමේ අවදානමකට සමිතිය මුහුණ පා තිබේ. සමිතිය තුළ ඉහළ අධ්‍යාපන සුදුසුකම් සහිත සේවකයින් සිටින්නේ ඉතා අඩුවෙනි. ආයතනයක සාර්ථකත්වයට මනා කළමනාකරණයක් තිබීම අත්‍යවශ්‍ය වේ. කර්මාන්තශාලාවේ ධාරිතාවයට ප්‍රමාණවත් අමු තේ දළු නොලැබීම හේතුවෙන් ගැටළු රාශියකට මුහුණ දී ඇත. විදුලි ධාරිතාවය, තාපය, ශ්‍රමය අපතේ යාමක් සිදු වී ඇත. සමිතියේ අභ්‍යන්තර පාලනය දුර්වල බව විශ්ලේෂණයේ දී පැහැදිලි විය. මූල්‍ය දුෂ්කරතා කල්තියා හඳුනා නොගැනීම, නිවැරදි ආයෝජන තීරණ නොගැනීම, අයවැය ඇස්තමේන්තු ප්‍රායෝගික නොවීම, පැරණි යන්ත්‍ර සූත්‍ර භාවිතය වැනි කරුණු සීමා සහිත ගාලුගඟබඩ පත්තුව දකුණ කුඩා තේවතු හිමියන්ගේ සමුපකාර සමිතියේ කාර්යසාධනය අඩුවීමට බල පා ඇති හේතු ලෙස පර්යේෂණයෙන් අනාවරණය විය.

***මූල පද:*** *කුඩා තේවතු හිමියන්ගේ සමුපකාර සමිතිය, කාර්යසාධනය*

# නිෂ්පාදන විවිධාංගීකරණය සංවිධානයක ඵලදායීතාවය සඳහා වන බලපෑම හඳුනාගැනීම.

(පුත්තලම දිස්ත්‍රික්කයේ ධීවර සමුපකාර සමිති සාමාජිකයින් ඇසුරෙනි)


සු.ශා පෙරේරා[1]
ශානිකා මුදන්නායක[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. වයඹ පළාත*
*2. කථිකාචාර්ය, උසස් තාක්ෂණික ආයතනය, මහනුවර.*



නිෂ්පාදන විවිධාංගීකරණය සංවිධානයක ඵලදායීතාවය සඳහා වන බලපෑම හඳුනාගැනීම සඳහා මෙම පර්යේෂණය සිදුකරන ලදි. නිෂ්පාදන විවිධාංගීකරණය තුළින් සමස්ථ හා ඒ ආශ්‍රිත ප්‍රජාවගේ ආර්ථික ඵලදායීතාවය සඳහා වන බලපෑම හඳුනාගැනීම සහ නිෂ්පාදන විවිධාංගීකරණය මඟින් සමිතියේ ඵලදායීතාවය වර්ධනය වන ආකාරය සොයාබැලීම මෙම අධ්‍යනයේ ද්විතීයික අරමුණු විය. මෙම අධ්‍යනයේ සංගහනය ලෙස ධීවර සමිති දෙකක සාමාජිකයින් 223 දෙනෙකු සිටින අතර ඉන් 60 දෙනෙකු නියැදිය ලෙස තෝරාගන්නා ලදි. ප්‍රශ්නාවලියක් භාවිතයෙන් ප්‍රාථමික දත්ත එකතු කරනු ලැබීය. පර්යේෂණ ප්‍රතිඵල අනුව ධීවර සමුපකාර සමිති සාමාජිකයින්ට තැන්පත් හා ණය ගනුදෙනුවලට අමතරව සේවා සැපයීම පිළිබඳව 0.590 ක මධ්‍යස්ථ සහසම්බන්ධතාවයක් පෙන්නුම් කරන ලදි. ඉන් ගම්‍ය වන්නේ ධීවර සමිති සාමාජිකයින් ණය හා මූල්‍ය සේවා ලබාගැනීමට වැඩි රුචිකත්වයක් දක්වන බව හා අමතර සේවාවන් පිළිබඳව විශාල බලාපොරොත්තුවක් නොමැති බවයි. නිෂ්පාදන විවිධාංගීකරණය පිළිබඳව ද සාමාජිකයින් උනන්දුවක් නොදක්වන බව හෙළිදරව් විය. සමිතියේ ඵලදායීතාවය පිළිබඳ විශ්ලේෂණයේ දී සුහද සේවය, කාලීන අවශ්‍යතා අනුව භාණ්ඩ සැපයීම, සාමාජික අවශ්‍යතා සොයාබැලීම වැනි කාරණා සඳහා සාමාජික ප්‍රතිචාර මධ්‍යස්ථ විය. අධ්‍යනයේ ප්‍රතිඵල වලින් තහවුරු වන්නේ තරඟකාරීත්වය මත හා පහසුකම් මත හැකි කුමන හෝ ස්ථානයකින් සාමාජිකයින් තම අවශ්‍යතා ඉටුකර ගන්නා බවයි.



***මූල පද:** නිෂ්පාදන විවිධාංගීකරණය, ඵලදායීතාවය*

# සේවක ඵලදායීතාවය කෙරෙහි දිරිදීමනා ක්‍රමවල ඇති බලපෑම පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යනය.

(මොණරාගල දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිති හා ග්‍රාමීය බැංකු සමුපකාර සමිති ආශ්‍රිතව.)


ඒ.එම්.වයි. සී අබේසේකර[1]
චන්දන රණසිංහ[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. ඌව පළාත.*
*2. සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය*



මෙම පර්යේෂණයේ අරමුණ වූවේ සේවක ඵලදායීතාවය කෙරෙහි දිරිදීමනා ක්‍රමවල ඇති බලපෑම අධ්‍යනය කිරීමයි. ද්විතීයික අරමුණු වූයේ සේවක ඵලදායීතාවය සඳහා සමිති විසින් නිර්මාණය කර ඇති දිරිදීමනා ක්‍රම වල වැදගත්කම හා සේවක ඵලදායීතාවය සහ දිරිදීමනා යන සංකල්පය අතර ඇති බැඳියාව හඳුනාගැනීමයි. මොණරාගල දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිති හා ග්‍රාමීය බැංකු සමුපකාර සමිතිවල සේවකයින් 220 දෙනෙකු උපයෝගීකර ගෙන ප්‍රශ්නාවලියක් ඉදිරිපත්කර දත්ත රැස්කරන ලදි. පර්යේෂණයේ ප්‍රතිඵල අනුව සමුපකාර සේවකයන්ට සමිති විසින් ලබාදෙන මූල්‍ය ප්‍රතිලාභ හා සේවක ඵලදායීතාවය අතර ඉහළ ධන සම්බන්ධයක් ඇතිබව හෙළිදරව් විය. මෙහිදී, සේවක වැටුප්, පැමිණීමේ දීමනා, ප්‍රසාද දීමනා, නිළ ඇඳුම්, මාසික ලාභාංශ ගෙවීම්, කාර්යසාධනය මත ගෙවීම් වැනි මූල්‍ය දිරිදීමනා සේවකයින්ගේ ඵලදායීතාවය ඉහළ නංවන බව තහවුරු විය. එමෙන්ම, මූල්‍ය නොවන දිරිදීමනා වන උසස් වීම් ක්‍රමවේදය, සේවක ඇගයුම් ක්‍රම, වෘත්තීය පුහුණුව, ආරක්ෂාව, සමාජ තතත්වය වැනි සාධක හා සේවක ඵලදායීතාවය අතර ද ධන සම්බන්ධයක් පවතින බව තහවුරු විය. ඒ අනුව, සේවකයින්ට වඩා සාධාරණ ලෙස මූල්‍යමය හා මූල්‍ය නොවන දිරි දිමනා ක්‍රම සකස්කර කටයුතු කිරීම තුළින් සේවක ඵලදායිතාවය ඉහළ නංවාගත හැකි බව පර්යේෂණ ප්‍රතිඵල අනුව පැහැදිලි වේ.



***මූල පද:*** *දිරිදීමනා ක්‍රම, සේවක ඵලදායීතාවය*

# සමුපකාර සාමාජික ප්‍රජාවගේ සංවර්ධනය සඳහා සමුපකාර ග්‍රාමීය බැංකු අංශයෙන් ලැබෙන දායකත්වය පිළිබඳ විශ්ලේෂණය.

(සී/ස හිරියාල විවිධ සේවා සමුපකාර සමිතිය ඇසුරින් කරන සිද්ධි අධ්‍යනය)

එම්.ඩී ඒකනායක[1]
නන්දන බී. හපුආරච්චි[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. වයඹ පළාත.*
*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය*

සමුපකාර සාමාජික ප්‍රජාවගේ සංවර්ධනය සඳහා සමුපකාර ග්‍රාමීය බැංකු අංශයෙන් ලැබෙන දායකත්වය පිළිබඳ විශ්ලේෂණයක් මෙම අධ්‍යනයෙන් සිදුකරන ලදි. පර්යේෂණ නියැදිය ලෙස සී/ස හිරියාල විවිධ සේවා සමුපකාර සමිතියේ ක්‍රියාකාරී සාමාජිකයින් 331 දෙනෙකු තෝරාගෙන ප්‍රශ්නාවලියක් භාවිතයෙන් දත්ත එකතුකර ගන්නා ලදි. පර්යේෂණ ප්‍රතිඵල අනුව සාමාජික ප්‍රජාවගේ සංවර්ධනය සඳහා ග්‍රාමීය බැංකු අංශය තුළින් දක්වන දායකත්වය අතර ධන සහසම්බන්ධයක් පවතින බව පෙන්නුම් කරයි. සාමාජිකයින්ගේ සංවර්ධනය සඳහා සමිතිය ආර්ථික, භෞතික, අධ්‍යාත්මික හා කුසලතා ලෙස අංශ කිහිපයකින් කටයුතු කරනු ලබයි. සාමාජික ආර්ථිකය නඟාසිටුවීම සඳහා සමිතිය විසින් ණය පහසුකම් ලබාදීම, ඉතුරුම් පවත්වාගෙන යාම, සහන පොළී ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම වැනි දෑ සිදුකරයි. භෞතික සංවර්ධනය යටතේ සාමාජිකයින්ගේ පානිය ජල පහසුකම්, විදුලිය, සනීපාරක්ෂක පහසුකම්, නිවාස පහසුකම් සඳහා දායක වීමත් අධ්‍යාත්මක සංවර්ධනය යටතේ ආගමික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය, පරිසර ආරක්ෂණ ක්‍රම, රුක් රෝපණ වැඩසටහන්, රැකියා හා කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැනි දෑ සිදුකරනු ලබයි. මේ අනුව, සමුපකාර සාමාජික ප්‍රජාවගේ සංවර්ධනය සඳහා සී/ස හිරියාල විවිධ සේවා සමුපකාර සමිතියේ ග්‍රාමීය බැංකු අංශය සැලකියයුතු දායකත්වයක් ලබාදෙන බව තහවුරු විය.

***මූල පද:*** *සාමාජික ප්‍රජාවගේ සංවර්ධනය, ග්‍රාමීය බැංකු අංශය*

# සමුපකාර සමිතිවල ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම පිළිබඳ ගවේෂණාත්මක අධ්‍යනය.

එල්.ඒ. චන්ද්‍රකුමාර[1]
දිනූෂ දිසානායක[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. වයඹ පළාත*
*2. සහකාර පර්යේෂක, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.*

දේශීය සමුපකාර ව්‍යාපාරය තුළ මුඛ්‍ය අරමුණ හා පරමාර්ථ අභිබවමින් දූෂණ, අක්‍රමිකතා හා වංචාවන්හි ඉහළ යාමේ ප්‍රවණතාවයක් දක්නට ලැබේ. සමුපකාර සමිතිවල ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම පිළිබඳව අධ්‍යනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. සමුපකාර සමිති තුළ විචක්ෂණශීලී විගණන පරිචයක් තුළින් මනා අභ්‍යන්තර පාලන උපක්‍රම සැකසීම හා සමුපකාර සමිති තුළ වංචා, දූෂණ හා අක්‍රමිකතා අවම කිරිමට නිර්දේශ ලබාගැනීම මෙහි උප අරමුණු විය. මෙහිදී, පර්යේෂක ගුණාත්මක ක්‍රමවේදය භාවිතාකරමින් උද්ගාමී ප්‍රවේශය යටතේ පර්යේෂණය සැලසුම් කරන ලදි. සමීක්ෂණ ක්‍රමවේදය භාවිතාකරමින් අධ්‍යනයේ හෙළිදරව් කිරීම් සිදුකරන ලදි. වයඹ පළාතේ සමුපකාර සමිති වලට අයත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, ස.ණ.ස සමිති කාරකසභිකයින්, කාර්යමණ්ඩල සේවකයින්, ස.ණ.ස සේවකයින්, සමුපකාර දෙපාර්තමේන්තු නිළධාරීන් ඇතුළු 50 දෙනෙකුගේ නියැදියක් මේ සඳහා තෝරාගන්නා ලදි. ප්‍රශ්නාවලියක් භාවිතයෙන් ප්‍රාථමික දත්ත එකතුකර ගන්නා ලදි. දත්ත විශ්ලේෂණය අනුව තහවුරු වූයේ සමුපකාර සමිති තුළ ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ඇතිකිරීම තුළින් විගණන පරිචයන් ඇති කර ඒ හරහා වංචා, දූෂණ අක්‍රමිකතා අවම කිරිම සිදුකළ හැකි බවයි. එමෙන්ම, සමුපකාර සමිති පිළිබඳව සාමාජිකයින් තවමත් විශ්වාසය තබා ඇති බවත් සමුපකාර සමිති වල විගණන ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කර පවත්වාගෙන යා යුතු බවත් අධ්‍යනයෙන් හෙළිදරව් විය. ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් සැකසීම සඳහා සමිති සේවකයින් මනාව පුහුණු කළයුතු බවත් අභ්‍යන්තර විගණක නිළධාරීන්ට ස්වාධීනව කටයුතු කළහැකි පරිසරයක් සමුපකාර සමිති තුළ ඇතිකළ යුතු බවටත් අනවශ්‍ය දේශපාලන මැදිහත් වීම් සමුපකාර සමිති තුළින් ඉවත් කළ යුතු බවටත් අධ්‍යනය අවසානයේදී පර්යේෂක නිර්දේශ කරනු ලබයි.

***මූල පද:** ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතිය, ස්වාධීන, දේශපාලනය*

# බදුල්ල දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිති මඟින් සාමාජිකත්වය ප්‍රවර්ධනය කිරීමට දැක්වූ දායකත්වය හඳුනාගැනීම.

(බදුල්ල දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිති වල ග්‍රාමීය බැංකු කාර්යමණ්ඩල ඇසුරින්)


ආර්.කේ. දිසානායක[1]
චරිත් අමරසේකර[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. ඌව පළාත*
*2. සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.*



මෙම පර්යේෂණයේ අරමුණ වූවේ බදුල්ල දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිති මඟින් සාමාජිකත්වය ප්‍රවර්ධනය කිරීමට දැක්වූ දායකත්වය හඳුනාගැනීමයි. ඒ යටතේ සමුපකාර සමිති මඟින් සාමාජික ප්‍රවර්ධනයට ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද යන්න සහ ඒවා ප්‍රමාණවත්ද යන්න විමසා ඇත. සාහිත්‍ය විමර්ෂණයේදී අනාවරණය වූවේ සාමාජික ප්‍රවර්ධනය සඳහා බලපාන ආර්ථික හා ආර්ථික නොවන සාධක අතර ධන සහසම්බන්ධයක් පවතින බවයි. පර්යේෂණ නියැදිය ලෙස බදුල්ල දිස්ත්‍රික්කයේ වතු, ග්‍රාමීය, නාගරික ප්‍රජාව ජීවත්වන ප්‍රදේශ නියෝජනය වන ආකාරයට විවිධ සේවා සමුපකාර සමිතිවල ග්‍රාමීය බැංකු කාර්යමණ්ඩලය ඇතුළු 220 දෙනෙකු තෝරාගන්නා ලදි. සකස්කළ ප්‍රශ්නාවලියක් භාවිතයෙන් දත්ත එකතුකර ගන්නා ලදි. දත්ත විශ්ලේෂණයේ දී තහවුරු වූයේ මූල්‍ය ප්‍රතිලාභ සහ සාමාජික ප්‍රවර්ධනය අතර ධන සම්බන්ධයක් පවතින බවයි. මූල්‍ය නොවන ප්‍රතිලාභ සහ සාමාජික ප්‍රවර්ධනය අතර ඇත්තේ ද ධන සම්බන්ධයකි. ඒ අනුව, සමුපකාර සමිතියක් විසින් තම සාමාජිකයින්ට ලබාදෙන මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ සාමාජික ප්‍රවර්ධනයට ප්‍රභලව බලපාන බව අධ්‍යනයෙන් තහවුරු විය. සංවිධානයක් මඟින් තම සාමාජිකයා කෙරෙහි දක්වනු ලබන දායකත්වය සාමාජික ප්‍රවර්ධනයට ධනාත්මකව බලපාන බව මින් සාධනය වෙයි.



***මූල පද:** සාමාජිකත්වය ප්‍රවර්ධනය, මූල්‍ය ප්‍රතිලාභ, මූල්‍ය නොවන ප්‍රතිලාභ*

# කාර්යමණ්ඩල රැකියා තෘප්තිය විවිධ සේවා සමුපකාර සමිතිවල සංවර්ධනය කෙරෙහි දක්වන බලපෑම.

(බදුල්ල දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිති වල කාර්යමණ්ඩලය ඇසුරින්)


නි.අ. රත්නායක[1]
ඩී.එම්.ටී දිසානායක[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. ඌව පළාත*
*2. බාහිර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.*



මෙම පර්යේෂණයේ අරමුණ වූවේ කාර්යමණ්ඩල රැකියා තෘප්තිය විවිධ සේවා සමුපකාර සමිතිවල සංවර්ධනය කොරහි දක්වන බලපෑම පිළිබඳව සොයාබැලීමයි. ද්විතීයික අරමුණු වූවේ විවිධ සේවා සමුපකාර සමිති කාර්යමණ්ඩලයේ රැකියා තෘප්තිය සඳහා මූල්‍ය ප්‍රතිලාභ බලපාන ආකාරය, මූල්‍ය නොවන ප්‍රතිලාභ කාර්යමණ්ඩලයේ රැකියා තෘප්තියට බලපාන ආකාරය හා රැකියා තෘප්තිය ඉහළ නැංවීම සඳහා විවිධ සේවා සමුපකාර සමිතිවලට අනුගමනය කළහැකි උපක්‍රම කවරේදැයි යන්න හඳුනාගැනීමයි. නියැදිය ලෙස බදුල්ල දිස්ත්‍රික්කය පාදක කරගනිමින් තෝරාගත් සමුපකාර ග්‍රාමීය බැංකු වල කාර්යමණ්ඩල නිළධාරීන් 113 දෙනෙකු තෝරාගන්නා ලදි. සංවෘත්ත ආන්ත ප්‍රශ්නාවලියක් මඟින්, සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ මඟින් දත්ත රැස්කරන ලදි. දත්ත විශ්ලේෂණයේ ප්‍රතිඵල අනුව මූල්‍ය හා මූල්‍ය නොවන සාධක අතර ප්‍රභල ධන සම්බන්ධතාවයක් පෙන්නුම් කරන බව තහවුරු විය. සමුපකාර සමිතියක් සැමවිටම මූල්‍ය මෙන්ම මූල්‍ය නොවන ප්‍රතිලාභ පිළිබඳව ද සැලකිල්ලක් දැක්විය යුතුය. ඒ අනුව, ආයතනය තුළ සේවකයාගේ පෞද්ගලිකත්වය රැකීම, සනීපාරක්ෂක පහසුකම්වල විධිමත්භාවය, සේවකයන්ට ඇහුන්කම් දීම, සාධාරණත්වය වැනි මූල්‍ය නොවන ප්‍රතිලාභ ප්‍රවර්ධනය තුළින් සේවක රැකියා තෘප්තිය ඉහළනංවා ගතහැකිබව පර්යේෂණ ප්‍රතිඵල මත පැහැදිළි වේ.



***මූල පද:*** *රැකියා තෘප්තිය, මූල්‍ය ප්‍රතිලාභ, මූල්‍ය නොවන ප්‍රතිලාභ*

# සංවිධානවල සේවක අභිප්‍රේරණ ක්‍රමවේදය සේවක රැකියා කැපවීම කෙරෙහි බලපානු ලබන ආකාරය.

(දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයට අයත් තේ නිෂ්පාදන සමුපකාර සමිති කාර්යමණ්ඩල සේවකයින් ඇසුරින්)


ඩී.පී පෙරේරා[1]
ශානිකා මුදන්නායක[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. දකුණු පළාත*
*2. කථිකාචාර්ය, උසස් තාක්ෂණික ආයතනය, මහනුවර.*



සංවිධානවල සේවක අභිප්‍රේරණ ක්‍රමවේදය සේවක රැකියා කැපවීම කෙරෙහි බලපානු ලබන ආකාරය විග්‍රහකර බැලීම මෙම පර්යේෂණයේ අරමුණ විය. මූල්‍ය අභිප්‍රේරණ ක්‍රමවේදය හා මූල්‍ය නොවන අභිප්‍රේරණ ක්‍රමවේදය සංවිධානයේ සේවක රැකියා කැපවීම කෙරෙහි සිදුකරන බලපෑම සොයාබැලීම උප අරමුණු විය. පර්යේෂණ නියැඳිය ලෙස දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයට අයත් තේ නිෂ්පාදන සමුපකාර සමිති කාර්යමණ්ඩල සේවකයින් 55 දෙනෙකු ස්ථරීකෘත නියැදීම් ක්‍රමය අනුව තෝරාගෙන සංවෘත ආන්ත ප්‍රශ්නාවලියක් ඉදිරිපත්කර දත්ත රැස්කරන ලදි. සංඛ්‍යානමය ගණනය කිරීම් මඟින් දත්ත විශ්ලේෂණය කළ අතර පර්යේෂණ ප්‍රතිඵල වලින් දැක්වූයේ තේ නිෂ්පාදන සමුපකාර සමිති කාර්යමණ්ඩල සේවකයින්ට ලබාදෙන මූල්‍ය අභිප්‍රේරණය හා සේවක රැකියා කැපවීම අතර 0.842 ක ඉතා ප්‍රභල ධන සහසම්බන්ධයක් පවතින බවයි. එනම්, සේවක වැටුප්, දිරි දීමනා, ප්‍රසාද දීමනා ඇතුළු සේවකයින්ට දෙනු ලබන මූල්‍ය අභිප්‍රේරණය සේවක රැකියා කැපවීම කෙරෙහි ධනාත්මකව බලපාන බවයි. මූල්‍ය නොවන අභිප්‍රේරණ ක්‍රමවේදය හා සේවක රැකියා කැපවීම අතර 0.792 ක ප්‍රභල ධන සහසම්බන්ධයක් පෙන්නුම් කරන ලදි. ඉන් අදහස් වන්නේ සමිති කාර්යමණ්ඩලය සේවකයින් පිළිගැනීමට හා ඇගයීමකට ලක් කරන බවත්, නිසි පුහුණුවක් හා අවශ්‍ය උපකරණ ලබාදෙන බවත්, හා සුදුසුකම් මත උසස් වීම් යනාදිය ලබාදීම වැනි දෑ සිදුකරන බවයි. පර්යේෂණයේ ප්‍රතිඵල අනුව තහවුරු වන්නේ සංවිධානවල සේවක අභිප්‍රේරණ ක්‍රමවේදය (මූල්‍ය හා මූල්‍ය නොවන) සේවක රැකියා කැපවීම කෙරෙහි සහසම්බන්ධයක් දක්වන බවයි. එබැවින් තම අභිප්‍රේරණ ක්‍රමවේදයන් සැකසීමේ දී සමුපකාර සමිති මූල්‍ය හා මූල්‍ය නොවන යන අභිප්‍රේරණ ක්‍රමවේදයන් දෙකම පිළිබඳව සැලකිල්ලට ගැනීම අත්‍යවශ්‍ය බව පර්යේෂණය මඟින් පෙන්වන ලදි.



***මූල පද:** සේවක අභිප්‍රේරණ ක්‍රමවේදය, මූල්‍ය, මූල්‍ය නොවන*

# ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රජාවගේ ආර්ථික සංවර්ධනය සඳහා ස.ණ.ස සමිති තුළින් ලබාදී ඇති දායකත්වය පිළිබඳව අධ්‍යනය

ඩී. ඇ පීරිස්[1]
නන්දන බී. හපුආරච්චි[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. වයඹ පළාත.*
*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය*

මෙම පර්යේෂණයෙන් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රජාවගේ ආර්ථික සංවර්ධනය සඳහා ස.ණ.ස සමිති තුළින් ලබාදී ඇති දායකත්වය පිළිබඳව අධ්‍යනයක් සිදුකර ඇත. අධ්‍යනය සඳහා සී/ස කප්පන්ගමුව, කොස්හේන හා බෝහන්දිය යන ස.ණ.ස සමිති තුනේ සාමාජිකයින්ගෙන් 60 දෙනෙකු නියැදිය ලෙස ගෙන ප්‍රශ්නාවලියක් ලබා දී දත්ත එකතුකර ගන්නා ලදි. අධ්‍යනයේ ප්‍රතිඵල අනුව, සමිති විසින් සපයනු ලැබූ ණය වලින් 30%ක් ස්වයං රැකියා සඳහා ද, 25% ක් ගොවිතැන් කටයුතු සඳහා ද, 15% ක් නිවාස සෑදීම හා අළුත්වැඩියාව සඳහා ද, 12% ක් රථ වාහන සඳහා ද 10% ක් අධ්‍යාපන කටයුතු සඳහා ද 6% ක් වෙනත් කටයුතු සඳහාද ලබා දී ඇත. සමිති මඟින් ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය සඳහා හා පුහුණුව සඳහාද, සාමාජික දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය සඳහා ද, නව ව්‍යාපාර ඇරඹීම සඳහා, ප්‍රමාණවත් පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. සාමාජිකයාගේ ආර්ථික සංවර්ධනයට අමතරව සාමාජීය සංවර්ධනය කෙරෙහි ද අවධානය යොමු කිරීමටත්, තාක්ෂණය භාවිතා කර සාමාජිකයාට ඵලදායී සේවාවක් ලබා දිමටත්, සාමාජික මුදල් සඳහා නිසි නියාමනයක් සිදු කිරිමටත් අධ්‍යනය අවසානයේ දී පර්යේෂක නිර්දේශ කරයි.

***මූල පද:*** *ග්‍රාමීය ප්‍රජාව, ආර්ථික සංවර්ධනය, ස.ණ.ස සමිති*

# සමුපකාර සමිති ප්‍රඥප්තිය සකසුරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිති වල දියුණුවට සිදුකරනු ලබන බලපෑම.

(මහරගම බලප්‍රදේශය තුළ ක්‍රියාත්මක විශාල ප්‍රමාණයේ ස.ණ.ස සමිති ඇසුරින් සිදුකරනු ලබන අධ්‍යනය)

එච්.කේ.සේපාලි[1]
දිනූෂ දිසානායක[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව.* (බස්නාහිර)
*2. සහකාර පර්යේෂක, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.*

බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක සමුපකාර සමිති ප්‍රඥප්තිය සකසුරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිති වල දියුණුවට සිදුකරනු ලබන බලපෑම පිළිබඳ අධ්‍යනය කිරිම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය. ද්විතියික අරමුණ වූයේ ස.ණ.ස සමිති වල මුල්‍යාමය දියුණුවට බස්නාහිර පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තිය සිදුකරන බලපෑම පරීක්ෂා කිරිමත්, මුල්‍යාමය නොවන දියුණුවට සිදුකරන බලපෑම පරීක්ෂා කිරීමත්ය. පර්යේෂණ නියැදිය ලෙස කොළඹ දිස්ත්‍රික්කයේ මහරගම බලප්‍රදේශය තුළ ක්‍රියාත්මක මුළු වත්කම් අතිරික්තය රු. මිලියනය ඉක්මවූ ස.ණ.ස සමිති 15 ක් අරමුණු සහගත නියැදිම් ක්‍රමය යටතේ තෝරාගන්නා ලදි. සංවෘත ප්‍රශ්නාවලියක් මඟින් පර්යේෂණයට අදාළව දත්ත රැස්කිරීම සිදුකර ඇත. ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමය යොදාගනිමින් රැස්කරගත් දත්ත සාරාංශගත කිරීම මඟින් නිගමන වලට එළැඹෙන ලදි. පර්යේෂණ ප්‍රතිඵල තුළින් දැක්වූවේ ස.ණ.ස සමිති වල දියුණුවට බස්නාහිර පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තිය අහිතකර ලෙස බලපා ඇති බවයි. ස.ණ.ස සමිති වල මූල්‍යාමය දියුණුවට එනම් ප්‍රාග්ධනය හා තැන්පත් රැස්කිරීම තුළින් සමිතියේ අරමුදල් ගොඩනැගීමේ ක්‍රියාවලියට බස්නාහිර පළාතේ සමුපකාර සමිති ප්‍රඥප්තිය අහිතකර ලෙස බලපා ඇත. ස.ණ.ස සමිති වල මූල්‍යාමය නොවන දියුණුවට එනම්, සාමාජිකත්වය වර්ධනය කර ගැනිමට හා බලප්‍රදේශය පුළුල්කර ගැනීම තුළින් ව්‍යාපාරික කටයුතු පුළුල්කර ගැනිමට ද බස්නාහිර පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තිය බාධාවක් වී ඇත. තවද, ව්‍යවසායකත්ව ප්‍රවර්ධනයට හා කාලීනව බස්නාහිර පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තිය යාවත්කාලීන නොවීම ද ස.ණ.ස සමිති වල දියුණුවට අහිතකර ලෙස බලපා ඇත.

***මූල පද:** සමුපකාර සමිති ප්‍රඥප්තිය, ස.ණ.ස සමිති*

# සමුපකාර සමිතිවල කාර්යමණ්ඩල ඌණ උපයෝජනය වීම පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යනය.

(මොණරාගල දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිති ආශ්‍රිතව)


ශ්‍රී.හේ තලංගම[1]
කුමුදු රත්නසිරි[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. ඌව පළාත.*
*2. සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය*



මෙම පර්යේෂණයේ අරමුණ වූයේ සමුපකාර සමිතිවල සේවක සම්පත ඌණ උපයෝජනය වීම පිළිබඳව විශ්ලේෂණාත්මක අධ්‍යනයක් සිදුකිරීමයි. වර්තමාන ශ්‍රී ලංකාවේ සමුපකාර සමිතිවල දක්නට ලැබෙන පහළ ඵලදායීතාවය, අඩු කාර්යක්ෂමතාවය සහ දුර්වල සඵලත්වය මත මූලික වශයෙන් සංවිධානයේ ක්‍රියාකාරීත්වයට බලපා ඇත. මේ සඳහා වර්තමානයේ දී අපට අසන්නට හා දකින්නට ලැබෙන වැඩ වර්ජන, පිකටින්, සේවක ගැටුම්, සේවක ප්‍රවාසිතාවය, සේවක පිරිවැටුම, දුක්ගැනවිලි යන බෝහෝ කරුණු අඩුවැඩි වශයෙන් දායක වී ඇතිබව තහවුරු වී ඇත. මින් අදහස් වන්නේ වර්තමානයේ සමුපකාර සමිති තරඟකාරී වාසි අත්පත් කරදෙන මූලික හා වැදගත්ම මානව සම්පත් නිසිපරිදි යොදා නොගැනීමයි. මොණරාගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක විවිධ සේවා සමුපකාර සමිති 05 අතුරින් සේවක සේවිකාවන් 86 දෙනෙකු නියැදිය වශයෙන් තෝරාගෙන මෙම පර්යේෂණය සිදුකර ඇත. සමිති සේවකයින් සඳහා වෙන් කරන ලද සේවක වැටුප් හා දීමනා පිළිබඳ දත්ත විගණන වාර්තා මඟින් උපුටා ගන්නා ලදි. නියැදියේ අදහස් දැක්වීම අනුව සේවක සම්පත මෙසේ ඌණ උපයෝජනය වීමට හේතුසාධක වී ඇත්තේ දඬුවම් කිරීමෙන් පමණක් මෙම පසුබිම වෙනස් කළ නොහැකි අතර සේවක අභිමානය වර්ධනය වන ආකාරයට සමුපකාර සමිති තුළ සංස්කෘතිය වෙනස් කිරීමට කාලය එළැඹ ඇත.



***මූල පද:*** *කාර්යමණ්ඩල ඌණ උපයෝජනය, සේවක අභිමානය*

# ණය ප්‍රදානය කිරීමේ ක්‍රියාවලිය කල්පසු වූ ණය අයකර ගැනිමට සම්බන්ධ වන ආකාරය.

(වයඹ පළාතේ විවිධ සේවා සමුපකාර සමිතිවල ග්‍රාමීය බැංකු කළමනාකරුවන් ඇසුරින්)


ජේ.ඒ සුමනසිංහ[1]
ශානිකා මුදන්නායක[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. වයඹ පළාත*
*2. කථිකාචාර්ය, උසස් තාක්ෂණික ආයතනය, මහනුවර.*



ණය ප්‍රදානය කිරීමේ ක්‍රියාවලිය කල්පසු වූ ණය අයකර ගැනීමට බලපාන ආකාරය හඳුනාගැනීම මෙම පර්යේෂණයේ මූලිකම අරමුණ විය. සාහිත්‍ය විමර්ෂණයේදී අනාවරණය වූයේ ණය ප්‍රදානය කිරීමේ ක්‍රියාවලිය හා කල්පසු වූ ණය අතර සැලකියයුතු සහසම්බන්ධයක් පවතින බවයි. මෙහිදී පර්යේෂණ නියැදිය ලෙස වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිති තුනක ග්‍රාමීය බැංකු ශාඛා කළමනාකරුවන් 50 දෙනෙකු ස්ථරීකෘත නියැදි ක්‍රමයට තෝරාගෙන සංවෘත ආන්ත ප්‍රශ්නාවලියකින් දත්ත රැස්කරන ලදි. පර්යේෂණ ප්‍රතිඵල වලින් දැක්වූයේ ණය පරිපාලනය හා කල්පසු ණය අතර 0.191 ක ධන සම්බන්ධතාවයක් පෙන්නුම් කරන බවයි. එනම්, ණය කොන්දේසි, තැන්පතු, ණය ප්‍රමිතිය, ණය සීමාවන්, තොරතුරු අවශ්‍යතා, ණය එකතු කිරිමේ ප්‍රතිපත්තිය වැනි ණය පරිපාලනයට අදාළ සාධක කල්පසු වූ ණය අයකර ගැනිමට සම්බන්ධයක් දක්වන බවයි. එමෙන්ම, ණය අවදානම් කළමනාකරණය හා කල්පසු වූ ණය අයකරගැනීම අතර 0.213 ක ධන සම්බන්ධතාවයක් පෙන්වන ලදි. මින් ගම්‍ය වන්නේ බැංකු ශාඛා කළමනාකරුවන් විසින් අවදානම් හඳුනාගැනීම, අවදානම් විශ්ලේෂණය, ප්‍රතිචාර සැලසුම් කිරීම, අවදානම අවම කිරිම වැනි කාර්යයන් සෘජුවම කල්පසු වූ ණය අයකරගැනීමට සම්බන්ධතාවයක් දක්වන බවයි. තවද, අක්‍රීය වත්කම් කළමනාකරණය හා කල්පසු වූ ණය අයකර ගැනිම අතර 0.036 ක ඉතා අඩු සම්බන්ධයක් පැවතුනි. ඒ අනුව, සම්මත වත්කම්, උපසම්මත වත්කම්, සැක සහිත ණය වැනි අක්‍රීය වත්කම් කළමනාකරණය කිරීමේ කටයුතු කල්පසු ණය සමඟ ඉතා සුළු වශයෙන් සම්බන්ධ වන බවයි. මේ අනුව, ණය ප්‍රදානය කිරීමේ දී, ණය පරිපාලනය, ණය අවදානම් කළමනාකරණය හා අක්‍රීය වත්කම් කළමනාකරණය කෙරෙහි වැඩි අවදානයක් යොමුකිරීම වැදගත් වන අතර ඒ තුළින් කල්පසු ණය ප්‍රමාණය අඩුකිරීමට හැකිබව පර්යේෂණයෙන් හෙළිදරව් විය.



***මූල පද:*** *ණය ප්‍රදානය කිරීමේ ක්‍රියාවලිය, කල්පසු වූ ණය*

# කිරි නිෂ්පාදන සමුපකාර සමිති හරහා දියර කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන වැඩිකිරීම පිළිබඳ සිද්ධි අධ්‍යනය.

ඞී.පී සෝමතිලක[1]
කුමුදු රත්නසිරි[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. වයඹ පළාත.*
*2. සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය*

වයඹ පළාතේ කිරි නිෂ්පාදන සමුපකාර සමිති පාදකකරගෙන සිදු කරන ලද මෙම සිද්ධි අධ්‍යනයේ මූලිකම අරමුණ වූවේ කිරි නිෂ්පාදන සමුපකාර සමිති හරහා දියර කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන වැඩිකරගත හැක්කේ කෙසේද? යන්න පර්යේෂණාත්මකව අධ්‍යනය කිරීමයි. මෙම සිද්ධි අධ්‍යනය සඳහා තෝරාගත් කිරි නිෂ්පාදන සමුපකාර සමිතිවල කිරි නිෂ්පාදනය, නිෂ්පාදන පිරිවැය, වාර්ෂික කිරි අඩුවීම හෝ වැඩිවීම, කිරි ගොවීන් ප්‍රමාණය, එකතු කරන ලද කිරි ප්‍රමාණය, අලෙවි කරන ලද කිරි ප්‍රමාණය වැනි අංශ කෙරෙහි අවධානය යොමුකර ඇත. ඉහත සංගමයේ තොරතුරු පරික්ෂාවෙන් හා සමිති සේවකයින්ගෙන් හා ගොවින් සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡා මඟින් හා ප්‍රශ්නාවලියකින් දත්ත එකතුකර ගන්නා ලදි. තරුණ කොටස් හා වයස අවුරුදු 51ට වැඩි වැඩිහිටියන් කිරි නිෂ්පාදන කර්මාන්තයෙන් ඈත් විම, සියළු ගොවීන් හට වසර පුරා කිරි සැපයිය නොහැකි විම, නියැදියේ බහුතර ගොවින් කිරි ලිටර් 20 කට වඩා අඩු පරිමාවකින් ලබාගැනීම, කර්මාන්තයේ දියුණුව සහ පැවැත්ම සඳහා අවශ්‍ය දැනුම, කුසලතා නොමැති වීම හා අනවබෝධය, කිරි ආශ්‍රිත වෙනත් නිෂ්පාදන වලට ගොවියා යොමු වීම අඩු වීම වැනි ගැටළු වයඹ පළාතේ කිරි නිෂ්පාදන සමුපකාර සමිති ආශ්‍රිතව පැන නැඟී ඇත. කිරි නිෂ්පාදන සමුපකාර සමිති හරහා දියර කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන වැඩිකිරීමට නම් ඉහත ගැටළු වලට විසඳුම් ලබාදිය යුතු බව අධ්‍යනය තුළින් අනාවරණය විය. කිරි නිෂ්පාදනයට නව තාක්ෂණය මුසුකොට තරුණ ප්‍රජාව මේ සඳහා ආකර්ෂණය කළ හැකි වැඩපිළිවෙලක් සමුපකාර සමිතිය හරහා සැකසීම, ගොවීන්ට ඍජුවම තම දියරකිරි නිෂ්පාදකයාට අලෙවිකළ හැකි ක්‍රමවේදයක් සැකසීම, දියර කිරි නිෂ්පාදනය පිළිබඳව නිරන්තරයෙන් ගොවීන් පුහුණු කිරිම වැනි නිර්දේශ කිහිපයක් අධ්‍යනය අවසානයේ දී පර්යේෂක විසින් නිර්දේශ කරන ලදි.

***මූල පද:** කිරි නිෂ්පාදන සමුපකාර සමිති, දියර කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන*

# කෝප්සිටි වෙළඳසැල්හී සේවා ගුණාත්මකභාවය පාරිභෝගික ලබැඳියාව ගොඩනඟා ගැනීමට බලපාන ආකාරය.

**(සී/ස හිරියාල විවිධ සේවා සමුපකාර සමිතිය ඇසුරින් කරන සිද්ධි අධ්‍යනය)**


එම්.කේ වීරසිංහ[1]
නන්දන බී. හපුආරච්චි[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. ඌව පළාත.*
*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය*



මෙම පර්යේෂණයේ අරමුණ වූවේ කෝප්සිටි වෙළඳසැල්හී සේවා ගුණාත්මකභාවය පාරිභෝගික ලබැඳියාව සඳහා බලපාන ආකාරය කෙසේද? යන්න අධ්‍යනය කිරිමයි. ද්විතීයික අරමුණ වූවේ කෝප්සිටි වලින් ලබාදෙන සේවා ගුණාත්මකභාවය හා පාරිභෝගික ලබැඳියාව අතර පවතින සම්බන්ධය අධ්‍යනය කිරීම හා කෝප්සිටි මඟින් ගුණාත්මක පාරිභෝගික සේවාවක් ලබාදීමට අවශ්‍ය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමත් වේ. මෙම පර්යේෂණය බදුල්ල දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිතිවල කෝප්සිටි ඇසුරින් සිදුකරන ලදි. සාහිත්‍ය විමර්ෂණය අනුව අනාවරණය වූවේ සේවා ගුණාත්මකභාවය සහ පාරිභෝගික ලබැඳියාව අතර සැලකියයුතු සම්බන්ධයක් පවතින බවයි. පර්යේෂණ නියැදිය ලෙස 100 දෙනෙකු පහසු නියැදීම් ක්‍රමය අනුව තෝරාගෙන සේවා ගුණාත්මකභාවය හා පාරිභෝගික ලබැඳියාව පිළිබඳ සකස්කළ ප්‍රශ්නාවලියක් මඟින් දත්ත රැස් කෙරුණි. දත්ත විශ්ලේෂණයට අනුව සේවා ගුණාත්මකභාවය හා පාරිභෝගික ලබැඳියාව අතර 0.669 ක ඉතා ප්‍රභල ධන සම්බන්ධයක් පවතී. එනම් සේවා ගුණත්වයට අදාළ මානයන් වන ස්පර්ශ කළහැකි බව, විශ්වාසනීය බව, ප්‍රතිචාර දැක්වීම, සහතික වීම හා සහකම්පනය යන මානයන් පාරිභෝගික ලබැඳියාව කෙරෙහි ධනාත්මකව බලපාන බවයි. මෙම අධ්‍යනයෙන් තහවුරු වී ඇත්තේ කෝප්සිටි වල සේවා ගුණත්වය හා පාරිභෝගික ලබැඳියාව පහළ මට්ටමක පවතින බවයි. ඒ අනුව, විවිධ සේවා සමුපකාර සමිති සේවා ගුණත්වය වර්ධනය කරමින් ලබැඳියාවෙන් යුතු පාරිභෝගික පිරිසක් නිර්මාණය කර ගැනීමට කටයුතු කළ යුතු වේ.



***මූල පද:*** *කෝප්සිටි වෙළඳසැල්, සේවා ගුණාත්මකභාවය, පාරිභෝගික ලබැඳියාව*

# වියපත් සමුපකාර සාමාජිකත්වය හා නායකත්වය සමුපකාර ව්‍යාපාරයේ අනාගත පැවැත්මට සිදුකරනු ලබන බලපෑම පිළිබඳ අධ්‍යනය.

එස්.සී. පොන්සේකා[1]
චරිත් අමරසේකර[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව.* (බස්නාහිර)
*2. සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.*

සමුපකාර ව්‍යාපාරය සමඟ නිරන්තරයෙන් සම්බන්ධතා පවත්වමින් කටයුතු කරන විට පෙනීයන කරුණක් ලෙස වියපත් සමුපකාර සාමාජිකත්වය හා නායකත්වය හඳුනාගත හැකිය. බහුතරයක් සමුපකාර සමිති වල මහාසභා රැස්වීම් වලට සහභාගී වන්නේ බොහෝදුරට වයස 40 පමණ ඉක්මවූ කණ්ඩායම්ය. ඒ අතර වයස අවුරුදු 18-35 අතර කණ්ඩායම ඉතාමත් සුළු ප්‍රමාණයක් බව පෙනීයයි. එකී තතත්වය තුළ වියපත් කණ්ඩායම් සමඟ දෙවන පෙළ නායකත්වයට තරුණ කණ්ඩායම් සම්බන්ධ නොවීම හා ඒ මත සමුපකාර ව්‍යාපාරයේ අනාගත පැවැත්ම තීරණය වන ආකාරය පිළිබඳව අධ්‍යනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. කළුතර දිස්ත්‍රික්කයේ තෝරාගත් සමුපකාර සංවිධාන කිහිපයක සාමාජිකයින් ඇසුරින් සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලියක් මඟින් දත්ත රැස්කරමින් මෙම අධ්‍යනය සිදුකරන ලදි. තරුණ කණ්ඩායම් ණය අවශ්‍යතාවයට පමණක් සමිතිය වටා ඒකරාශී වීම, තරුණ පිරිස් වල කාර්යබහුලබව, නායකත්වය ලබා ගැනීමට තරුණ පිරිස් අකමැති වීම, සමිති මඟින් දෙවන පෙළ නායකත්වයක් පුහුණු නොකිරීම, දේශපාලනීකරණය, පිරිමි අයවළුන් සමිති වල සාමාජිකත්වය ලබා ගැනීම අඩු වීම වැනි කාරණා තරුණ ප්‍රජාව සමුපකාර ව්‍යාපාර වල නායකත්වයට නොපැමිණීමට හේතු වී ඇත. පාසල් සමුපකාර සමිති ප්‍රවර්ධනය කිරීම, තරුණ ප්‍රජාවට නායකත්වය ලබාගත හැකි ලෙස නීති වෙනස් කිරීම, දෙවන පෙළ නායකත්වයක් සඳහා සමිති තුළින් තරුණ සාමාජිකයින් පුහුණු කිරීම වැනි දෑ අධ්‍යනය අවසානයේදී පර්යේෂක විසින් ලබාදෙන ලදි. තරුණ ප්‍රජාව සමුපකාර ව්‍යාපාර වෙත ආකර්ෂණය වීම මත මෙම ව්‍යාපාරය අඛණ්ඩ පැවැත්මක් සහිතව ගලායන බව සාක්ෂාත් වේ.

***මූල පද:*** *වියපත් සමුපකාර සාමාජිකත්වය, තරුණ නායකත්වය, අඛණ්ඩ පැවැත්ම*

# ශ්‍රී ලංකාවේ සමුපකාර භාවිතය හා එහි යහපාලනය පිළිබඳ විශ්ලේෂණාත්මක විග්‍රහයක්.

(හලාවත හා මාදම්පේ සමුපකාර සංවර්ධන ප්‍රාදේශීය නිළධාරී කොට්ඨාසවල සමුපකාර සමිති ඇසුරින්.)


වී.ඒ පෙරේරා[1]
කුමුදු රත්නසිරි[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. වයඹ පළාත.*
*2. සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය*



මෙම පර්යේෂණයේ අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ සමුපකාර භාවිතය හා එහි යහපාලනය සමුපකාර ව්‍යාපාරයේ දියුණුව හා සංවර්ධනය උදෙසා බලපාන අයුරු විග්‍රහකර බැලීමයි. සාහිත්‍ය විමර්ෂණයේදී අනාවරණය වූවේ සමුපකාර භාවිතය හා එහි යහපාලනය අතර මනා සහසම්බන්ධයක් පවතින බවයි. දත්ත රැස්කිරීම ප්‍රශ්නාවලියක් මඟින් සිදුකළ අතර දත්ත විශ්ලේෂණයට අනුව, සමුපකාර භාවිතය හා යහපාලනය අතර 0.998 ක ඉතා ප්‍රභල ධන සහසම්බන්ධයක් පවතින බව අනාවරණය විය. සමුපකාර සමිති සාර්ථක වීම සඳහා රොච්ඩේල් පුරෝගාමීන්ගේ දර්ශණය මත පදනම්ව එම හර පද්ධතිය රැක ගනිමින් වෙනස්වන පරිසරයට අනුගත වෙමින් ගමන් කළයුතුව ඇත. සම්මුඛ සාකච්ඡා තුළින් සමුපකාර අභියෝග ජයගැනීම සඳහා වූ මාවත පිළිබඳ අදහස් මතු වූ අතර ශ්‍රී ලංකාවේ සමුපකාර භාවිතය යහපාලනයෙන් වූ භාවිතයක් බවට පත් කිරීම සඳහා නව නිෂ්පාදන හා තාක්ෂණය සඳහා වැඩි අවධානයක් යොමුකිරීම, අනවශ්‍ය දේශපාලන මැදිහත් වීම් පිටුදැකීම, සමුපකාර ව්‍යවසායන් අතර සහයෝගීතාවය පුළුල් කිරීම, සමුපකාර සඳහා වූ වැටුප් ක්‍රම සාධාරණ කිරීම, සමුපකාර සේවාවල ගුණත්වය වැඩි කිරීම, සමුපකාර නීතිය යාවත්කාලීන කිරීම, සමුපකාර සංවර්ධනය උදෙසා පුළුල් අධ්‍යාපන වැඩසටහන් ප්‍රවර්ධනය වැනි කටයුතු වල නිරත වීමට පර්යේෂණය අවසානයේදී නිර්දේශ ලෙස ලබාදෙන ලදි.



***මූල පද:** සමුපකාර භාවිතය, යහපාලනය*

# කාර්යක්ෂම ග්‍රාමීය ණය අවශ්‍යතා සපුරාලීමට ස.ණ.ස සමිති ව්‍යාපාරය සංවිධානය වියයුතු ආකාරය හඳුනාගැනීම.

ඒ.සී සමරදිවාකර[1]
අජිත් අමරකීර්ති[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. වයඹ පළාත*
*2. අධ්‍යක්ෂ (අධ්‍යන හා සංවර්ධන), ජාතික සමුපකාර සංවර්ධන ආයතනය*

මෙම පර්යේෂණයේ අරමුණ වූවේ කාර්යක්ෂම ග්‍රාමීය ණය අවශ්‍යතා සපුරාලීමට ස.ණ.ස සමිති ව්‍යාපාරය සංවිධානය වියයුතු ආකාරය හඳුනාගැනීමයි. මෙම අධ්‍යනය තුළින් ග්‍රාමීය ණය අවශ්‍යතා සපුරාලීමේ දී ස.ණ.ස සමිති ව්‍යාපාරයේ කාර්යභාරය තවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කර ඇත. මෙම අධ්‍යනය සඳහා සී/ස මත්තේගම ස.ණ.ස සමිතියේ සාමාජිකයින් පාදක කරගත් අතර ඉන් 50 දෙනෙකු නියැදිය ලෙස තෝරා ගනිමින් ප්‍රශ්නාවලියක් මඟින් දත්ත එකතු කරන ලදි. දත්ත විශ්ලේෂණයට අනුව, මෙම සමිතියෙන් වැඩිපුරම ණය ලබාගෙන ඇත්තේ වයස අවුරුදු 19-40 අතර ස්ත්‍රී අයවළුන් වේ. ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම සලකා බැලීමේ දී බහුතරයක් දෙනා ප්‍රාථමික අධ්‍යාපනය ලබා ඇති බව තහවුරු විය. ණය ලබාගත් බහුතරය කෘෂිකාර්මික කටයුතු වල නිරත වේ. ණය ලබාගත් බහුතරය මාසිකව රු.25,000-30,000 ත් අතර උපයන අයවළුන් වේ. සමිතිය අයකරන පොලී ප්‍රතිශතය ඉතා සාධාරණ බව 90% ක් දෙනා ප්‍රකාශ කරන ලදි. නියැදියේ 80%ක් දෙනා ස.ණ.ස සමිතිය පිළිබඳව ඉතා සතුටුදායක ආකල්පයක සිටී. එමෙන්ම, ණය ලබාගැනීම තුළින් ආර්ථික දියුණුවක් ලබා ඇති බවට 75% ක් දෙනා ප්‍රකාශ කරන ලදි. කාර්යක්ෂම ග්‍රාමීය ණය අවශ්‍යතා සපුරාලීමට ස.ණ.ස සමිති ව්‍යාපාරය සංවිධානය වීමට නම්, තරඟකාරී ප්‍රචාරණ ක්‍රම අනුගමනය කරමින් ණය ලබා දීමටත්, පාරිභෝගිකයා තෘප්තිමත් වන අයුරින් ලිහිල් ණය කොන්දේසි පවත්වාගෙන යාමටත්, පුද්ගලික ඇප තබාගැනීම ලිහිල් කිරීමටත්, සහනදායී පොලී ක්‍රමයක් අනුගමනය කිරීමටත්, සමාජ සුභසාධන කටයුතු වල නිරත වීමට හා සාමාජිකයාගේ අභිවෘර්ධිය මූලිකකරගෙන කටයුතු කිරීමටත් පර්යේෂණය අවසානයේ දී නිර්දේශ ලෙස ලබාදෙන ලදි.

***මූල පද:*** *ග්‍රාමීය ණය අවශ්‍යතාවය, ස.ණ.ස සමිති, සාමාජික අභිවෘර්ධිය*

# කොවිඩ් 19 අභියෝගය හමුවේ කිරි නිෂ්පාදන සමුපකාර සමිති මුහුණ දෙන ගැටළු පිළිබඳ අධ්‍යනයක්.

එම්.ජ රත්නායක[1]
කුමුදු රත්නසිරි[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. ඌව පළාත.*
*2. සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය*

මෙම පර්යේෂණයේ අරමුණ වූයේ කොවිඩ් 19 අභියෝගය හමුවේ කිරි නිෂ්පාදන සමුපකාර සමිති මුහුණ දෙන ගැටළු අධ්‍යනය කිරිමයි. සාහිත්‍ය විමර්ෂණයට අනුව තිරසාර කිරි නිෂ්පාදනයක් සඳහා ස්වාභාවික සම්පත්/ පරිසරය, පාරිභෝගිකයින්, විධිමත් කිරි වෙළඳපල සහ යෙදවුම් හා සහය සේවා අවශ්‍යය වන බව හෙළිදරව් විය. මෙම පර්යේෂණයේ නියැදිය ලෙස බදුල්ල දිස්ත්‍රික්කයේ ලියාපදිංචි කිරි නිෂ්පාදන සමිති වල සාමාජිකයින් 350 ක් තෝරාගන්නා ලදි. ප්‍රශ්නාවලි සහ සහභාගීත්ව නිරික්ෂණ මඟින් දත්ත එකතුකර ගන්නා ලදි. දත්ත විශ්ලේෂණයට අනුව, ගුණාත්මක බවෙන් යුතු කිරිගවයින් ලබා ගැනීම අපහසු වීම, ගවයන්ට ලබාදෙන ආහාර වර්ග නිතර වෙනස් වීම, කිරි නිෂ්පාදන කර්මාන්තයේ නිරත වන අයට ඇති සමාජ පිළිගැනිම අඩු වීම, කිරි කර්මාන්තය සඳහා පිළිගත් පාඨමාලා නොමැති වීම (NVQ), රජය විසින් වරින්වර නියම කරන නීති, රෙගුලාසි කොවිඩ් 19 අභියෝගය හමුවේ කිරි නිෂ්පාදන සමුපකාර සමිති මුහුණ දෙන ගැටළු ලෙස හඳුනාගන්නා ලදි.

***මූල පද:*** *කිරි නිෂ්පාදන සමුපකාර සමිති, අභියෝග*

# කෝප්සිටි වෙළඳසැල් තුළ ක්‍රියාත්මක අලෙවිකරණ උපායමාර්ග පාරිභෝගික තෘප්තියට කර ඇති බලපෑම හඳුනාගැනීම.

ඩබ්.පී විජේරත්න[1]
නන්දන බී. හපුආරච්චි[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. වයඹ පළාත.*
*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය*

මෙම පර්යේෂණයේ අරමුණ වූවේ කෝප්සිටි වෙළඳසැල් තුළ ක්‍රියාත්මක අලෙවිකරණ උපායමාර්ග පාරිභෝගික තෘප්තියට කර ඇති බලපෑම හඳුනාගැනීමයි. මේ සඳහා කෝප්සිටි ව්‍යාපාරයේ වර්තමාන ක්‍රියාකාරිත්වය පිළිබඳ අධ්‍යනය කර ඇත. මේ සඳහා කටුගම්පොළ විවිධ සේවා සමුපකාර සමිතියට අයත් පන්නල කෝප්සිටි වෙළඳසැලට පැමිණෙන පාරිභෝගිකයින් 100 දෙනෙකු යොදාගන්නා ලදි. දත්ත විශ්ලේෂණයට අනුව මෙම කෝප්සිටිය සඳහා වැඩිමනක් පැමිණෙන්නේ ස්ත්‍රී පාර්ශවය බව නිරීක්ෂණය විය. ඒ අතුරින් බහුතරය ද්වීතීයික අධ්‍යාපනය ලබා ඇති බව තහවුරු විය. මෙම කෝප්සිටි වෙළඳසැලෙන් භාණ්ඩ මිලදී ගන්නා බහුතරය සාමාජික නොවන පාරිභෝගිකයින් බවද තහවුරු විය. වෙළඳසැල මඟින් පාරිභෝගිකයින්ට සපයන ලද සේවාව පිළිබඳව 58% ක් දෙනා තරමක් සතුටුදායක වන අතර වාහන නැවැත් විමේ පහසුකම් පිළිබඳව 76% ක් දෙනා සතුටුදායක මට්ටමක සිටින ලදි. වෙළඳසැලේ අභ්‍යන්තර ආලෝකය පිළිබඳව 88% ක් යහපත් ප්‍රතිචාර දක්වා තිබුනි. භාණ්ඩ ස්ථානගත කිරීම පිළිබඳව බහුතරයක් දෙනා හොඳ ප්‍රතිචාර දක්වා නොතිබුනි. නව භාණ්ඩ හඳුන්වා දීම ද දුර්වල බව ප්‍රකාශ කරන ලදි. මේ අනුව කෝප්සිටි වෙළඳසැල් වලට එන පාරිභෝගිකයා මධ්‍යස්ථව තෘප්තිමත් වන බව මෙහිදී අනාවරණය විය. මේ අනුව, ඉදිරියේ දී කෝප්සිටි වෙළඳසැල් තුළ ක්‍රියාත්මක අලෙවිකරණ උපායමාර්ග පාරිභෝගික තෘප්තිය අරඹයා ගොඩනැංවීමට අවධානය යොමුකළ යුතු බව පර්යේෂණයෙන් තහවුරු කරයි.

***මූල පද:*** *කෝප්සිටි වෙළඳසැල්, අලෙවිකරණ උපායමාර්ග*

# සමුපකාර ව්‍යාපාරය තුළ අනාගත නායකයින් බිහිවීම සඳහා පාසල් සමුපකාර සමිතිවල දායකත්වය.

එම්.ස පියතිලක[1]
කුමුදු රත්නසිරි[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. ඌව පළාත.*
*2. සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය*

සමුපකාර ව්‍යාපාරය තුළ අනාගත නායකයින් බිහිවීම සඳහා පාසල් සමුපකාර සමිතිවල දායකත්වය කෙබඳු ද යන්න අධ්‍යනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. අධ්‍යනය ගුණාත්මක ක්‍රමවේදයට අනුව සැලසුම්කරන ලද අතර ප්‍රශ්නාවලියක් භාවිතයෙන් ප්‍රාථමික දත්ත එකතුකරන ලදි. ඌව පළාතේ පාසල් සමුපකාර සමිති නියෝජනය කරන සිසුන් 250 ක් හා ගරු සභාපතිවරුන් (විදුහල්පතිවරුන්) 10 දෙනෙකු නියැදිය ලෙස තෝරාගන්නා ලදි. දැනට ඌව පළාතේ පාසල් සමුපකාර සමිතිවලින් ක්‍රියාත්මක වන්නේ 36% ක ප්‍රමාණයකි. ලබා දී ඇති පිළිතුරු ප්‍රකාරව සමුපකාර ව්‍යාපාරය හා එහි ක්‍රියාකාරීත්වය පිළිබඳව පාසල් සිසුන් අතර ඇති දැනුම අල්ප බව හෙළිදරව් විය. පාසල් සමුපකාර සමිති වල ගරු සභාපතිවරුන්ගේ පිළිතුරු අනුව ඔවුන් සමුපකාර ව්‍යාපාරය තුළින් වැඩි සේවයක් සිසුන් හට සිදුකිරීමට බලාපොරොත්තු වන අතර ඒ සඳහා කාලය, රාජකාරී වල පවතින සංකීර්ණ බව, රටේ අර්බුධකාරී බව බාධාවක් වී ඇති බව සඳහන් කරන ලදි. මෙකී තත්වයක් තුළ අනාගත සමුපකාර නායකයින් බිහිකිරීමෙහි ලා පාසල් සමුපකාර සමිති සැලකියයුතු කාර්යභාරයක් ඉටුකරනු ලබයි. පර්යේෂණයට අනුව කාලානුරූපීව පාසල් සමුපකාර සමිති දුර්වල වන බව පෙනෙන්නට ඇත. දැනට අක්‍රීයව පවතින පාසල් සමුපකාර සමිති ඉදිරියේදී සක්‍රීය කර පවත්වාගෙන යාමටත්, සමුපකාර සංකල්පය පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කර තවදුරටත් සංවර්ධනය කළයුතු බවත්, පාසල් සමුපකාරය හා බැඳී සිටින දරුවන් දිරිගැන්වීම හා ඇගයීම සිදුකළ යුතු බවත්, නව පාසල් සමුපකාර සමිති ආරම්භ කිරීමටත් පර්යේෂණය අවසානයේ දී පර්යේෂක නිර්දේශ කරයි.

***මූල පද:*** *පාසල් සමුපකාර සමිති, අනාගත නායකයින්*

# පොල් ත්‍රිකෝණය තුළ දේශීය කිරි කර්මාන්තයේ සංවර්ධනයට සමුපකාරයේ දායකත්වය.


අ.ප්‍ර සත්කුමාර[1]
කුමුදු රත්නසිරි[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. වයඹ පළාත.*
*2. සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය*



පොල් ත්‍රිකෝණය තුළ දේශීය කිරි කර්මාන්තයේ සංවර්ධනයට සමුපකාරයේ දායකත්වය අගය කිරිමේ අරමුණින් මෙම පර්යේෂණය සිදුකරන ලදි. සමුපකාරය කිරි මිලදී ගැනීම තුළින් ගොවියාට ඉටු වී ඇති සාධාරණය අගය කිරීමත්, කිරි නිෂ්පාදන අලෙවි කිරීම තුළින් පාරිභෝගිකයා තෘප්තිමත් වී ඇති ආකාරය සොයා බැලීමත් මෙම අධ්‍යනයේ උප අරමුණු විය. මෙම අධ්‍යනයේ සංගහනය ලෙස පොල් ත්‍රිකෝණය තුළ කිරි නිපදවන ගොවීන් 500 දෙනෙකු හඳුනාගත් අතර ඉන් 45 දෙනෙකු අහඹු ලෙස නියැදිය ලෙස තෝරාගෙන ප්‍රශ්නාවලියක් හා සහභාගීත්ව නිරීක්ෂණ මගින් දත්ත එකතු කරන ලදි. දත්ත විශ්ලේෂණය අනුව නියැදියෙන් 64% ක් සංගමය කිරි සඳහා ගෙවන මිල පිළිබඳව සෑහීමකට පත්වන අතර 84% ක් ගැනුම් මිල පිළිබඳව සතුටු වන බවත්, 80% සංගමයෙන් ලැබෙන ප්‍රතිලාභ සහ පශු වෛද්‍ය සේවා සම්බන්ධයෙන් සතුටු වන බවත් ප්‍රකාශ කරන ලදි. සංගමයෙන් නිෂ්පාදනය කරන නිෂ්පාදිත ගුණාත්මක මට්ටමක පවතින බව 60% ක් ප්‍රකාශ කරන ලදි. වෙළඳපල මිලට වඩා අඩු මිලකට සංගමයෙන් නිෂ්පාදන අලෙවිකරන බවද බහුතරයක් පැවසීය. ඒ අනුව, සමුපකාර ප්‍රතිපත්ති සහ ආචාරධර්ම වලට මුල්තැන දෙමින් පොල් ත්‍රිකෝණය තුළ දේශීය කිරි කර්මාන්තයේ සංවර්ධනයට සී/ස පොල් ත්‍රිකෝණයේ කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය ප්‍රමාණවත් දායකත්වයක් ලබාදී ඇති බව පර්යේෂණයෙන් අනාවරණය විය. කිරි නිෂ්පාදන ක්‍රියාවලිය හා ගුණත්වය මැනීම සඳහා නව තාක්ෂණය භාවිතා කිරීමටත්, කිරි ගොවීන් වෙත තාක්ෂණික සේවාවන් ලබාදීමටත්, සේවක ආකල්ප සංවර්ධනය සඳහා කටයුතු කිරීමටත් පර්යේෂක නිර්දේශ කරයි.



***මූල පද:*** *පොල් ත්‍රිකෝණය, දේශීය කිරි කර්මාන්තය*

# සේවක අභිප්‍රේරණ ක්‍රියාවලිය විවිධ සේවා සමුපකාර සමිතිවල සේවක කාර්යඵලය කෙරෙහි බලපානු ලබන ආකාරය

(බදුල්ල දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිති ඇසුරින්)

ඩී.එන් දිසානායක[1]
ඩී.එම්.ටී දිසානායක[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. ඌව පළාත*
*2. බාහිර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.*

මෙම පර්යේෂණයේ මූලික අරමුණ වූවේ සේවක අභිප්‍රේරණ ක්‍රියාවලිය විවිධ සේවා සමුපකාර සමිතිවල කාර්යඵලය කෙරෙහි බලපානු ලබන ආකාරය බදුල්ල දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිති ඇසුරින් අධ්‍යනය කිරීමයි. ද්විතීයික අරමුණ වූයේ මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ සේවක අභිප්‍රේරණයට හා කාර්යඵලදායීතාවයට සිදුකරන බලපෑම සොයාබැලීමයි. සාහිත්‍ය විමර්ශණයේදී අනාවරණය වූයේ සේවක අභිප්‍රේරණය හා සේවක කාර්යඵලදායීතාවය අතර සහසම්බන්ධයක් පවතින බවයි. බදුල්ල දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිතිවල සේවකයින් 135 දෙනෙකු නියැදිය ලෙස ගෙන ප්‍රශ්නාවලියක් මාර්ගයෙන් දත්ත එකතුකර ගන්නා ලදි. දත්ත විශ්ලේෂණයෙන් ගම්‍ය වූයේ සේවකයන්ට ලබාදෙන මූල්‍ය ප්‍රතිලාභ සහ සේවක කාර්යඵලදායීතාවය ප්‍රභල සහසම්බන්ධයක් පවතින බවයි. එහිදි, සේවක වැටුප්, දිරි දිමනා, අතිකාල දීමනා වැනි මූල්‍ය ප්‍රතිලාභ මඟින් සේවකයා අභිප්‍රේරණය වන බවත් ඒ තුළින් කාර්යඵලදායීතාවය ඉහළයන බවත් තහවුරු විය. එලෙසම, සේවයට බැඳුනු නවකයින් මූල්‍ය ප්‍රතිලාභ කෙරෙහි වැඩි උනන්දුවක් දක්වන බවද පර්යේෂණයෙන් හෙළිදරව් විය. ඊට අමතරව, මූල්‍ය නොවන ප්‍රතිලාභ සහ සේවක කාර්යඵලදායීතාවය අතර ප්‍රභල සහසම්බන්ධයක් පවතින බව ද අධ්‍යනයෙන් හෙළිදරව් විය. වයස අවුරුදු 40 ට වැඩි අයවළුන් මෙම මූල්‍ය නොවන ප්‍රතිලාභ කෙරෙහි වැඩි අවධානයක් යොමුකරන බවද හෙළිදරව් විය. ඒ අනුව, සේවකයින් නිසි පරිදි ඇගයීම, සුදුසු වැඩ පරිසරයක් ලබා දීම, සනීපාරක්ෂක පහසුකම් හා ආරක්ෂාව වැනි සාධක ද සේවක කාර්යඵලය ඉහළ නැංවීමට උපකාරී වන බව අධ්‍යනයෙන් හෙළිදරව් විය. ඒ අනුව, සේවකයින්ට ගැලපෙන හා සාධාරණ යැයි හැඟෙන මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ සැලසුමකට අනුව ලබාදීමෙන් සේවක කාර්යඵලදායීතාවය වැඩිකරගැනීමට හැකි බව පර්යේෂණයෙන් පැහැදිලි විය.

***මූල පද:*** *සේවක අභිප්‍රේරණය, සේවක කාර්යඵලය, මූල්‍ය හා මූල්‍ය නොවන*

# සේවක පුහුණුව හා සංවර්ධනය විවිධ සේවා සමුපකාර සමිතිවල කාර්යසාධන අභිවෘද්ධිය කෙරෙහි ඇති බලපෑම

සී.ඩී විජයරත්න[1]
ඩී.එම්.ටී දිසානායක[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. ඌව පළාත*
*2. බාහිර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.*

මෙම පර්යේෂණයේ මූලික අරමුණ වූවේ සේවක පුහුණුව හා සංවර්ධනය විවිධ සේවා සමුපකාර සමිතිවල කාර්යසාධන අභිවෘද්ධිය කෙරෙහි ඇති බලපෑම විග්‍රහ කිරීමයි. මේ සඳහා බදුල්ල දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිති දෙකක් තෝරාගෙන එහි සේවකයින් 100 දෙනෙකු නියැදිය ලෙස ගෙන ප්‍රශ්නාවලි මාර්ගයෙන් දත්ත එකතුකර ගන්නා ලදි. දත්ත විශ්ලේෂණය අනුව, සේවකයින්ට ලබා දෙන පුහුණුව පිලිබඳව ප්‍රමාණවත් දැනුමක් ඉහළ කළමනාකාරිත්වය සතුව නොමැති බව තහවුරු විය. සමුපකාර දෙපාර්තමේන්තුව මඟින් සමුපකාර සමිති සඳහා ප්‍රමාණවත් පරිදි පුහුණු වැඩසටහන් සිදුනොකරන බවද අනාවරණය විය. ප්‍රතිචාර ලබා දී ඇති බහුතරයක් සඳහන් කර ඇත්තේ දැනට සමිති විසින් ලබා දෙන පුහුණුව හා සංවර්ධනයට මධ්‍යස්ථ ලෙස එකඟවන බවයි. ඒ අනුව, පැහැදිලි වන්නේ දැනට විවිධ සේවා සමුපකාර සමිති තම සේවකයින්ට ලබාදෙනු ලබන පුහුණුව හා සංවර්ධනය කාලීන වශයෙන් වෙනස් වියයුතු බවත් එමඟින් සමිතිවල කාර්යසාධන අභිවෘද්ධිය වැඩිකිරීමට පියවර ගතයුතු බවත්ය.

***මූල පද:*** *සේවක පුහුණුව හා සංවර්ධනය, කාර්යසාධන අභිවෘද්ධිය*

# සමුපකාර සේවකයින් සිය සේවාවන්ගෙන් ඉවත්වීම කෙරෙහි සේවක අභිප්‍රේරණ ක්‍රියාවලිය බලපාන ආකාරය.

(සී/ස මොණරාගල විවිධ සේවා සමුපකාර සමිතිය ඇසුරින්)


එම්.එම් දිසානායක[1]
ඩී.එම්.ටී දිසානායක[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. ඌව පළාත*
*2. බාහිර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.*



සමුපකාර සේවකයින් සිය සේවාවන්ගෙන් ඉවත්වීම කෙරෙහි සේවක අභිප්‍රේරණ ක්‍රියාවලිය බලපාන ආකාරය හඳුනාගැනීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය. සමුපකාර සේවකයින් සේවයෙන් ඉවත් වීමට බලපාන හේතු හඳුනාගැනීමත්, සමිතියේ සේවකයින් නිවැරදිව අභිප්‍රේරණය කිරීම සඳහා සිදුකළ හැක්කේ මොනවාද යන්න හඳුනාගැනීමත් මෙම අධ්‍යනයේ ද්විතීයික අරමුණ විය. සී/ස මොණරාගල විවිධ සේවා සමුපකාර සමිතිය පාදක කර ගනිමින් සිද්ධි අධ්‍යනයක් ලෙස මෙම පර්යේෂණය සිදුකරන ලදි. මෙම සමිතියේ සේවකින් 45 දෙනෙකු නියැදිය ලෙස ලබාගනිමින් ගුණාත්මක ප්‍රශ්නාවලියක් භාවිතයෙන් දත්ත එකතුකර ගන්නා ලදි. සමුපකාර සේවකයින් සිය සේවාවන්ගෙන් ඉවත්වීම කෙරෙහි සේවක අභිප්‍රේරණය සෘජුව බලපාන බව දත්ත විශ්ලේෂණයෙන් හෙළිදරව් විය. අඩු වැටුප් ලැබීම, රැකියා ස්ථානය ප්‍රියජනක නොවීම, වැඩ අධිකබව හා අපිළිවෙල, තාක්ෂණය හා ක්‍රියාවලීන් යල්පැන තිබීම, කළමනාකරණයේ දුර්වලතා, වැටුපට අමතරව වෙනත් ප්‍රතිලාභ නොමැති වීම, රැකියා තෘප්තිය නොමැති වීම හා රැකියාවේ අනාරක්ෂිත බව මෙම සමිතියේ සේවකයින් කෙටිකලක් තුළ සේවයෙන් ඉවත්ව යාමට බලපා ඇත. සේවකයින් අභිප්‍රේරණය කිරීම සඳහා නිවැරදි මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ ක්‍රමවේදයක් හඳුන්වාදීමටත්, නිවැරදිව වැඩ බෙදීම, නව තාක්ෂණය සමිතියට ලබා දීම වැනි කාරණා සිදුකිරීමට අධ්‍යනය මඟින් නිර්දේශ කරන ලදි.



***මූල පද:*** *සේවයෙන් ඉවත්වීම, සේවක අභිප්‍රේරණ ක්‍රියාවලිය*

## සමුපකාර ව්‍යාපාරය තුළ අනාවරණය වන මූල්‍ය වංචා හා දූෂණ වලට අදාළ මුදල් අයකරගැනීමේ නෛතික ක්‍රමවේදයේ ඇති ගැටළු අධ්‍යනය.

එච්.කේ.සේපාලි[1]
දිනූෂ දිසානායක[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව.* (වයඹ)
*2. සහකාර පර්යේෂක, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.*

මෙම පර්යේෂණයේ අරමුණ වූවේ සමුපකාර ව්‍යාපාරය තුළ අනාවරණය වන මූල්‍ය වංචා හා දූෂණ වලට අදාළ මුදල් අයකරගැනීමේ නෛතික ක්‍රමවේදයේ ඇති ගැටළු අධ්‍යනය කිරීමයි. නෛතික විධිවිධාන තුළින් යොදාගතහැකි වඩාත් කාර්යක්ෂම ක්‍රමවේදය හඳුනාගැනීමත්, මූල්‍ය, වංචා හා දූෂණ වලට අදාළ මුදල් අයකර ගැනීම වඩා කාර්යක්ෂම කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමත් මෙම අධ්‍යනයේ උප අරමුණු විය. වයඹ පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව තුළ උසාවි නිළධාරීන්, විමර්ශන නිළධාරීන්, සමුපකාර සමිති සභාපතිවරුන්, සාමාන්‍යාධිකාරීවරුන් හා විගණකයින් ඇතුළු 120 දෙනෙකුගෙන් මේ සඳහා දත්ත එකතුකර ගන්නා ලදි. දත්ත විශ්ලේෂණය අනුව තහවුරු වූයේ සමුපකාර සමිතිවල වංචා හා දූෂණ සිදුවීමට මූලික ලෙසම බලපාන්නේ අභ්‍යන්තර පාලන දූර්වලතා බවත් ඒ සඳහා සාක්ෂි එකතු කිරීම දුෂ්කර බවත්ය. එමෙන්ම, සංශෝධිත 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ 44 වගන්තිය යටතේ සිදුකරන විගණනය මඟින් හෝ 46 (1) විභාග මඟින් අනාවරණය වන මුදල්, 58 වගන්තිය යටතේ බේරුම්කරණය සඳහා යොමු නොකර 66 වගන්තිය යටතේ අධිභාර ක්‍රියාවලිය මඟින් පමණක් අයකර ගැනීමට කටයුතු කිරිමද, රීතී සංශෝධනය මඟින් සිරගත වීමෙන් පසු මූල්‍ය වංචා හා දූෂණ වලට අදාළ අයවියයුතු මුදල් අයකරගැනිම සඳහා රීතී සංශෝධනය කිරීමටත් පර්යේෂක නිර්දේශ කරයි.

***මූල පද:*** *මූල්‍ය වංචා හා දූෂණ, මුදල් අයකරගැනීම, නෛතික ක්‍රමවේදය*

# සමුපකාර ග්‍රාමීය බැංකුවල ගණුදෙනුකරුවන්ගේ පාරිභෝගික තෘප්තියට බලපාන හේතු පිළිබඳ විශ්ලේෂණයක් සිදුකිරීම.

උ.අයි පෙරේරා[1]
නන්දන බී. හපුආරච්චි[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. ඌව පළාත.*
*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය*

සමුපකාර ග්‍රාමීය බැංකුවල ගණුදෙනුකරුවන්ගේ පාරිභෝගික තෘප්තියට බලපාන හේතු පිළිබඳ විශ්ලේෂණයක් සිදුකිරීමේ අරමුණින් දියත් කෙරුනු මෙම පර්යේෂණයේ ද්විතීයික අරමුණු වූවේ සමුපකාර ග්‍රාමීය බැංකුවල පාරිභෝගික තෘප්තිය අඩුවීම මඟින් සමුපකාර ග්‍රාමීය බැංකුවලට ඇතිවන බලපෑම හඳුනාගැනීම සහ පාරිභෝගික තෘප්තිය වැඩිකර ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමත්ය. අධ්‍යනයෙන් ගොඩනගන ලද සංකල්පීය රාමුව තුළ ස්පර්ෂ කළහැකි බව, විශ්වාසනීයත්වය, ප්‍රතිචාර දැක්වීම, සහතික වීම සහ සහකම්පනය යන විචල්‍යයන් ස්වායත්ත විචල්‍යයන් ලෙස හඳුනාගත් අතර පරායත්ත විචල්‍ය වූවේ පාරිභෝගික තෘප්තියයි. බදුල්ල දිස්ත්‍රික්කයේ තෝරාගත් විවිධ සේවා සමුපකාර සමිති තුනක සාමාජිකයින් 100 දෙනෙකු ස්ථරීකෘත නියැදි ක්‍රමය යටතේ තෝරාගෙන ප්‍රශ්නාවලියක් මඟින් දත්ත එකතුකර ගන්නා ලදි. දත්ත විශ්ලේෂණයට අනුව ස්පර්ෂ කළහැකි බව හා පාරිභෝගික තෘප්තිය අතර 0.853 ක ධන සහසම්බන්ධයක් ද, විශ්වාසනීයත්වය හා පාරිභෝගික තෘප්තිය අතර 0.765 ක ධන සහසම්බන්ධයක් ද, ප්‍රතිචාර දැක්වීම හා පාරිභෝගික තෘප්තිය අතර 0.852 ක ධන සහසම්බන්ධයක් ද, සහතික වීම හා පාරිභෝගික තෘප්තිය අතර 0.798 ක ධන සහසම්බන්ධයක් ද, සහකම්පනය හා පාරිභෝගික තෘප්තිය අතර 0.798 ක ධන සහසම්බන්ධයක් ද දක්නට ලැබුණි. ඒ අනුව පාරිභෝගිකයින් තෘප්තිමත් වීම සඳහා සමුපකාර ග්‍රාමීය බැංකු ඉහත ස්වායත්ත සාධකයන් පිළිබඳව වැඩි සැලකිල්ලක් දැක්විය යුතු බව තහවුරු විය. සමුපකාර ග්‍රාමීය බැංකු ශාඛා ආකර්ෂණීය ලෙස පවත්වාගෙන යාමටත්, මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ යන දෙවර්ගයම ගණුදෙනුකරුවන්ට ලබා දීමටත්, තරඟකාරී අලෙවි උපක්‍රම භාවිතා කිරිමටත් අධ්‍යනය අවසානයේදී පර්යේෂක නිර්දේශ කරන ලදි.

***මූල පද:*** *සමුපකාර ග්‍රාමීය බැංකු, පාරිභෝගික තෘප්තිය*

# විවිධ සේවා සමුපකාර සමිතිවල සාමාජිකයින් පාරිභෝගික වෙළඳසැල් සමඟ කරන ගණුදෙනු අවම මට්ටමක පැවතීමට බලපාන හේතු විශ්ලේෂණය.


එම්.ඒ පද්මසිරි[1]
නන්දන බී. හපුආරච්චි[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. ඌව පළාත.*
*2. ජ්‍යොෂ්ඨ කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය*



විවිධ සේවා සමුපකාර සමිතිවල සාමාජිකයින් පාරිභෝගික වෙළඳසැල් සමඟ කරන ගණුදෙනු අවම මට්ටමක පැවතීමට බලපාන හේතු විශ්ලේෂණය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. සාහිත්‍ය විමර්ෂනයෙන් පසු පාරිභෝගික ආකර්ෂණය සඳහා බලපාන මූල්‍යමය සාධක, මූල්‍යමය නොවන සාධක සහ වෙනත් සාධක ලෙස ස්වායත්ත විචලායයන් තුනක් හඳුනාගන්නා ලදි. මෙහි පරායත්ත විචලා වූවේ පාරිභෝගික ගණුදෙනු වර්ධනයයි. බදුල්ල දිස්ත්‍රිකයේ විවිධ සේවා සමුපකාර සමිතිවල සාමාජිකයින් 379 ක් නියැදිය ලෙස යොදාගනිමින් ප්‍රශ්නාවලියක් මාර්ගයෙන් දත්ත එකතුකර ගන්නා ලදි. දත්ත විශ්ලේෂණය අනුව, විවිධ සේවා සමුපකාර සමිතිවල සාමාජිකයින් පාරිභෝගික වෙළඳසැල් සමඟ කරන ගණුදෙනු අවම මට්ටමක පැවතීමට බලපාන හේතු විශ්ලේෂණයේ දී මූල්‍යමය සාධක යම් බලපෑමක් සිදුකරන බවත්, මූල්‍යමය නොවන සාධක ද ප්‍රමාණවත් බලපෑමක් සිදුකරන බවත්, ඊට අමතරව වෙනත් සාධක ද යම් බලපෑමක් සිදුකරන බව තහවුරු විය. විවිධාංගීකරණය වූ භාණ්ඩ පැසක් තබාගැනීම, භාණ්ඩ සම්මිශ්‍රණයන් යාවත්කාලීන කිරීම, භාණ්ඩ හා සේවාවල ගුණත්වය ඉහළ නංවාගැනීම වැනි යෝජනා කිහිපයක් විවිධ සේවා සමුපකාර සමිතිවල සාමාජිකයින් පාරිභෝගික වෙළඳසැල් සමඟ කරන ගණුදෙනු ඉහළ නංවාගැනීම සඳහා පර්යේෂක විසින් යෝජනා කරයි.



***මූල පද:*** *සාමාජිකයින්, ගණුදෙනු අවම වීම, විවිධ සේවා සමුපකාර සමිති*

# තරඟකාරී ව්‍යාපාර පරිසරය තුළ විවිධ සේවා සමුපකාර සමිති මුහුණ දෙන තත්කාලීන අභියෝග.

පී.එන් රෝහිත[1]
කුමුදු රත්නසිරි[2]

*1. සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. ඌව පළාත.*
*2. සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය*

තරඟකාරී ව්‍යාපාර පරිසරය තුළ විවිධ සේවා සමුපකාර සමිති මුහුණ දෙන තත්කාලීන අභියෝග පිළිබඳව ගුණාත්මක විග්‍රහයක් සිදුකිරීම මෙම පර්යේෂණයේ මූලිකම අරමුණ විය. අධ්‍යනයේ නියැදිය ලෙස අහඹු ලෙස තෝරාගත් සමුපකාරිකයින් 166 දෙනෙකු තෝරා ගෙන ගුණාත්මක ක්‍රමයට සකසන ලද ප්‍රශ්නාවලියකින් දත්ත එකතු කරන ලදි. දත්ත විශ්ලේෂණය ප්‍රකාරව, සමුපකාර ව්‍යාපාරය සඳහා ජාතික ප්‍රතිපත්තියක් නොමැති විම, සමුපකාර සංවිධාන ජාතික සංවර්ධනයට අනුකූලවන ලෙස යොදා නොගැනීම, සමුපකාර නිති රීති යාවත්කාලීන නොවීම, දේශීය සමුපකාර ව්‍යාපාරය පක්ෂ දේශපාලනයෙන් ස්වාධීන නොවීම, සමුපකාර සාමාජිකයින් අතරින් සුළු පිරිසක් සක්‍රීය වීම, දැනට පවතින අඩු වැටුප් හා දීමනා නිසා දැනුම, අත්දැකීම් හා සුදුසුකම් අඩු පිරිසක් සමුපකාර ව්‍යාපාරයේ මානව ප්‍රාග්ධනය වීම, දක්ෂ කළමනාකරණ මණ්ඩල සමුපකාර තුළ දැකිය හැක්කේ අතලොස්සක් වීම, නවීන තාක්ෂණය භාවිතා නොකිරීම, ප්‍රාග්ධන ඌණතා, වංචා, දූෂණ හා අක්‍රමිකතා බහුල වීම, විවෘත ආර්ථික රටාවට මුහුණ දියහැකි ආකාරයට සමුපකාර ව්‍යාපාරය පරිවර්ථනය නොවීම, සමුපකාර ව්‍යාපාරය පිළිබඳව පොදු ජනතාව අතර දැනුම අඩුකම වැනි තත්කාලීන අභියෝගයන් අධ්‍යනය තුළින් පර්යේෂක හඳුනාගන්නා ලදි. සමුපකාර හරහා අගය එකතු කරන ලද නිෂ්පාදන සිදුකිරීම, රටේ ජාතික සංවර්ධනයේ නියමුවා ලෙස කටයුතු කළ හැකි ආකාරයට මෙම ව්‍යාපාරය බලගැන්වීම, ලෝක ප්‍රසිද්ධ සමුපකාර ව්‍යවසායන් සමඟ දේශීය සමුපකාර ව්‍යාපාරය අනුබද්ධ කිරීම, සමුපකාර ව්‍යාපාරය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම, නවෝත්පාදන බිහි කිරීම, අහිතකර දේශපාලන මැදිහත් වීම් ඉවත් කිරීම වැනි දෑ මෙම අභියෝග ජයගැනීම සඳහා සිදුකළ හැකි බව පර්යේෂණ නිර්දේශ ලෙස ලබාදෙන ලදි.

***මූල පද:*** *තරඟකාරී පරිසරය, විවිධ සේවා සමුපකාර සමිති, තත්කාලීන අභියෝග*

**National Institute of Co-operative Development**
Polgolla – Sri Lanka
A member of the international Co-operative Alliance

Office: 081-2498679/80
Fax: 081-2499741